# සිංහල

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

## 4 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකාව**

**පිරිවෙන් අධ්‍යාපන ඒකකය**
**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය: pirivena@moe.gov.lk



මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# සිංහල

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

4 ශ්‍රේණිය

ISBN 978-955-25-0496-9

ප්‍රථම මුද්‍රණය : 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.pirivena.sch.lk

විද්‍යුත් ලිපිනය: pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් ලිපිනය: info@nie.lk

මුද්‍රණය: එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.



## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

පිරිවෙන් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත් වෙමි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑතකාලීනව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑතකාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සියලු විෂයයන් ආවරණය කරමින් සකස් කර ඇති මෙම මාර්ගෝපදේශ පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවාලීම වෙනුවෙන් සැබෑ මෙහෙවරක් වනු ඇති බව මගේ විශ්වාසයයි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා, නිලධාරින් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ නිලධාරින් ඇතුළු කාර්ය මණ්ඩලයට ද කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උරදිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහිකිරීමේ වගකීමෙන් මිදීමට අපට නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්ප හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේද අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජන කර ගැනීමටත් විෂය මාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගනිමින් වඩාත් උචිත ක්‍රමශිල්ප යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපනික අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.



## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තූතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහයයි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තූතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

# පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලයෙහි තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේ සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මඟින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂිකව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක වන විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල.



# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුවයි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනයයි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ සෘජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන් එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට සෘජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුද්ද, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ පන්සියයක් දෙනා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කරගත් ඥානයත් සම්භාව්‍ය හා නූතන භාෂාවනුත් ශිල්ප කලා ඥානයත් ජ්‍යොතිර්විද්‍යා, වාස්තුවිද්‍යා ඥානයත් ආදි ඥාන සම්භාරයත් කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදනය කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රම ශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි. ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම, මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරුමාර්ගෝපදේශ සම්පාදනය කර දීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳව අනතිමානී ආනන්දයක් ලබමි. පන්ති කාමරය තුළ වඩාත් ඵලදායි ගුරුවරයකු වීමට ගුරුමාර්ගෝපදේශයේ එන උපදෙස් ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහගු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහාය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත් උපදේශකත්වය සම්බන්ධීකරණය විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත්දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය.



## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය** : ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම** : ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

විජිත වෙලගෙදර
අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**අධීක්ෂණය** :ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** :පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය** :පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය මාතලේ සුමනවංස හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ උපදේශනය :** මහාචාර්ය රත්න විජේතුංග
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල

**ලේඛක මණ්ඩලය :** පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය මාතලේ සුමනවංස හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I (විශ්‍රාමික)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩබ්ලිව්. කරුණාරත්න
ගුරු මධ්‍යස්ථාන කළමනාකරු
ගුරු මධ්‍යස්ථානය, ගිරාගම

වයි. පී. ලක්මිණි
විදුහල්පති, බප/පිළි/ශ්‍රී රාහුල මහා විද්‍යාලය
රත්මලාන

ටී. එස්. සී. ජයවර්ධන
ගුරු උපදේශක (කළුතර දිස්ත්‍රික්කය)

**භාෂා සංස්කරණය :** එච්. එල්. එස්. අභයසිංහ, කථිකාචාර්ය (විශ්‍රාමික)
සීතාවක පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලය

**සෝදුපත් කියවීම :** පූජ්‍ය මාතලේ සුමනවංස හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් :** ඩබ්ලිව්. ඉසුරි මධුෂානි පෙරේරා, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
එච්. ඒ. එම්. ඩී හෙට්ටිආරච්චි, බප/ගම්/පරකන්දෙණිය මායාදුන්න ප්‍රා.වි

**පිටකවර නිර්මාණය :** ජේ. එම්. තරිඳු හසංග, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**විවිධ සහාය :** අතිපූජ්‍ය ලෙව්වන්දූවේ චන්දවිමල නාහිමි, විහාරාධිපති
මැදගොඩලන්ද පුරාණ විහාරය, අතුරුගිරිය

පූජ්‍ය මාදොවිට වජිරබුද්ධි හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
කොළඹ දිස්ත්‍රික්කය

පූජ්‍ය හල්වල ආනන්ද හිමි, විහාරාධිකාරි, පූරාණ විහාරය
මැදගොඩලන්ද, අතුරුගිරිය



## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මූලික පිරිවෙන් විෂයමාලාවේ සිංහල විෂයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව ඉටුකර ගැනීමට මග පෙන්වීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සකස් කර තිබූ සිංහල විෂය නිර්දේශය හා පෙළපොත මේ සඳහා පදනමක් ලෙස යොදා ගැනිණි. විෂය නිර්දේශයේ ඇතුළත් වූ නිපුණතා හා නිපුණතා මට්ටම් දැඩි වෙනසකට ලක් නොකොට ගුරු මාර්ගෝපදේශය සඳහා ක්‍රියාකාරකම් සකස් කෙරිණි. නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් පල අලුතින් සකස් කිරීමට සිදු විය. මෙහි දැක්වෙන ක්‍රියාකාරකම්වලින් මූලික පිරිවෙන් පන්තිවලට ඉගැන්වීම සඳහා පාඩම් සැලසුම් සකස් කර ගැනීමට උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව සිංහල විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී ව සිදු කර ගැනීම සඳහා එම උපදෙස් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මීට පෙර පිරිවෙන් විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ නොතිබූ අතර පිරිවෙන් ගුරුවරු තම අභිමතය පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කළහ. එසේ වූ විට එක් එක් පිරිවෙන්වල විෂය ඉගැන්වීම එකිනෙකින් වෙනස් වීමත් සමාන ඉගෙනුම් අවස්ථා ශිෂ්‍යයන්ට නොලැබීයාමත් අනිවාර්යයෙන් ම සිදු වේ. එය විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට මෙන් ම විධිමත් ඇගයීම් ක්‍රියාවලියට ද බාධාකාරී තත්ත්වයකි. එනිසා පිරිවෙන් විෂයමාලාවට ගුරු මාර්ගෝපදේශ සකස් කර දීමෙන් මෙකී තත්ත්වය අවම කිරීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පිරිවෙන්වල මෙතෙක් පැවති සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද වෙනස් කිරීමට මෙමගින් උපදෙස් දෙනු නො ලැබේ. පැරණි දේ සුරකිමින් නව ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා සම්පාදනය කිරීම බලාපොරොත්තු වේ. ඒ සඳහා නව තාක්ෂණය යොදා ගැනීම හා කණ්ඩායම් ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම ආදි උපදෙස් මෙමගින් ලබා දී ඇත.

විධිමත් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ගැනීමට එක් එක් නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සන්තතියක් මෙහි ඇතුළත් වේ. එක් නිපුණතාවක් ඉටුකර ගැනිම සඳහා නිපුණතා මට්ටම් දෙකක් හෝ කිහිපයක් විෂය නිර්දේශයෙහි දක්වා ඇත. එක් නිපුණතා මට්ටමක් සඳහා අවම වශයෙන් එක් ක්‍රියාකාරකමක් හෝ මෙහි ඇතුළත් කර ඇත. එම ක්‍රියාකාරකම සකස් කර ඇත්තේ එහි සඳහන් ඉගෙනුම් පල ඉටු කර ගැනීමට හැකි වන පරිදි ය. ඔබ පාඩම් සැලසුම් සකස් කිරීමේ දී එම ඉගෙනුම් පලවලින් සුවිශේෂ ඉගෙනුම් පල කාලච්ඡේදයට හා ශිෂ්‍ය පිරිසට ගැළපෙන පරිදි සකස් කර ගත යුතු ය. ඔබ විසින් සකස් කර ගත් ඉගෙනුම් පල ඉටුවන පරිදි පියවර කිහිපයකින් යුත් පාඩම් සැලසුමක් මේ අනුව සකස් කර ගත යුතු ය. ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඔබ සතු නිර්මාණශීලිත්වයට එමගින් ඉඩ සලසා ඇත.

ඉගෙනුම් පල මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම අවධාරණය කෙරේ. ඒ සඳහා නිර්ණායක ද මෙහි දක්වා ඇත. ඔබ සකස් කරන ඉගෙනුම් පල මැනීම සඳහා ද ගැළපෙන නිර්ණායක සකස් කරගත යුතු වේ. සෑම ඉගෙනුම් අවස්ථාවක් ම **ඉගෙනුම් පල, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා ඉගෙනුම් පල ඇගයීමේ නිර්ණායක** යන සංරචක තුනකින් සමන්විත වේ. ඔබේ පාඩම් සැලසුම් ද එම සංරචක තුනෙන් යුක්ත වීම අනිවාර්ය වන අතර එම සංරචක තුනේ අන්‍යෝන්‍ය සම්බන්ධය තිබීම ද අත්‍යවශ්‍ය වේ. විෂය කරුණු කියා දීම පමණක් ප්‍රමාණවත් නැත. ඉගෙනුම මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් තිබීම ද ඒ සඳහා නිර්ණායක තිබීම ද අත්‍යවශ්‍ය වේ.

ඉගෙනුම් පල, ක්‍රියාකාරකම් හා තක්සේරුකරණ නිර්ණායක යන සංරචක තුනට අනුව ඔබේ නිර්මාණශීලි ඉගැන්වීම් රටාව සංවිධානය කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට අත්වැලක් වනු ඇත. එය මැනවින් භාවිත කර ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යන්න අපගේ ප්‍රාර්ථනය යි.

**පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
2019.03.28

# පටුන


- ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය III
- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය IV
- අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය V
- පෙරවදන VI
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය VII
- පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය VIII
- ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය IX - X
- ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් XI
- සිංහල 4 ශ්‍රේණිය - වාර නියමය XIII - XV
- ජාතික අරමුණු XIX
- මූලික නිපුණතා XVII-XVIII
- විෂය අධ්‍යයනයේ අරමුණු XIX
- විෂය නිර්දේශය - 4 වන ශ්‍රේණිය XX-XXXIV
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් XXXV

1. අක්ෂර මාලාව (ලිඛිත අක්ෂර ව්‍යවහාරය) 01 - 05
2. අක්ෂර මාලාව (අක්ෂර වින්‍යාසය) 06 - 08
3. නාම පද 09 - 11
4. සන්ධි 12 - 14
5. සමාස 15 - 16
6. තද්ධිත 17 - 19
7. කෘදන්ත 20 - 22
8. ආඛ්‍යාත පද 23 - 24
9. නෛපාතික කෘදන්ත 25 - 26
10. වාක්‍ය නිර්මාණය 27 - 30
11. වාක්‍ය රචනය 31 - 33
12. සාරාංශකරණය 34 - 36
13. විරාම ලක්ෂණ 37 - 39
14. පද බෙදීම 40 - 41
15. අර්ථාවබෝධය 42 - 44
16. ප්‍රාදේශීය භාෂා 45 - 47
17. ප්‍රායෝගික ලේඛන (ආකෘතික පත්‍ර සකස් කිරීම) 48 - 49
18. ප්‍රායෝගික ලේඛන (න්‍යාය පත්‍ර සකස් කිරීම) 50 - 51
19. සාහිත්‍ය රසාස්වාදය 52 - 56
20. සාහිත්‍ය විචාර මූලධර්ම 57 - 60
21. නිර්දිෂ්ට ග්‍රන්ථ (ගුත්තිල කාව්‍යය) 61 - 62
22. නිර්දිෂ්ට ග්‍රන්ථ (චරිත තුනක්) 63 - 65
23. නිර්දිෂ්ට ග්‍රන්ථ (සංඝරාජ සාධු චරියාව) 66 - 68
24. විෂය සමගාමී ක්‍රියාකාරකම් (පද්‍ය නිර්මාණය) 69 - 72
25. විෂය සමගාමී ක්‍රියාකාරකම් (විද්‍යුත් මාධ්‍යවලට සවන් දීම) 73 - 74
26. විෂය සමගාමී ක්‍රියාකාරකම් (විද්‍යුත් නොවන මාධ්‍යවලට සවන් දීම) 75 - 76
27. විෂය සමගාමී ක්‍රියාකාරකම් (විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දීම) 77 - 78
28. විෂය සමගාමී ක්‍රියාකාරකම් (කථන අවස්ථා සම්පාදනය) 79 - 80
29. විෂය සමගාමී ක්‍රියාකාරකම් (නිවේදන හා විස්තර ප්‍රචාරය කිරීම) 81 - 82
30. විෂය සමගාමී ක්‍රියාකාරකම් (දේශාභිමානී ගී රසවින්දනය) 83 - 85




# සිංහල 4 ශ්‍රේණිය
## වාර නියමය

| වාරය | පෙළපොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය පෙළපොත සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා මාර්ගෝපදේශය | | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| | | | | පෙළපොතේ පාඩම සහ නිර්දිෂ්ට ග්‍රන්ථවල අදාළ කොටස් | පෙළපොතේ පාඩම් නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා ක්‍රියාකාරකම් | |
| 01 | 01 | 01 | 1.1 | අක්ෂර මාලාව, ලිඛිත අක්ෂර ව්‍යවහාරය, පිලි භාවිතය, | 1.1.1, 1.1.2, 1.1.3, 1.1.4, 1.2.1, 1.2.2, 1.3.1 | 05 |
| | | 02 | 1.2 | අක්ෂර වින්‍යාසය, ශ ෂ ස සම්බන්ධ රීති, ඓ ඖ සම්බන්ධ රීති | 1.4.1, 1.4.2 | 02 |
| | 02 | 03 | 2.1 | නාමපද හැඳින්වීම, ප්‍රාණවාචී පුරුෂ ලිංග ස්වරාන්ත නාම, ස්ත්‍රී ලිංග ස්වරාන්ත ශබ්ද, නපුංසක ලිංග ස්වරාන්ත නාම, නාම විභක්ති ප්‍රත්‍යය, | 2.1, 2.2, 2.3 | 03 |
| | 03 | 04 | 2.2 | සන්ධි හැඳින්වීම, සන්ධි ප්‍රයෝජන, සන්ධි විධි, සන්ධි ප්‍රභේද | 3.1, 3.2, 3.3 | 05 |
| | 04 | 05 | 2.3 | සමාස හැඳින්වීම, සමාස ප්‍රභේද, | 4.1, 4.2, 4.3, | 04 |
| | 05 | 06 | 2.4 | තද්ධිත හැඳින්වීම, විවිධ අරුත් දෙන තද්ධිත ප්‍රත්‍යයෝ | 5.1, 5.2, 5.3 | 02 |
| | | 07 | 2.5 | කෘදන්ත හැඳින්වීම, විවිධ අරුත් දෙන කෘදන්ත ප්‍රත්‍යයෝ | 5.4, 5.5, 5.6, | 04 |
| | ගුත්තිල කාව්‍යය | 21 | 7.1 | 290 - 325 තෙක් කවි | විවිධ විරිත් අනුව ගායනය | 04 |
| | චරිත තුනක් | 22 | 9.1 | 1 පරිච්ඡේදයේ අවසානය (50 පිටුව දක්වා) | නිශ්ශබ්දව කියවීම හා විචාරය | 04 |
| | සංඝරාජ සාධු චරියාව | 23 | 6.1 | සංඝරාජ සාධු චරියාව 1 - 22 තෙක් ග්‍රන්ථාරම්භයේ සිට සියම් උපාලි මහා ස්ථවිර බ්‍රහ්මජෝති හිමි | විවිධ ශෛලීන්ට අනුව කියවීම ගද්‍ය පාඨ කියවා අවබෝධ කර ගැනීම | 03 |
| | විෂය සමගාමී | 24 | 9.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | පද්‍ය නිර්මාණය | 02 |
| | විෂය සමගාමී | 25 | 10.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විද්‍යුත් මාධ්‍යවලට සවන්දීම | 02 |
| | විෂය සමගාමී | 26 | 10.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විද්‍යුත් මාධ්‍ය නොවන දේශන සාකච්ඡාවලට සවන්දීම | 02 |
| | විෂය සමගාමී | 28 | 11.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | කථන අවස්ථා සම්පාදනය | 03 |
| | විෂය සමගාමී | 27 | 10.3 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන්දීම | 02 |
| | විෂය සමගාමී | 29 | 11.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විස්තර ප්‍රචාරක අවස්ථා සම්පාදනය | 03 |
| | විෂය සමගාමී | 30 | 13.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | දේශාභිමානී ගී රසවින්දනය | 03 |
| | සෙසු කාලච්ඡේද වාර පරීක්ෂණ සඳහා | | | | | |

## සිංහල 4 ශ්‍රේණිය
## වාර නියමය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 02 | 06 | 08 | 2.6 | ක්‍රියාපද හැඳින්වීම, ධාතු ප්‍රකෘති, ආඛ්‍යාත, විභක්ති ප්‍රත්‍යය, කාල භේදය, පුරුෂ භේදය, කාරක භේදය, වචන භේදය, ආඛ්‍යාත ප්‍රභේද | 6.1, 6.2, 6.3, 6.4, 6.5, 6.6, 6.7 | 05 |
| | 07 | 09 | 2.7 | හැඳින්වීම, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, | 7.1, 7.2, 7.3, 7.4, 7.5, 7.6, | 05 |
| | 08 | 10 | 2.8 | හැඳින්වීම, උක්තය හා ආඛ්‍යාතය, උක්තාඛ්‍යාත යෝගයේ සාමාන්‍ය රීති, උක්තාඛ්‍යාත යෝගයේ විශේෂ රීති | 8.1, 8.2, 8.3, 8.4, 8.5, | 06 |
| | 11 | 13 | 4.3 | හැඳින්වීම, විරාම ලකුණු වර්ග, විරාම ලකුණු මගින් ඉටුවන මෙහෙය, | 11.1, 11.2, 11.3, 11.4, | 03 |
| | 12 | 14 | 4.3 | හැඳින්වීම, පද බෙදීමේ රීති | 12.1, 12.2, 12.3, | 03 |
| | 09 | 11 | 4.1 | හැඳින්වීම, රචනාවක අංග, | 9.1, | 05 |
| | 10 | 12 | 4.2 | හැඳින්වීම, අවධානය යොමු විය යුතු ලක්ෂණ, සාරාංශය ලියන අයුරු, සාරාංශය දැන සිටීමේ ප්‍රයෝජන | 10.1, 10.2, 10.3, 10.4, 10.5, 10.6 | 04 |
| | ගුත්තිල කාව්‍යය | 21 | 7.1 | 326 - 365 තෙක් කවි | විවිධ විරිත් අනුව ගායනය අර්ථාවබෝධය | 04 |
| | චරිත තුනක් | 22 | 9.1 | II පරිච්ඡේදයේ ආරම්භයේ සිට III පරිච්ඡේදය අවසානයට (51 පිටුව සිට 96 පිටුව දක්වා) | නිශ්ශබ්දව කියවීම හා විචාරය | 04 |
| | සංඝරාජ සාධු චරියාව | 23 | 6.1 | සංඝ රාජ සාධු චරියාව 23 - 44 තෙක් සියම් භික්ෂුව මල්වත්තට වැඩමවීම සිට කඹුරුගොඩ කරදිය පොළ තිබ්බටුවාවේ උන්නාන්සේ | විවිධ ශෛලීන්ට අනුව කියවීම | 04 |
| | විෂය සමගාමී | 24 | 9.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | පද්‍ය නිර්මාණය | 02 |
| | විෂය සමගාමී | 26 | 10.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විද්‍යුත් මාධ්‍ය නොවන දේශන සාකච්ඡාවලට සවන්දීම | 02 |
| | විෂය සමගාමී | 28 | 11.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | කථන අවස්ථා සම්පාදනය | 03 |
| | විෂය සමගාමී | 29 | 11.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විස්තර ප්‍රචාරක අවස්ථා සම්පාදනය | 03 |
| සෙසු කාලච්ඡේද වාර පරීක්ෂණ සඳහා | | | | | | |



## සිංහල 4 ශ්‍රේණිය
## වාර නියමය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03 | 13 | 15 | 6.1 | හැඳින්වීම, අර්ථාවබෝධ ක්‍රමශිල්ප | 13.1, 13.2, | 05 |
| | 14 | 16 | 3.1 | භාෂා ව්‍යවහාරයේ වෙනස්කම්, ප්‍රදේශීය ව්‍යවහාර හා සම්මත ව්‍යවහාර | 14.1, 14.2, 14.3, 14.4, 14.5 | 05 |
| | 15 | 17 | 5.1 | ආකෘති පත්‍ර, | 15.1, | 02 |
| | | 18 | 5.1 | න්‍යාය පත්‍ර, | 15.2, | 05 |
| | 16 | 19 | 8.1<br>8.2 | ශබ්ද රසය හා අර්ථ රසය හඳුනා ගැනීම, නව නළු රසය, කවි රසවිඳීම | 16.1, | 05 |
| | 17 | 20 | 12.1<br>12.2 | කාව්‍ය හැඳින්වීම, පෙර දිග අපරදිග විචාර අදහස්, කාව්‍ය භාෂාව, සංකල්පරූප, පරිකල්පනය, ශබ්ද ධ්වනිය, හැඟීම් දැනවීම, චින්තනය, ආකෘතිය, | 17.1, 17.2, 17.3, | 04 |
| | ගුත්තිල කාව්‍යය | 21 | 7.1 | 366 - 400 තෙක් කවි | විවිධ විරිත් අනුව ගායනය අර්ථාවබෝධය | 04 |
| | චරිත තුනක් | 22 | 9.1 | 2 පරිච්ඡේදයේ සිට කතාව අවසානයට (97 පිටුව සිට 164 පිටුව දක්වා) | නිශ්ශබ්දව කියවීම හා විචාරය | 04 |
| | සංඝරාජ සාධු චරියාව | 23 | 6.1 | සංඝරාජ සාධු චරියාව 45 - 67 තෙක් දොළොස් පත්තුවේ දිසාවේ නායක ස්වාමි උන්නාන්සේ සිට සඟරාජ හිමි භෂ්මාවශේෂ | විවිධ ශෛලීන්ට අනුව කියවීම | 04 |
| | විෂය සමගාමී | 24 | 9.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | පද්‍ය නිර්මාණය | 02 |
| | විෂය සමගාමී | 26 | 10.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විද්‍යුත් මාධ්‍ය නොවන දේශන, සාකච්ඡාවලට සවන්දීම | 02 |
| | විෂය සමගාමී | 28 | 11.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | කථන අවස්ථා සම්පාදනය | 03 |
| | විෂය සමගාමී | 29 | 11.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විස්තර ප්‍රචාරක අවස්ථා සම්පාදනය | 03 |
| | විෂය සමගාමී | 30 | 13.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | දේශාභිමානී ගී රසවින්දනය | 03 |
| | සෙසු කාලච්ඡේද වාර පරීක්ෂණ සඳහා | | | | | |

## ජාතික අරමුණු

සාමාන්‍ය අධ්‍යාපනය අත්‍යවශ්‍යයෙන්ම පහත දී ඇති ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීමට යොමු විය යුතුයි.

i. ජාතික ඒකාබද්ධතාව, ජාතික ඒකාග්‍රතාව සහ ජාතික සමගිය මුදුන්පත් කර ගැනීම.

ii. සමාජ සාධාරණත්වයේ පැතිරෙන රටාව තහවුරු කිරීම.

iii. තිරසාර ජීවන රටාවක පරිණාමය - මානව වර්ගයාගේ ඉතිහාසයේ ප්‍රථම වතාවට වාතය සහ ජලය පවා එසේම යැයි පිළිගත නොහැකි විටක වසර 2000 සහ ඉන් ඔබ්බට අවශ්‍ය වන තිරසාර ජීවන ශෛලියක්.

iv. රැකියා අවස්ථා උත්පාදනය - ඒ සමගම ඒවා අභිමානවත්, අපේක්ෂා සපරාලන, ස්වාර්ථ සාධන වීම.

v. ඉහත සැකිල්ල තුළ ජාතිය උදෙසා සිදු කෙරෙන වර්ධනය පිළිබඳ සමුච්චිත ව්‍යුහය වෙත යොමුවන මානව සම්පත් සංවර්ධනයේ දී සැමට ම සහභාගී වීම සඳහා විවිධ හැකියාවන් ස්ථාපිත කිරීම.

vi. එකිනෙකා වෙනුවෙන් දැඩි සහ නොවෙනස් සැලලකිල්ල පිළිබඳ අඛණ්ඩ හැඟීමක් ඇතිකර ආරක්ෂා කිරීම ජාතිය ගොඩනැගීමේ කටයුතුවල සක්‍රිය සහභාගීත්ව තහවුරු කළ යුතු වේ.

vii. මෙකල අප ජීවත් වන වේගයෙන් වෙනස්වන ආකාරයේ ලෝකයක් තුළ වෙනස් වීමට අනුවර්තන හැකියාව ඇති මූලික දේවල් වැඩිදියුණු කර සකස්කර ගැනීම අත්‍යවශ්‍යවේ. වෙනස්වන අවස්ථාවන්ට අනුවර්තනය වීමට ඉගෙනීම - මෙය තමාගේ සහ අන් අයගේ අභිවෘද්ධිය සඳහා වෙනස් වීම මෙහෙය වීමට නිපුණතා සමග සම්බන්ධ කළ යුතු ය.

viii. ආරක්ෂාව සහ ස්ථාවරත්වය පිළිබඳ හැඟීමක් ඇති කර ගනිමින් සංකීර්ණ සහ අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමට ඇති හැකියාව වැඩිදියුණු කර ගැනීම.

ix. ජාත්‍යන්තර ප්‍රජාව තුළ ගෞරවනීය ස්ථානයක් අත්පත්කර ගැනීමට සම්බන්ධවන්නා වූ නිපුණතාවන් වර්ධනය කර ගැනීම.

**(ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා යෝජනා - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2016)**



## නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුමවාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම: භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා :

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය

iii. පරිසරයට අදාළ නිපුණතා :

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවශකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව.

iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා :

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා :

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා :

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මළල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

vii. ''ඉගෙනීමට ඉගෙනුම්'' පිළිබඳ නිපුණතා :

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.



## විෂය අධ්‍යයනයේ අරමුණු

01. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම.

02. සිංහල භාෂාවේ ව්‍යාකරණය සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

03. භාෂාවේ වාච්‍යාර්ථ, ලක්ෂ්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ වටහා ගැනීම.

04. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථග්‍රහණ ශක්තිය වර්ධනය කරලීම.

05. අවබෝධය, විශ්ලේෂණය, සංස්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.

06. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලීය හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම හා වාංමාලාව පෝෂණය කර ගැනීම.

07. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

08. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීම තුළින් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම.

09. විශ්වවිශ්‍රුත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු කිරීම.

11 සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

12. සන්නිවේදන කාර්යය පහසුකරලීම සඳහා සාම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරීම.

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය
## 4 ශ්‍රේණිය - සිංහල

| නිපුණතාව | නිපුණතා මටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 1.1 අක්ෂර ව්‍යවහාරය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි. | අක්‍ෂර මාලාව, ලිඛිත අක්‍ෂර ව්‍යවහාරය, ස්වර, ව්‍යඤ්ජන, සංයුක්තාක්ෂර<br>පිලි භාවිතය | • සිංහල අක්ෂර මාලාවේ මෑත කාලීන වර්ධනය පැහැදිලි කරයි.<br>• නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි.<br>• ස්වර අක්ෂර හා ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව හඳුනා ගෙන ලේඛන ගත කරයි.<br>• ව්‍යඤ්ජන අක්ෂරයෙන් ස්වර අක්ෂරය වෙන් කොට දක්වයි.<br>• නූතන සිංහල අක්ෂර මාලාව වර්ගීකරණය කර දක්වයි.<br>• නූතන සිංහල අක්ෂර මාලාව මතකයෙන් කියයි.<br>• සංයුක්තාක්ෂර හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.<br>• ස්වරාරූඪ ව්‍යඤ්ජන අක්ෂරයෙන් පිල්ල වෙන් කර දක්වයි. | 05 |



# මූලික පිරිවෙන් විෂය නිර්දේශය
## 4 ශ්‍රේණිය - සිංහල

| | | | | |
|---|---|---|---|---|
| | 1.2 ඓ, ඖ, භේදය හා ශ, ෂ, ස අක්ෂර නිවැරදි ව භාවිත කරයි. | අක්‍ෂර වින්‍යාසය, ශ, ෂ ස සම්බන්ධ රීති, ඓ ඖ සම්බන්ධ රීති | • ලේඛනයේ දී නිවැරදි ව අක්ෂර වින්‍යාසය භාවිත කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි.<br>• භාෂාව නිවැරදි ව භාවිත කිරීමට අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධය අවශ්‍ය බව පෙන්වා දෙයි.<br>• අක්ෂර වින්‍යාසය සම්මත ආකාරයට යොදා ගනිමින් ලේඛන සකස් කරයි.<br>• ලේඛන කාර්යන්හි දී ඓ, ඖ, ශ, ෂ, ස අක්ෂර නිවැරදි ව යොදයි. | 2 |
| 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි. | 2.1 නාම පද සාධනය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදේ. | නාම පද හැඳින්වීම, ප්‍රාණවාචී පුරුෂ ලිංග ස්වරාන්ත නාම, ස්ත්‍රී ලිංග ස්වරාන්ත ශබ්ද, නපුංසක ලිංග ස්වරාන්ත නාම, නාම විභක්ති ප්‍රත්‍යය, | • නාම පදයක් යනු කුමක් දැ යි හඳුනා ගෙන විස්තර කරයි.<br>• ශබ්ද ප්‍රකෘතිය හා විභක්ති ප්‍රත්‍යය වෙන් කර දක්වයි.<br>• ශබ්ද ප්‍රකෘතිය හා විභක්ති ප්‍රත්‍යය සමවායෙන් නිපදවෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නාම පද ප්‍රභේද හඳුනා ගෙන විස්තර කරයි.<br>• එක් නාම පදයක් සියලු විභක්තිවල ඒක වචන හා බහු වචන ලෙස වරනගයි. | 3 |

| | | | | |
|---|---|---|---|---|
| | 2.2 සන්ධි සංකල්පය ලේඛන කාර්යයන් සඳහා යොදා ගනියි. | සන්ධි හැඳින්වීම, සන්ධි ප්‍රයෝජන, සන්ධි විධි, සන්ධි ප්‍රභේද | • සන්ධි යනු කුමක් දැ යි නිවැරදි ව නිර්වචනය කරයි.<br>• සන්ධි මගින් භාෂාවට ලැබෙන ප්‍රයෝජන<br>• නිවැරදි ව පවසයි.<br>• සන්ධි කාර්ය දහය නිවැරදි ව හඳුනා ගෙන එක් එක් සන්ධි වර්ගය ලියා දක්වයි.<br>• සන්ධි පද නිවැරදි ව විසන්ධි කිරීම හා විසන්ධි පද නිවැරදි ව සන්ධි කර පෙන්වයි.<br>• සන්ධි අර්ථාන්විත ව භාවිත කරමින් භාෂා කාර්යයේ යෙදෙයි. | 5 |
| | 2.3 සමාස යන සංකල්පය ලේඛන කාර්යයන් සඳහා යොදා ගනියි. | සමාස හැඳින්වීම, සමාස ප්‍රභේද | • සමාස පද යනු කුමක් දැ යි නිර්වචනය කරයි.<br>• සමාස පදයක දක්නට ලැබෙන ලක්ෂණ නිවැරදි ව නම් කරයි.<br>• සමාස ප්‍රභේද නම් කරයි.<br>• එක් එක් සමාසය නිදසුන් සහිත ව නිර්වචනය කරයි.<br>• සමාස සංකල්පය හඳුනා ගෙන ලේඛන කාර්යයේ දී නිවැරදි ව භාවිත කරයි. | 4 |





| | | | | |
|---|---|---|---|---|
| | 2.4 තද්ධිත යන ව්‍යාකරණ සංකල්පය පද සාධනයට යොදා ගනියි. | තද්ධිත හැඳින්වීම, විවිධ අරුත් දෙන තද්ධිත ප්‍රත්‍යයෝ, | • තද්ධිත නාම යනු නාම ප්‍රකෘතියකට ප්‍රත්‍යය එකතුවීමක් බව ප්‍රකාශ කරයි.<br>• නාම ප්‍රකෘතියේ අර්ථය නොව ප්‍රත්‍යයේ අර්ථය බලවත් බව ප්‍රකාශ කරයි.<br>• ප්‍රත්‍යයාර්ථ නාමප්‍රභේද වශයෙන් වර්ග කර විස්තර කරයි.<br>• විවිධ අරුත් දෙන තද්ධිත ප්‍රත්‍යය උදාහරණ ඇසුරෙන් විස්තර කරයි.<br>•<br>• තද්ධිත ප්‍රත්‍යය යෙදීම මගින් තද්ධිත පද අර්ථ ගෙන දෙන බව හඳුනා ගෙන පවසයි.<br>• භාෂා කාර්යයෙ දී තද්ධිත පද නිවැරදි ව භාවිත කරයි. | 2 |
| | 2.5 කෘදන්ත යන ව්‍යාකරණ අංගය පද සාධනයට යොදා ගනියි. | කෘදන්ත හැඳින්වීම, විවිධ අරුත් දෙන කෘදන්ත ප්‍රත්‍යයෝ, | • ප්‍රත්‍යයාර්ථ නාම මොනවා දැ යි ප්‍රභේද වශයෙන් විස්තර කරයි.<br>• කෘදන්ත පද ප්‍රභේද හතරක් නිවැරදි ව නම් කරයි.<br>• කෘදන්ත නාම සෑදෙන ආකාරය නිදසුන් මගින් විස්තර කරයි.<br>• කෘදන්ත නාම අනෙක් නාම අතරින් වෙන් කර පෙන්වයි.<br>• භාෂා කාර්යයේ දී කෘදන්ත පද නිවැරදි ව භාවිත කරයි. | 4 |

| | | | | |
|---|---|---|---|---|
| | 2.6 ක්‍රියා පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදේ. | ක්‍රියා පද හැඳින්වීම, ධාතු ප්‍රකෘති, ආඛ්‍යාත, විභක්ති ප්‍රත්‍ය, කාල භේදය, පුරුෂ භේදය, කාරක භේදය, වචන භේදය, ආඛ්‍යාත ප්‍රභේද | • ධාතුවක් හෙවත් ක්‍රියා මූලයක් යනු කුමක් දැ යි හඳුනා ගෙන විස්තර කරයි.<br>• ක්‍රියා පදයකින් ධාතුව වෙන් කර ලියයි.<br>• ආඛ්‍යාතයක දක්නට ලැබෙන විවිධ ප්‍රභේද විස්තර කරයි.<br>• ආඛ්‍යාත පදය ප්‍රධාන ප්‍රභේදවලට වෙන්කර ඉදිරිපත් කරයි.<br>• ලේඛන කාර්යයේ දී ආඛ්‍යාතය නිවැරදි ව භාවිත කරයි. | 05 |
| | 2.7 නෛපාතික කෘදන්ත හඳුනා ගෙන ලේඛන කාර්යයේ යෙදේ. | හැඳින්වීම, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, | • නෛපාතික කෘදන්ත යනු කුමක් දැ යි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නෛපාතික කෘදන්ත ප්‍රභේද 3ක් ඇති බව පවසයි.<br>• පූර්ව ක්‍රියාව නිවැරදි ව වෙන් කොට දක්වයි.<br>• මිශ්‍ර ක්‍රියාව නිවැරදි ව හඳුන්වයි.<br>• අසම්භාව්‍ය ක්‍රියා මොනවා දැ යි නිවැරදි ව වෙන් කර දක්වයි.<br>• නෛපාතික ක්‍රියා ලේඛන කාර්යයේ දී නිවැරදි ව භාවිත කරයි. | 05 |





| | | | | |
|---|---|---|---|---|
| | 2.8 සාමාන්‍ය හා විශේෂ රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි. | හැඳින්වීම, උක්තය හා ආඛ්‍යාතය, උක්තාඛ්‍යාත යෝගයේ සාමාන්‍ය රීති, උක්තාඛ්‍යාත යෝගයේ විශේෂ රීති | • සම්මත රීතිවලට අනුකූලව කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය අවස්ථෝචිතව නිවැරදි ව ලියා දක්වයි.<br>• වාක්‍ය නිර්මාණයේ සාමාන්‍ය රීති අනුගමනය කරමින් වාක්‍ය නිර්මාණය කරයි.<br>• වාක්‍ය නිර්මාණයේ විශේෂ රීති අවබෝධ කරගෙන නිවැරදි වාක්‍ය ලිවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය නිර්මාණය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 06 |
| 3.0 භාෂා ක්‍රියාකාරකම් මගින් වාග්මාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි. | 3.1 ප්‍රාදේශීය භාෂා විෂමතාවන් හඳුනා ගෙන භාෂා භාවිතයේ යෙදෙයි. | භාෂා ව්‍යවහාරයේ වෙනස්කම්, ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර වන ප්‍රදේශ, ප්‍රාදේශීය ව්‍යවහාර හා සම්මත ව්‍යවහාර | • විවිධ ප්‍රදේශ අනුව භාෂාවේ විෂමතා පවතින බව ප්‍රකාශ කරයි.<br>• ප්‍රාදේශීය ජන වහර හා පොදු ජන වහරෙහි වෙනස්කම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ප්‍රාදේශීය ජන වහර, භාෂාව ඉගෙනීමේ දී වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.<br>• තෝරා ගත් ප්‍රාදේශිය ජන වහර පද කිහිපයක් සඳහා සම්මත වහරේ යෙදෙන පද ලියා දක්වයි. | 05 |

| | | | | |
|---|---|---|---|---|
| 4.0 අදහස් නිරවුල්ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් නිරවුල් ව ඉදිරිපත් කරයි. | හැඳින්වීම, රචනාවක අංග, | • වාක්‍ය රචනා යනු කුමක් දැ යි නිවැරදි ව විස්තර කරයි.<br>• මාතෘකානුකූල රචනා ලිවීම සඳහා සාරවත් කරුණු රැස් කරයි.<br>• රචනාව ලිවීම සඳහා සැකිලි සකස් කරයි.<br>• වාක්‍ය රචනා ලිවීමේ දී අවශ්‍ය කරුණු, සංවිධානාත්මක ව හා නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් රචනාකරණයේ යෙදෙයි.<br>• සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි. | 05 |
| | 4.2 පාඨයක අන්තර්ගතය හකුළුවා ව්‍යක්ත ලෙස ඉදිරිපත් කරයි. | හැඳින්වීම, අවධානය යොමු විය යුතු ලක්ෂණ, සාරාංශය ලියන අයුරු, සාරාංශය දැන සිටීමේ ප්‍රයෝජන | • සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු විස්තර කරයි.<br>• මුල් ලේඛනයේ අන්තර්ගතයට හානියක් නොවන සේ සාරාංශකරණයෙහි නියුතු වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ගද්‍ය ඡේදයක වචන $^1/3$ක් වන සේ සාරාංශ කර දක්වයි.<br>• ලිපි ලේඛන සාරාංශකරණයේ අවශ්‍යතාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අවස්ථෝචිත ව ලිපි ලේඛන සාරාංශ කොට දක්වයි. | 04 |





| | | | | |
|---|---|---|---|---|
| | 4.3 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. | හැඳින්වීම, විරාම ලකුණු | • විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරයි.<br>• භාෂාව නිවැරදි ව භාවිත කිරීමට විරාම ලකුණු පිළිබඳ අවබෝධය අවශ්‍ය බව පෙන්වා දෙයි.<br>• භාෂාව භාවිතයේ දී විරාම ලකුණු යෙදීමේ වැදගත්කම අවධාරණය කරයි.<br>•<br>• ලේඛන කාර්යයේ දී විරාම ලකුණු මගින් ඉටුවන මෙහෙය පැහැදිලි කරයි.<br>• විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 03 |
| | 4.4 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. | හැඳින්වීම, පද බෙදීමේ රීති ශබ්ද ප්‍රකෘතිය හා ධාතු ප්‍රකෘතිය | • පද බෙදීමේ දී අනුගමනය කෙරෙන රීති හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ලේඛනයේ දී නාම පද, ක්‍රියා පද ,නිපාත පද වෙන් කොට ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• සන්ධි, සමාස, උපසර්ග පද වෙන් නො කොට ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• විභක්ති ප්‍රත්‍යය මුල් පදය හා එකතු කොට ලිවිය යුතු බව ප්‍රකාශ කරයි. | 03 |

| | | | | |
|---|---|---|---|---|
| 5.0. ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 5.1. දෛනික කාර්යයන්හිදී ප්‍රායෝගික ලේඛනයේ යෙදේ. | හැඳින්වීම<br>ආකෘති පත්‍ර | • ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.<br>• ප්‍රායෝගික අවශ්‍යතා අනුව විවිධ ආකෘති පත්‍ර නිර්මාණය කරයි.<br>• අවස්ථෝචිත ව විවිධ ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කරයි.<br>• ප්‍රායෝගික ජීවිතයේ දී ඒ ඒ අවශ්‍යතාවලට අදාළ වන ආකෘති පත්‍රයක් සකස්කර එය නිවැරදි ව සම්පූර්ණ කරයි. | 02 |
| | 5.1. දෛනික කාර්යයන්හිදී ප්‍රායෝගික ලේඛනයේ යෙදේ. | හැඳින්වීම<br>න්‍යාය පත්‍ර | • න්‍යාය පත්‍රවල අන්තර්ගතය, ප්‍රමිතිය හා ක්‍රමවේද පිළිබඳ ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ප්‍රායෝගික අවශ්‍යතා අනුව විවිධ න්‍යාය පත්‍ර සකස් කරයි.<br>• විවිධ අවශ්‍යතා සඳහා න්‍යාය පත්‍ර සකස් කර, න්‍යාය පත්‍රානුකූල ව විවිධ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරයි.<br>• ප්‍රායෝගික ජීවිතයේ දී ඕනෑම අවශ්‍යතාවකට අදාළ වන න්‍යාය පත්‍රයක් සකස් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 05 |





| | | | | |
|---|---|---|---|---|
| 6.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 6.1 ගද්‍ය පාඨ කියවා අර්ථය වටහා ගත් බව ප්‍රකට කරයි. | හැඳින්වීම<br>සංඝරාජ සාධු චරියාව කෘතිය | • සංඝරාජ සාධු චරියාව කෘතිය කියවා කතා සාරය ගොඩනගයි.<br>• සංඝරාජ සාධු චරියාව කෘතියේ දුරවබෝධ වචන ලැයිස්තුවක් පිළියෙල කරයි.<br>• සංඝරාජ හිමියන්ගෙන් වූ ධර්ම ශාස්ත්‍රීය සේවය කරුණු සහිත ව විස්තර කරයි.<br>• සංඝරාජ සාධු චරියාව කෘතියෙන් නිදසුන් ඉදිරිපත් කරමින් මහනුවර යුගයේ භාෂා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරයි.<br>• සරණංකර සංඝරාජ චරියාව හිමියන්ගේ අධ්‍යයනය තුළින් බෞද්ධ සංස්කෘතික සාරධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සරණංකර සංඝරාජ හිමියන්ගේ චරියාව ඇසුරෙන් ජාතිකාභිමානී හා දේශමාමක සංකල්ප වර්ධනය කරගත් බව ප්‍රකට කරයි. | 04 |
| 7.0 ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය ඔස්සේ ආගමික හා සමාජීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම පිණිස වනපොත්කරණයේ යෙදෙයි. | නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් පද්‍ය කොටස් වනපොත් කරයි. | හැඳින්වීම<br>ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කවි | • ගුත්තිල කාව්‍යයේ සාහිත්‍යයික පසුබිමට අදාළ කරුණු නිවැරදි ව විස්තර කරයි.<br>• ගුත්තිල කාව්‍යයේ නිර්දේශිත කවි මතකයෙන් කියයි.<br>• ගුත්තිල කාව්‍යයේ නිර්දේශිත කවිවල අර්ථය නිවැරදි ව කියයි.<br>• ගුත්තිල කාව්‍යයේ නිර්දේශිත කවිවල දුරවබෝධ වචනවල අර්ථ ඇතුළත් කර ගැටපදයක් සකසයි.<br>• ගුත්තිල කාව්‍යය පිළිබඳ විවාදාපන්න මාතෘකාවලට අනුව විවාද පවත්වයි.<br>• ගුත්තිල කාව්‍යය ඇසුරින් සාහිත්‍යය රස භාව පිළිබඳ ඥාන පෝෂණය වන කතාබහේ නියැළෙයි. | 04 |

| | | | | |
|---|---|---|---|---|
| 8.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 8.-1 සාහිත්‍ය මූලධර්ම ඇසුරින් ගද්‍ය පද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි.<br><br>8.2 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසඥතාව වර්ධනය කර ගනියි. | හැඳින්වීම<br>ශබ්ද රසය හා අර්ථ රසය හඳුනා ගැනීම, නව නළු රසය, කවි රස විඳීම | • වාච්‍යාර්ථ සහ ව්‍යංග්‍යාර්ථ යන පාරිභාෂික පද නිර්වචනය කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ රස විඳීමේ දී ගද්‍ය හා පද්‍ය අතර වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• රසභාව පිළිබඳ මූලික න්‍යායන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• රසාඥතා වර්ධනය සඳහා රස පූර්ණ නිර්මාණ භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි.<br>• රසවත් නිර්මාණවල අන්තර්ගත කරුණු හඳුනා ගෙන රස විඳ ජීවිත පරිඥානය සඳහා භාවිත කරයි.<br>• ප්‍රශස්ත ගී, කාව්‍ය, නාට්‍ය, සංවාද ආදියට සවන් දීම රසඥතා වර්ධනයට හේතුවන බව ප්‍රකාශ කරයි. | 05 |
| 9.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | 9.1 නිර්දිෂ්ට නවකතාව පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | හැඳින්වීම<br>නිර්දිෂ්ට නවකතාව<br>චරිත තුනක් - කේ. ජයතිලක | • සිංහල නවකතා ඉතිහාසය සැකෙවින් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට නවකතා රචකයා හා ඔහුගේ නිර්මාණ නම් කරයි.<br>• නිර්දිෂ්ට නවකතාවේ තේමාව ඉදිරිපත් කරයි.<br>• නවකතාවේ කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නවකතාවේ චරිත පිළිබඳ විචාරය කරයි.<br>• සරල තේමා ඔස්සේ ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | 04 |





| | | | | |
|---|---|---|---|---|
| | 9.2 පද්‍ය නිර්මාණය කරයි. | හැඳින්වීම<br>විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>පද්‍ය නිර්මාණය | • පද්‍ය නිර්මාණය සඳහා සරල අත්දැකීමක් තෝරා ගෙන ඉදිරිපත් කරයි.<br>• පද්‍ය නිර්මාණයේ දී භාෂාව නිර්මාණාත්මක ව භාවිත කරයි.<br>• පද්‍ය නිර්මාණයේ දී යොදා ගත හැකි කාව්‍ය උපක්‍රම පැහැදිලි කරයි.<br>• පද්‍ය නිර්මාණයේ දී උචිත කාව්‍ය සම්ප්‍රදායක් තෝරා ගනියි.<br>• අත්දැකීම් පාදක කොට ගෙන සරල තේමාවන්ට අනුව පද්‍ය නිර්මාණය කරයි.<br>• නිර්මාණය කරන ලද සරල පද්‍ය ඉදිරිපත් කරයි. | 02 |
| 10.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ව ඵලදායී ලෙස යොදා ගනියි. | 10.1 විද්‍යුත් මාධ්‍යවලට සවන් දීමේ පුරුද්ද වර්ධනය කර ගනියි. | හැඳින්වීම<br>විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>විද්‍යුත් මාධ්‍යවලට සවන් දීම | • අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව වැඩසටහනකට සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දුන් තොරතුරු සටහන් කර ගනියි.<br>• විද්‍යුත් මාධ්‍ය වැඩසටහනක ස්වරූපය හා විවිධත්වය ප්‍රකාශ කරයි.<br>• විද්‍යුත් මාධ්‍යවලට සවන්දීමෙන් විවිධ විෂයයන් පිළිබඳ දැනුම ලබා ගනියි.<br>• එම ලබාගත් දැනුම ප්‍රායෝගික ජීවිතයට යොදා ගනියි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 10.2 විද්‍යුත් නොවන දේශන, සාකච්ඡා ආදියට සවන් දීමේ පුරුද්ද වර්ධනය කර ගනියි. | හැඳින්වීම<br>විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>විද්‍යුත් නොවන මාධ්‍යවලට සවන් දීම | • සංයමයෙන් අවධානයෙන් යුතුව සවන් දී වැදගත් කරුණු සටහන් කර ගනියි.<br>• සවන්දී අවස්ථාවට අනුව ප්‍රතිචාර දක්වයි.<br>• සාකච්ඡාවලට සවන් දී එහි වැදගත් කරුණු මතකයෙන් ඉදිරිපත් කරයි.<br>• දේශනයකට සවන් දී තම අදහස් ඉදිරිපත් කරයි.<br>• දේශන/සාකච්ඡා ආදියට සවන් දී වැදගත් කරුණු ප්‍රායෝගික ජීවිතයට යොදා ගනියි. | 02 |
| | 10.3 විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි. | හැඳින්වීම<br>විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දීම | • විද්‍යුත් මධ්‍යවල ප්‍රවෘත්ති ප්‍රකාශවලට හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් තොරතුරු සාකච්ඡා කරයි.<br>• සාවධානව සවන් දී වැදගත් තොරතුරු සටහන් කර ගනියි.<br>• ප්‍රවෘත්ති ප්‍රකාශවලට සවන් දී මෙත් කාලීන තොරතුරු දැන ගැනීමේ වැදගත් කම ප්‍රකාශ කරයි.<br>• ප්‍රවෘත්ති ප්‍රකාශවලට හා විස්තර ප්‍රකාශවලට සවන් දී ලබා ගත් තොරතුරු භාවිතයට යොදා ගනියි.<br>• පැහැදිලි අදහස් ප්‍රකාශ කරමින් සන්නිවේදනයේ යෙදෙයි. | 03 |





| | | | | |
|---|---|---|---|---|
| 11.0 අර්ථවත් කථනයෙන් ප්‍රකාශන ශක්තිය වර්ධනය කර ගනියි. | 11.1 කරුණු සංවිධානය කර ගනිමින් නිරවුල්ව හා නිවැරදි ව කතා කරයි. | හැඳින්වීම<br>විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>කථන අවස්ථා සම්පාදනය | • නිවැරදි ව බස හසුරුවමින් කතා කරයි.<br>• නිශ්චිත මාතෘකාවකට අනුව කතා කරයි.<br>• උචිත අංග චලනය සහිත ව නියමිත ශෛලියකට අනුව කතාවක් කරයි.<br>• විවිධ අවස්ථාවල දී අවශ්‍යතාව අනුව කතාවක් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 03 |
| | 11.2 ආකර්ෂණීය ලෙස හා නිවැරදි ලෙස නිවේදනය හා විස්තර ප්‍රචාරයේ යෙදේ. | හැඳින්වීම<br>විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>විස්තර ප්‍රචාරක අවස්ථා සම්පාදනය | • අවධානය යොමු වන පරිදි හඬ පාලනයෙන් යුක්තව නිවේදනයක් කරයි.<br>• නිවැරදි උච්චාරණය සහිත ව නිවේදනයක් කරයි.<br>• නිවේදනයක ඇතුළත් විය යුතු අංග නම් කරයි.<br>• විවිධ අවස්ථාවල දී අවශ්‍යතාව අනුව නිවැරදි ව නිවේදන කටයුතු කරයි. | 03 |
| 12.0 සාහිත්‍ය රසාස්වාදයට හා විචාරයට අදාළ මූලික ඉගැන්වීම් පිළිබඳ ව අවබෝධය ලබා භාවිත කරයි. | 12.1 මූලධර්මවලට අනුව ගද්‍ය පද්‍ය කොටස් පරිශීලනය කරමින් රස විඳියි.<br><br>12-2 මූලධර්මවලට අනුව ගද්‍ය පද්‍ය විග්‍රහ කරමින් විචාරයට ලක් කරයි. | හැඳින්වීම<br>කාව්‍ය හැඳින්වීම, පෙර දිග අපරදිග විචාර අදහස්, කාව්‍ය භාෂාව, සංකල්ප රූප, පරිකල්පනය, ශබ්ද ධ්වනිය, හැඟීම් දැනවීම, චින්තනය, ආකෘතිය, | • විචාර මූලධර්ම පිළිබඳ ව අවබෝධය ලබාගැනීම රසඥතාව වර්ධනය සඳහා උපකාර වන බව ප්‍රකාශ කරයි.<br>• රස සංකල්පය පිළිබඳ ව සරල ව අදහස් දක්වයි.<br>• නිර්දිෂ්ට පාඩමෙහි ඇතුළත් විචාර ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• විචාර මූලධර්මයන්ට අනුව ගද්‍ය පද්‍ය කොටස් රස විඳිමින් විචාරය කරයි. | 04 |

| | | | | |
|---|---|---|---|---|
| 13.0 භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතික හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි. | 13.1 දේශාභිමානි හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි. | විෂය සමගාමී ක්‍රියාකාරකම් දේශාභිමානී ගී රසවින්දනය | • දේශාභිමානි හැඟීම් දනවන විවිධ සාහිත්‍ය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්මාණවලින් ඉස්මතු කෙරෙන දේශාභිමානී හැඟීම් (සහකම්පනයෙන්/ සංවේදී ව) අගය කරයි.<br>• ජාතික සමගිය, සහජීවනය හා සාමය උදෙසා එකමුතු ව කටයුතු කිරීමේ හැඟීම් දනවන සාහිත්‍යය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• අදාළ නිර්මාණ පරිශීලනය තුළින් දේශාභිමානය, ජාතික සමගිය, සහජීවනය හා සාමය උදෙසා එකමුතු ව කටයුතු කිරීමේ පුරුදු ඇති කර ගනියි. | 03 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ**

- සිංහල 4 - මූලික පිරිවෙණ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ගුත්තිල කාව්‍ය - ගුත්තිල මූසිල වීණා වාදයේ සිට දෙව්ලොව වැනුම දක්වා (290-400)
- චරිත තුනක් - කේ.ජයතිලක
- සංඝරාජ සාධු චරියාව

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

- සාහිත්‍ය සමිතිය, බිත්ති පුවත්පත් නිර්මාණය, සඟරා නිර්මාණය, සිංහල භාෂා දින සැමරුම්, ප්‍රදර්ශන, පුස්තකාල පරිහරණය



# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1
# අක්ෂර මාලාව
**(ලිඛිත අක්‍ෂර ව්‍යවහාරය)**

**නිපුණතාව** : 1. අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 අක්ෂර ව්‍යහාරය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05 යි.

**ඉගෙනුම් පල** :

- සිංහල අක්ෂර මාලාවේ මෑත කාලීන වර්ධනය පැහැදිලි කරයි.
- නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි.
- ස්වර අක්ෂර හා ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව හඳුනා ගෙන ලේඛන ගත කරයි.
- ව්‍යඤ්ජන අක්ෂරයෙන් ස්වර අක්ෂරය වෙන් කොට දක්වයි.
- නූතන සිංහල අක්ෂර මාලාව වර්ගීකරණය කර දක්වයි.
- නූතන සිංහල අක්ෂර මාලාව මතකයෙන් කියයි.
- සංයුක්තාක්ෂර හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.
- ස්වරාරූඪ ව්‍යඤ්ජන අක්ෂරයෙන් පිල්ල වෙන්කර දක්වයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සිංහල අක්ෂර මාලාවේ පහත සඳහන් කරුණු පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා ගන්න.
    - සිංහල අක්ෂර මාලාවේ අනුපිළිවෙළ
    - සිංහල අක්ෂර නිවැරදි ව උච්චාරණය කිරීම
    - සිංහල අක්ෂර මාලාවේ ප්‍රභේද
    - සිංහල අක්ෂර මාලාව නිවැරදි ව නම් කිරීම
    - සිංහල අක්ෂර මාලාව නිවැරදි ව ලිවීම
- පෙළපොතෙහි නියමිත 01 වන පාඩම (අක්ෂර මාලාව) කියවා ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගන්න.
- නූතන සිංහල අක්ෂර මාලාව සහිත පෝස්ටරයක් ප්‍රදර්ශනය කිරීම සඳහා සූදානම් කර ගන්න.
- පිලි සහිත පෝස්ටරයක් සකස් කර ගන්න.
- වදන් කවි පොතෙන් හෝඩිය ගැන කියවෙන කවියක් සූදානම් කරගන්න.

**ප්‍රවේශය**

- ඇමුණුම 1හි සඳහන් වදන් කවි පොතෙහි ''අවන පටන් අඃ වන්නට වදනින්'' කවිය ගායනා කරමින් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
- සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙර දැනුම විමසීමට ලක්කරන්න.
- පිලි සහිත පෝස්ටරය ප්‍රදර්ශනය කරමින් ඒ ඒ පිල්ලට අදාළ නම ශිෂ්‍යයන්ගෙන් ප්‍රශ්න කිරීමට ලක්කරන්න.

**පාඩම සංවර්ධනය**

- අක්ෂර මාලාවේ විකාශනය කෙටියෙන් පැහැදිලි කර දෙන්න.
- නූතන සිංහල අක්ෂර මාලාව ශිෂ්‍යයන්ට ඉදිරිපත් කර ස්වර, ව්‍යඤ්ජන හඳුන්වන්න.
- සිංහල අක්ෂර මාලාව මතකයෙන් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- සංයුක්තාක්ෂර සැකසෙන අයුරු හුනු පුවරුව භාවිතයෙන් පෙන්වා දෙන්න.
- ලේඛන කාර්යයේ දී පිලි නිවැරදි ව භාවිත කිරීමේ වටිනාකම පෙන්වා දෙන්න.
- සෑම ශිෂ්‍යයකු වෙත ම අවධානය යොමු කරමින් දුබලතා හා ප්‍රබලතා හඳුනා ගන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණය හා මග පෙන්වීම ලබා දෙන්න.
  (මේ සඳහා 2,3,4 ඇමුණුම් යොදා ගන්න.)
- පිලි භාවිතය පැහැදිලි කිරීම සඳහා ඇමුණුම 5 යොදා ගන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතෙහි පළමු පාඩම (අක්ෂර මාලාව)
- නූතන සිංහල අක්ෂර මාලාව සඳහන් පෝස්ටරය
- පිලි සඳහන් පෝස්ටරය
- ඇමුණුම්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ප්‍රකාශ කිරීම
- ස්වර අක්ෂර හා ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව හඳුනා ගෙන ලේඛන ගත කිරීම
- ව්‍යඤ්ජන අක්ෂරයෙන් ස්වර අක්ෂරය වෙන් කොට දැක්වීම
- නූතන සිංහල අක්ෂර මාලාව වර්ගීකරණය කිරීම
- සංයුක්තාක්ෂර හඳුනා ගෙන නිවැරදි ව භාවිත කිරීම
- ස්වරාරූඪ ව්‍යඤ්ජන අක්ෂරයෙන් පිල්ලම වෙන්කර දැක්වීම



ඇමුණුම 1

අවන පටන් අඃ වන්නට        ව ද නි න්
දැනෙන සොළස පෙළ සොරකුරු   ව ද නි න්
කයන එපස්වග යානව        ව ද නි න්
මෙ වන සූතිස් දනු හසකුරු     ව ද නි න්

ඇමුණුම 2

**සිදත් සඟරා හෝඩිය අකුරු 30**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **පණකුරු** | 10 : | | අ | ආ | ඉ | ඊ | උ | ඌ |
| | | | එ | ඒ | ඔ | ඕ | | |
| **ගතකුරු** | 20 : | ක | ග | ජ | | | | |
| | | | ට | ඩ | ණ | | | |
| | | | ත | ද | න | | | |
| | | | ප | බ | ම | | | |
| | | | ය | ර | ල | ව | | |
| | | | ස | හ | ළ | අං | | |

ඇමුණුම 3

| ශුද්ධ සිංහල හෝඩිය අකුරු 32 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ස්වර 12 | : | අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| | | උ | ඌ | එ | ඒ | ඔ | ඕ |
| ව්‍යඤ්ජන 20 | : | ක | ග | ජ | | | |
| | | ට | ඩ | ණ | | | |
| | | ත | ද | න | | | |
| | | ප | බ | ම | | | |
| | | ය | ර | ල | ව | | |
| | | ස | හ | ළ | අං | | |


ඇමුණුම 4

| සාම්ප්‍රදායික මිශ්‍ර සිංහල හෝඩිය අකුරු 54 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ස්වර 18 | : | | අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| | | | උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| | | | එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| ව්‍යඤ්ජන 30 | : | ක | ඛ | ග | ඝ | ඞ | | |
| | | | ච | ඡ | ජ | ඣ | ඤ | |
| | | | ට | ඨ | ඩ | ඪ | ණ | |
| | | | ත | ථ | ද | ධ | න | |
| | | | ප | ඵ | බ | භ | ම | |
| | | | ය | ර | ල | ව | | |
| | | | ශ | ෂ | ස | හ | ළ | |
| | | | අං | අඃ | | | | |



ඇමුණුම 5

පිලි භාවිතය



# 2
# අක්ෂර මාලාව
(අක්‍ෂර වින්‍යාසය)

**නිපුණතාව** : 1.0 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 ඓ, ඖ, භේදය හා ශ, ෂ, ස අක්ෂර නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි.
- භාෂාව නිවැරදි ව භාවිත කිරීමට අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධය අවශ්‍ය බව පෙන්වා දෙයි.
- අක්ෂර වින්‍යාසය සම්මත ආකාරයට යොදා ගනිමින් ලේඛන සකස් කරයි.
- ලේඛන කාර්යන්හි දී ඓ, ඖ, ශ, ෂ, ස අක්ෂර නිවැරදි ව යොදයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පෙර සූදානම**

- අක්ෂර වින්‍යාස රීති පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබා ගන්න.
- සම්මත ලේඛනයේ දී ඓ,ඖ,ශ,ෂ,ස අක්ෂර නිවැරදි ව යෙදෙන ආකාරය පිළිබඳ අවබෝධය ලබා ගන්න.

**ප්‍රවේශය**

- අක්ෂර වින්‍යාසය නිවැරදි නොවූ විට වචනවලින් අපේක්ෂිත අර්ථය වෙනස් වන බව පෙන්වීම සඳහා සදොස් සහ නිදොස් අක්ෂර වින්‍යාසය සහිත වාක්‍ය යෙදූ පෝස්ටරයක් නිර්මාණය කර ගන්න. එය ප්‍රදර්ශන කරමින් පාඩමට පිවිසෙන්න හෝ අක්ෂර වින්‍යාසය පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසමින් පාඩමට පිවිසෙන්න.

**පාඩම සංවර්ධනය**

- ණ, න, ල, ළ අක්ෂර යෙදෙන ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසන්න.
- ශ, ෂ, ස යන අක්ෂර භාවිතය හා එහි රීතිය පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- ඓ, ඖ අක්ෂර භාවිතය හා එහි රීතිය පිළිබඳ ශිෂ්‍යයන්ට අවබෝධයක් ලබා දෙන්න.



මේ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න.

- සදොස් අක්ෂර වින්‍යාසය සහිත ඡේදයක් ශිෂ්‍යයන්ට ලබා දී එය නිදොස් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඇමුණුම 2හි සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සදොස් හා නිදොස් අක්ෂර වින්‍යාසය සහිත ඡේද සඳහන් පත්‍රිකාව

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය - සඳගෝමි කෝපරහේවා
- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය (2015 නව සංස්කරණය)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක** :

- ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පෙන්වා දීම
- භාෂාව නිවැරදි ව භාවිත කිරීමට අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධය අවශ්‍ය බව ප්‍රකාශ කිරීම
- අක්ෂර වින්‍යාසය සම්මත ආකාරයට යොදා ගනිමින් ලේඛන සකස් කිරීම
- ලේඛන කාර්යයේ දී ඓ, ඖ, ශ, ෂ, ස අක්ෂර නිවැරදි ව යොදා ගැනීම

ඇමුණුම 1

- **ශ, ෂ, ස රීතිය**
- **තාලුජ 'ශ'**

තාලුජ 'ශ' මුලට යෙදෙන්නේ සංස්කෘත භාෂාවෙන් පැමිණි වචනවල පමණි.

ශ්‍යාමා ශුරයා

ච, ශ, ව අකුරුවලට පෙර තාලුජ 'ශ' යෙදේ.

| | | |
|---|---|---|
| විනිශ්චය | නිශ්ශබ්ද | විශ්වය |
| නිශ්චල | නිශ්ශෝභා | අශ්වයා |

ශ, ෂ අකුරු දෙක එකට යෙදෙන විට මුලින් යෙදෙන්නේ 'ශ' කාරය වේ.

ශිෂ්‍යයා විශේෂ

ශ,ස අකුරු දෙක එකට යෙදුණ විට මුලින් යෙදෙන්නේ 'ශ' කාරය යි.

ප්‍රශස්ති　　ශාස්ත්‍ර

- මූර්ධජ 'ෂ'

සංස්කෘත භාෂාවෙන් පැමිණි ඇතැම් වචන මුලට 'ෂ' යෙදේ.

ෂඩ් වර්ණ

**ට, ඨ, ක, ප, ණ අකුරුවලට මුලින් යෙදෙන්නේ 'ෂ' කාරය යි.**

ශිෂ්ට　　ශ්‍රේෂ්ඨ　　දුෂ්කර　　පුෂ්පය　　තෘෂ්ණාව

- දන්තජ 'ස'

සිංහල වචන මුලට යෙදෙන 'ස' කාරය දන්තජ වේ.

සමය　　සතුට

ප, ත, ථ, න, ම අකුරුවලට මුලින් යෙදෙන්නේ 'ස' කාරය යි.

ස්පර්ශ　　ස්තූපය　　ස්ථානය　　ස්නාන　　ස්මාරක

ත, න, ම, ස මෙම අකුරු සමග බොහෝ විට පදයක මැද යෙදෙන්නේ 'ස' කාරය යි.

වස්තුව　　දිස්නය　　අපස්මාරය　　ලස්සන

**ඇමුණුම 2**

සදොස් වචන නිදොස් කර ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| ඓක්‍යය | දුස්ශීල | ඖෂධාලය | ආභාෂය | ගවුතම | ප්‍රසස්ති |
| දුෂ්චරිතය | දෛනික | වයිරය | නිෂ්ඵල | අග්න්‍යාසය | චෞර |
| යසෝරාවය | ඖදාර්ය | හෂ්මාවශේෂ | දර්ශනශූරී | | |
| අයිරාවණ | නිස්ශංඛ | | | | |



# 03
# නාම පද

**නිපුණතාව** : **2.0** ලේඛන කාර්ය ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.1 නාම පද සාධනය පිළිබඳව අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදේ.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- නාම පදයක් යනු කුමක් දැ යි හඳුනා ගෙන විස්තර කරයි.
- ශබ්ද ප්‍රකෘතිය හා විභක්ති ප්‍රත්‍යය වෙන් කර දක්වයි.
- ශබ්ද ප්‍රකෘතිය හා විභක්ති ප්‍රත්‍යය සමවායෙන් නිපදවෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නාම පද ප්‍රභේද හඳුනා ගෙන විස්තර කරයි.
- එක් නාම පදයක් සියලු විභක්තිවල ඒක වචන හා බහු වචනයන්හි වරනගයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

පරිශීලනීය ග්‍රන්ථ කියවා පහත සඳහන් විෂය කරුණු එක් රැස් කර ගන්න.

- නාම පදය පිළිබඳ නිර්වචන
- නාම පදයක ප්‍රකෘතිය සොයා ගත හැකි ක්‍රම
- නාම පදයක ලක්ෂණ
    - වචන භේදය
    - ලිංග භේදය
    - සචේතන / අචේතන භේදය
- නාම පද ප්‍රභේද
- නාම වරනැගීම
- පාඩමට අවශ්‍ය කරන ඉගෙනුම් ආධාරක සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- ඇමුණුම 1හි සඳහන් කවිය ගායනා කර එය හුනු පුවරුවේ ලියා එහි නාම පද මොනවා දැ යි ශිෂ්‍යයන්ගෙන් විමසමින් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනයː**

- නාම පදයක් යනු කුමක් දැ යි නිර්වචනය කර පෙන්වා දෙන්න.
- නාම පදයකින් ප්‍රකෘතිය වෙන් කර ගන්නා අයුරු විස්තර කරන්න.
- නාම පදයක ප්‍රභේද විස්තර කර පෙන්නුම් කරන්න. (ඇමුණුම 2)
- නාම පදයක් විභක්තිවල වරනගා පෙන්වන්න.
- නාම පද ගොනුවක් ඉදිරිපත් කර ඒවා,
    - ඒක වචන නාම පද
    - බහු වචන නාම පද
    - ස්ත්‍රී ලිංග නාම පද
    - අචේතනික නාම පද ලෙස වෙන් කර පෙන්වන්න (ඇමුණුම3)

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතේ (2 පාඩම) නාම පද
- ඇමුණුම 1, ඇමුණුම 2 හා ඇමුණුම 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක ː**

- නාම පද යනු කුමක් දැ යි නිවැරදි ව හඳුන්වා දීම
- ශබ්ද ප්‍රකෘතිය හා විභක්ති ප්‍රත්‍ය වෙන් කර දක්වීම
- නාම ප්‍රභේද හඳුනා ගෙන විස්තර කිරීම
- එක් නාම පදයක් සියලු විභක්තිවල ඒක වචන බහුවචනයන්හි වරනැගීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක
- සිංහල වියරණ විදි - සිරි තිලකසිරි
- නාම පදය - ජේ.බී. දිසානායක
- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය ( නව සංස්කරණය)



ඇමුණුම් 1

| | |
|---|---|
| වියෙන් උතුරන්නේය රජ රට කිරෙන් ගිරුවා පොළව | සේදිණි |
| නියෙන් ඇන්නා වගේ බේරේ මිහින්තල වද වලින් මී | පැණි |
| පයින් එක් කළ හැකිය කජු අඹ පේර මොර දම් නසන සා | ගිනි |
| ජයෙන් ජය වේ මගේ ලංකා මිහිරි නිදහස විඳින | රාජිනි |

**මගේ රට (පී.බී. අල්විස් පෙරේරා)**

ඇමුණුම 2

| | | | | |
|---|---|---|---|---|
| ඔහු | වලස් | පින්හාල් | නැණැති | බලන |
| මම | ගොන් | රතුමල | දිගටි | ගයන |
| උෟ | මිනිස් | මල්සිනා | රුමත් | දුවන |
| ඒක | ද්‍රවිඩ | නිල්අහස | ගැමි | නටන |

ඇමුණුම 3

| | | | | | |
|---|---|---|---|---|---|
| ළමයා | නිළිය | කරත්තය | රියැදුරා | මිනිස්සු | වස්සා |
| සිංහයෝ | රථය | කතුර | කුරුල්ලෝ | නළුවෝ | භික්ෂුව |
| ගොවියෝ | තරුව | ගස | රජ | පැළ | කඩුව |
| සෙබළු | හිරු | ඇත්තු | පුටු | සඳ | සාගරය |

# 04
# සන්ධි

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යය ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.2 'සන්ධි' සංකල්පය ලේඛන කාර්ය සඳහා යොදා ගනියි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- සන්ධි යනු කුමක් දැ යි නිවැරදි ව නිර්වචනය කරයි.
- සන්ධි මගින් භාෂාවට ලැබෙන ප්‍රයෝජන නිවැරදි ව පවසයි.
- සන්ධි කාර්ය දහය නිවැරදි ව හඳුනා ගෙන එක් එක් සන්ධි වර්ගය ලියා දක්වයි.
- සන්ධි පද නිවැරදි ව විසන්ධි කිරීම හා විසන්ධි පද නිවැරදි ව සන්ධි කර පෙන්වයි.
- සන්ධි අර්ථාන්විත ව භාවිත කරමින් භාෂා කාර්යයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සන්ධි පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගන්න.
- දෘශ්‍යාධාරක සඳහා සන්ධි පද ලැයිස්තුවක් හා විසන්ධි පද ලැයිස්තුවක් සකස් කර ගන්න.

**ප්‍රවේශය**

- ඇමුණුම 1හි සඳහන් සන්ධි පද සහිත කවිය ශිෂ්‍යයන්ට කියවීම සඳහා හුනු පුවරුවේ ලියා එහි සඳහන් සන්ධි පද නම් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දී හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් ප්‍රවේශය ලබා ගන්න.

**පාඩම සංවර්ධනය**

- සන්ධි පද භාවිත වීම නිසා භාෂාව සරල වීම, භාෂාව රසවත් වීම, ලිවීමේ පහසුව, කියවීමේ පහසුව ඇති වීමට හේතු වන බව පැහැදිලි කරන්න.
- ප්‍රධාන සන්ධි විධි සහ සන්ධි ප්‍රභේද පිළිබඳ ව නිර්වචන ඉදිරිපත් කරන්න.
- සන්ධි පද හා විසන්ධි පද නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න. ඒ සඳහා ඇමුණුම 2 යොදා ගන්න.



**මූලික වචන /සංකල්ප**

''පෙර පර වණන් නිසි - විදිනි ගළපනු සඳ නම්
වණ ලොප් අදෙස් ඈ එහි - ලැකියනුසරින් දන්නේ '' (සිදත් සඟරාව)

(පූර්ව සහ අපර වර්ණ ආශ්‍රිත වූ (ලෝප ආදි) විධියෙන් ගළපා ලීම සන්ධි නම් වේ. එම සන්ධි සිදු කිරීමෙන් වර්ණ ලෝප ආදේශ ආදිය කාව්‍ය භාෂාව හා ලෝක ව්‍යවහාරයෙහි යෙදෙන උදාහරණ ආශ්‍රයෙන් දැන ගත යුතු වේ.)

**ගුණාත්මක යෙදවුම්**

- නිවැරදි ව විසන්ධි කර පෙන්වීමට අවශ්‍ය සන්ධි පද ගොනුවක් එක් කර ගන්න.
- නිවැරදි ව සන්ධි කිරීමට අවශ්‍ය විසන්ධි පද ගොනුවක් සූදානම් කර ගන්න.
- ඇමුණුම 1, ඇමුණුම 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සන්ධි යනු කුමක් දැ යි නිවැරදි ව හඳුනා ගෙන නිර්වචනය කිරීම
- සන්ධි මගින් භාෂාවට ලැබෙන ප්‍රයෝජන නිවැරදි ව පැවසීම
- සන්ධි වර්ග 10 නිවැරදි ව හඳුනා ගෙන එක් එක් සන්ධි වර්ගය ලියා දැක්වීම
- සන්ධි පද නිවැරදි ව විසන්ධි කිරීම හා විසන්ධි පද නිවැරදි ව සන්ධි කිරීම
- සන්ධි අර්ථාන්විත ව භාවිත කරමින් භාෂා කාර්යයන්හි යෙදීම

**පරිශීලනීය ග්‍රන්ථ**

සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය - ජේ. බී. දිසානායක
(3 සන්ධි විග්‍රහය)

සිදත් සඟරාව විමසුම - ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි
සිංහල වියරණ විදි - සිරි තිලකසිරි

ඇමුණුම 1

සිසි වන වුවන ඉඟ සුඟ ගත හැකි මිටින
නිසි පුළුලුකුල රිය සකයුරු තිසර තන
දිසි රනලියෙව් රූ සිරි යුත් මෙ පුරගන
ඇසි පිය හෙළන පමණින් නොවෙති දෙවගන

ඇමුණුම 2

**පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කර පෙන්වන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| යනෙන | ශාලාධිපති | සහෝදර | දෙවුර | සුරත | එදිනෙදා |
| පත්තිරු | ගුණැති | අතිනත | ගිනියම් | පුනරුත් | ගුරුතුමා |
| පිනැති | කම්මල | ගංවතුර | මහල්ලා | අතැති | කොල්ලා |

**පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කරන්න.**

| | | | |
|---|---|---|---|
| සුරු + අත | ශාලා + අධිපති | දෙ + අගසව් | බළල් + හු |
| දිගු + ආ | සදා + ආදර | මහ + ඉසි | සත් + හස් |



# 05
# සමාස

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්ය ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.3 සමාස යන සංකල්පය ලේඛන කාර්යය සඳහා යොදා ගනියි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- සමාස පද යනු කුමක් ද යි නිර්වචනය කරයි.
- සමාස පදයක දක්නට ලැබෙන ලක්ෂණ නිවැරදි ව නම් කරයි.
- සමාස ප්‍රභේද නම් කරයි.
- එක් එක් සමාසය නිදසුන් සහිත ව නිර්වචනය කරයි.
- සමාස සංකල්පය හඳුනා ගෙන ලේඛන කාර්යයේ දී නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සමාස පිළිබඳ දැනුම පොත පත පරිශීලනයෙන් ලබා ගන්න.
- සමාස පද හා සමාස ප්‍රභේද පිළිබඳ කරුණු රැස්කර ගන්න.

**ප්‍රවේශය**

- 'අඳ මව්පියො දෙදෙන ඔහු වයන බව නොම දැන'' යන කවිය ඇසීමට සලස්වා එහි සමාස පද වෙන් කිරීමට පැවරීමෙන් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් යොදා ගෙන පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

- සමාස යනු කුමක් ද යි හඳුන්වා දී එමගින් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න.
- සමාස පද භාවිතය නිසා භාෂාවට ලැබෙන ප්‍රයෝජන ගැන ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- අව්‍යය සමාසය, විශේෂණ සමාසය, අන්‍යාර්ථ සමාසය, ද කාරාර්ථ සමාසය, විභක්ති සමාසය යන ප්‍රභේද නිදසුන් මගින් විස්තර කරන්න.
- සමාස ප්‍රභේදවලට වෙන් කර ගැනීමට අවශ්‍ය සමාස පද සඳහා ඇමුණුම 1හි ගොනුව යොදා ගන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සමාස පද යනු කුමක් ද යි නිර්වචනය කිරීම
- සමාස පදයක ලක්‍ෂණ නම් කිරීම
- සමාස ප්‍රභේද නම් කිරීම
- එක් එක් සමාසය නිදසුන් මගින් නිර්වචනය කිරීම
- ලේඛන කාර්යයන් සඳහා සමාස නිවැරදි ව භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල රීතිය 7 පද නිර්මාණය - ජේ. බී. දිසානායක
- සිංහල වියරණ විදි - සිරි තිලකසිරි
- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

ඇමුණුම 1

**සමාස පද වෙන් කරන්න.**

| | | |
|---|---|---|
| රජසිරිස | තිනෙත් | මල්සිනහව |
| නිල්අහස | කිරිබත් | දෙඅත් |
| පබල | තලතෙල් | ලඹසවන් |
| කුපුරිස් | අනුනායක | තෙරුවන් |
| ගස්වැල් | දුදන | යාවජීව |



# 6
# තද්ධිත

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්ය ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.4 තද්ධිත යන ව්‍යාකරණ සංකල්පය පද සාධනයට යොදා ගනියි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- තද්ධිත නාම යනු නාම ප්‍රකෘතියකට ප්‍රත්‍ය එකතු වීමක් බව ප්‍රකාශ කරයි.
- නාම ප්‍රකෘතියේ අර්ථය නො ව ප්‍රත්‍යයේ අර්ථය බලවත් බව ප්‍රකාශ කරයි
- ප්‍රත්‍යයාර්ථ නාම ප්‍රභේද වශයෙන් වර්ග කර විස්තර කරයි.
- විවිධ අරුත් දෙන තද්ධිත ප්‍රත්‍යය උදාහරණ ඇසුරෙන් විස්තර කරයි.
- තද්ධිත ප්‍රත්‍යය යෙදීම මගින් තද්ධිත පද අර්ථ ගෙන දෙන බව හඳුනා ගෙන පවසයි.
- භාෂා කාර්යයේ දී තද්ධිත පද නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ව්‍යාකරණ ග්‍රන්ථ පරිශීලනය කරමින් තද්ධිත පද පිළිබඳව අවබෝධය ලබා ගන්න.

ප්‍රවේශය

- තද්ධිත නාම යනු කුමක් ද යි නිර්වචනයක් හුනු පුවරුවේ සටහන් කර, එය පැහැදිලි කරමින් හෝ වෙනත් සුදුසු ආකාරයකින් පාඩමට ප්‍රවේශයක් ලබා ගන්න.

**පාඩම සංවර්ධනය**

- ප්‍රවේශය සඳහා ලියන ලද නිර්වචනයට ගැළපෙන උදාහරණ ලියා, තද්ධිත නාම හඳුනා ගැනීමට උදවු කරන්න.

- නාමයක් හෙවත් නාම මූලයක් අගින් තද්ධිත ප්‍රත්‍ය එකතු කර ගැනීමෙන් තද්ධිත පද තනා ගන්නා බව පැහැදිලි කරන්න.

උදා : නැව් + ඉ - නැවි
තොට + ඉ - තොටි

- තද්ධිත ප්‍රත්‍ය 23ක් ලියා පෙන්වන්න. මේ සඳහා ඇමුණුම 3 භාවිත කළ හැකි ය.

**ගුණාත්මක යෙදවුම්**

- තද්ධිත පදවලින් ප්‍රත්‍ය වෙන්කර පෙන්වීමට අවශ්‍ය පද සහිත පත්‍රිකාව (ඇමුණුම 1)
- ප්‍රකාශිත අර්ථ සඳහා තද්ධිත නාම ලිවීමට තනා ගත් ප්‍රකාශ ගොනුව (ඇමුණුම 2 හා ඇමුණුම 3)
- පෙළපොතේ (5 පාඩම) ප්‍රත්‍යාර්ථ නාම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නාම ප්‍රකෘතියකට තද්ධිත ප්‍රත්‍ය එකතු විමෙන් තද්ධිත පද සෑදෙන බව ප්‍රකාශ කිරීම
- විවිධ අරුත් දෙන තද්ධිත ප්‍රත්‍ය නම් කිරීම
- තද්ධිත ප්‍රත්‍ය යොදා ගැනීම මගින් තද්ධිත පද අර්ථ ගෙන දෙන බව හඳුනා ගෙන පැවසීම
- භාෂා කාර්යයේ දී තද්ධිත පද නිවැරදි ව භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- සිදත් සඟරාව විමසුම - ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි
- සිංහල වියරණ විදි - සිරි තිලකසිරි

ඇමුණුම් 1

**පහත සඳහන් පද අතුරින් තද්ධිත පද වෙන්කර ලියන්න.**

| | | | | |
|---|---|---|---|---|
| වරලස | ඉගටි | ඇත්ත | කරටි | සිඟිති |
| කැහැටු | වකුටු | ඉහටි | නැට්ටුවා | සොටු |
| නාරටි | ළමයා | පහණ | බොටුව | පිහිණුම් |
| ගයා | මැටි | නළල | බළලා | නටනවා |



ඇමුණුම 2

**පහත සඳහන් අර්ථ ප්‍රකාශ කරන තද්ධිත නාම ලියන්න.**

1. ගලින් කරන ලද ................................................
2. ධනය බොහෝ ඇති ................................................
3. කරුණාව ඇති ................................................
4. ගරු කටයුතු මව ................................................
5. ගරු කටයුතු පියා ................................................

ඇමුණුම 3

**තද්ධිත ප්‍රත්‍ය**

| | | | | |
|---|---|---|---|---|
| 1. ඉ | 6. තර | 11. අස් | 16. අණු | 21. අළ |
| 2. මුවා | 7. තම | 12. අත් | 17. අණි | 22. ආ |
| 3. මය | 8. ඉති | 13. බ | 18. එක් | 23. උතු |
| 4. මත් | 9. අටි | 14. තා | 19. උ | |
| 5. වත් | 10. අටු | 15. ආණ | 20. අ | |

# 07
# කෘදන්ත

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්ය ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.5 කෘදන්ත යන ව්‍යාකරණ අංගය පද සාධනයට යොදා ගනියි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රත්‍යාර්ථ නාම මොනවා දැ යි ප්‍රභේද වශයෙන් විස්තර කරයි.
- කෘදන්ත පද ප්‍රභේද හතරක් නිවැරදි ව නම් කරයි.
- කෘදන්ත නාම සෑදෙන ආකාරය නිදසුන් මගින් විස්තර කරයි.
- කෘදන්ත නාම අනෙක් නාම අතරින් වෙන් කර පෙන්වයි.
- භාෂාමය කාර්යයේ දී කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ප්‍රත්‍යාර්ථ නාම ව්‍යාකරණාංගයට අදාළ ව විෂය කරුණු එක්රැස් කර ගන්න.
- ඔබේ සැලසුමට අවශ්‍ය පරිදි ඉගෙනුම් ආධාරක හා ක්‍රියාකාරකම් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- ඇමුණුම 1හි කවිය ගායනා කර එහි ඇති කෘදන්ත පද හඳුන්වන්නට පැවරීම හෝ වෙනත් සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

**පාඩම සංවර්ධනය**

කෘදන්ත ප්‍රභේද හතරක් ඇති බව බව පැහැදිලි කර දෙන්න.

- ක්‍රියා මූලකයට (ධාතුවකට) කෘදන්ත ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන නාම සහ ආඛ්‍යාත කෘදන්ත නාම බව පෙන්වා දෙන්න.

උදා: **නට + නු = නටනු**
**ලිය + නු = ලියනු**

- අගට යෙදෙන ප්‍රත්‍යයෙහි අර්ථය ප්‍රධාන වන නිසා ප්‍රත්‍යාර්ථ නාම වන බව පැහැදිලි කරන්න



- ධාතුවකට හෙවත් ක්‍රියා මූලයකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් කෘදන්ත නාම තැනෙන බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. නට ධාතුවට නු එක් වීමෙන් (නට + නු) නටනු යන කෘදන්ත නාමය සෑදේ. නටන යන පදයට විභක්ති ප්‍රත්‍ය එක් වී නාම පදයක් සේ වරනැගිය හැකි ය.

උදා : **නටුනු + ආ නටන්නා**
**බලනු + ආ බලන්නා**

- ඇමුණුම 2හි සඳහන් ධාතුව හා කෘදන්ත ප්‍රත්‍ය වෙන් කර දක්වීමට අවශ්‍ය පද සහිත පත්‍රිකාව යොදා ගන්න.
- උදාහරණ සහිතව කෘදන්ත ප්‍රභේද හඳුන්වා දෙන්න.
- කර්තෘ කාරක කෘදන්ත
  - වර්තමාන කාල කර්තෘ කාරක ප්‍රත්‍ය. න, නු, නා
  - අතීත කාල කර්තෘ කාරක ප්‍රත්‍ය. ඉ, උ, ඌ, ඈ
- කර්ම කාරක කෘදන්ත.
  - වර්තමාන කාල කර්ම කාරක ප්‍රත්‍ය. නු, න,
  - අතීත කාල කර්ම කාරක ප්‍රත්‍ය. උණු, උණ
- භාව කාරක කෘදන්ත
  - ක්‍රියා භාවය පමණක් යෙදෙන කෘදන්ත නාම භාව කාරක කෘදන්ත වේ. ඒ සඳහා නූ, උම්, ඊම්, ඉලි, මන් ප්‍රත්‍ය යෙදේ.
- කරණ කාරක කෘදන්ත
  - කරණාර්ථයක් හඟවන කෘදන්ත ''කරණ කාරක'' කෘදන්ත වේ. එයින් උපකරණයක් පැවසේ. න, නා ප්‍රත්‍ය මේ සඳහා යෙදේ.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතේ (5 පාඩම) ප්‍රත්‍යාර්ථ නාම
  ඇමුණුම 1 හා ඇමුණුම 2

ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :

- ප්‍රත්‍යාර්ථ නාම යනු මොනවා දැ යි ප්‍රභේද වශයෙන් විස්තර කිරීම
- කෘදන්ත පද ප්‍රභේද හතර නම් කිරීම
- කෘදන්ත නාම සෑදෙන ආකාරය නිදසුන් මගින් විස්තර කිරීම
- කෘදන්ත නාම අනෙක් නාම අතුරින් වෙන් කර පෙන්වීම
- භාෂාමය කාර්යයේ දී කෘදන්ත නිවැරදි ව භාවිත කිරීම

පරිශීලනීය ග්‍රන්ථ

- සිංහල වියරණ විදි - සිරි තිලකසිරි
- සිංහල ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

ඇමුණුම 1

| | |
|---|---|
| දුම්බර කෙතේ වැට බැඳලා **රැකුම්** | බැලුම් |
| මහවැලි ගඟේ දිය බැඳලා කෙතට | **ගිලුම්** |
| පෙම්බර ලියන් කර ඔසවා බලන | බැලුම් |
| තුන්පත් රටාවකි දුම්බර කෙතේ | නෙලුම් |

ඇමුණුම 2

**පහත සඳහන් කෘදන්ත පදවල ධාතුව හා කෘදන්ත ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.**

| | | ධාතුව | කෘදන්ත ප්‍රත්‍යය |
|---|---|---|---|
| 1. | බලනු | ............................................. | ............................................. |
| 2. | ගයනු | ............................................. | ............................................. |
| 3. | ලියුම් | ............................................. | ............................................. |
| 4. | කියුම් | ............................................. | ............................................. |
| 5. | කැපිලි | ............................................. | ............................................. |



# 08
# ආඛ්‍යාත පද

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්ය ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.6 ක්‍රියා පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතුව ලේඛන කාර්යයේ යෙදේ.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- ධාතුවක් හෙවත් ක්‍රියා මූලයක් යනු කුමක් දැ යි හඳුනා ගෙන විස්තර කරයි.
- ක්‍රියා පදයකින් ධාතුව වෙන් කර ලියයි.
- ආඛ්‍යාතයක දක්නට ලැබෙන විවිධ ප්‍රභේද විස්තර කරයි.
- ආඛ්‍යාත පදය ප්‍රධාන ප්‍රභේදවලට වෙන්කර ඉදිරිපත් කරයි.
- ලේඛන කාර්යයේ දී ආඛ්‍යාතය නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ප්‍රාමාණික ව්‍යාකරණ ග්‍රන්ථ කියවා පහත සඳහන් විෂය කරුණු රැස්කර ගන්න.
  - ධාතුවක් යනු කුමක් දැ යි හඳුනා ගැනීම
  - ක්‍රියා පදයක ධාතුව සොයා ගන්නා ක්‍රම
- ආඛ්‍යාත පදයක් සඳහා යෙදෙන විභක්ති ප්‍රත්‍යය අනුව කාල, පුරුෂ, කාරක, වචන භේදය ගන්නා ආකාරය

**ප්‍රවේශය**

- පාඩම සඳහා පහත සඳහන් ප්‍රවේශය හෝ වෙනත් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

  ආඛ්‍යාත පදයක් හුනු පුවරුවේ ලියා ආඛ්‍යාත පදයක ලක්ෂණ ශිෂ්‍යයන්ගෙන් විමසීම.
  (මේ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න)

**පාඩම සංවර්ධනය**

- ධාතුවක් යනු කුමක් දැ යි විස්තර කිරීමට හුනු පුවරුව භාවිත කරමින් නිදර්ශන සහිතව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍ය යොදා ගැනීමෙන් කාල භේදය, පුරුෂ භේදය, කාරක භේදය, වචන භේදය ඇති වන ආකාරය ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- ආඛ්‍යාත ප්‍රභේද හඳුන්වා දෙන්න. (ආශිර්වාද ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා)
- ආඛ්‍යාත ප්‍රභේද වෙන් කර හඳුනා ගැනීමේ අභ්‍යාසවල ශිෂ්‍යයන් යොමු කරවන්න. (මේ සඳහා ඇමුණුම 2 භාවිත කරන්න)

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01 හා 02
- පෙළපොතේ (6 පාඩම) ආඛ්‍යාත පද

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ධාතුවක් හෙවත් ක්‍රියා මූලයක් යනු කුමක් දැ යි විස්තර කිරීම
- ක්‍රියා පදයකින් ධාතුව වෙන්කර ලියා පෙන්වීම
- ආඛ්‍යාතයක විවිධ භේද විස්තර කර පෙන්වීම
- ආඛ්‍යාත පදයක් ප්‍රධාන ප්‍රභේදවලට වෙන් කර පෙන්වීම
- ලේඛන කාර්යයේ දී ආඛ්‍යාතය නිවැරදි ව භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල වියරණ විදි - සිරි තිලකසිරි
- ක්‍රියා විවරණය - කුමාරතුංග මුනිදාස
- බසක මහිම හා ක්‍රියා පදය - ජේ. බී. දිසානායක

ඇමුණුම 1

ආඛ්‍යාත පද හැඳින්වීම

ක්‍රියා මූලයකට නැතහොත් ධාතුවකට ආඛ්‍යාත ප්‍රත්‍යය එක් වී සෑදෙන අවසාන ක්‍රියා ''ආඛ්‍යාත පද''යනුවෙන් හැඳින් වේ.

නිදසුන් ගය + ආ - ගයා
බල + ආ - බලා

ගය ධාතුවට ආඛ්‍යාත ප්‍රත්‍යය එක්වී ගයා යන ක්‍රියා පදය තැනේ. 'යි' යනු වාක්‍ය අවසාන යෙදෙන නිපාතයකි. එය ගයා යන ක්‍රියා පදය හා එක්වීමෙන් ''ගයයි'' යන්න ලැබේ.

ඇමුණුම 2

පහත දැක්වෙන ආඛ්‍යාත පද විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා යන ප්‍රභේදවලට බෙදන්න.

| | | |
|---|---|---|
| සැරදේවා | ලැබේවා | කරවයි |
| සෙත්වේවා | ලබමුවා | වසීවා |
| යන්න | නැසෙහුවා | දිනේවා |
| ලියවයි | තනවයි | දුවන්න |
| ආයුබෝ වේවා | කියවයි | වඩින්න |



# 09
# නේපාතික කෘදන්ත

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්ය ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.7 නේපාතික කෘදන්ත හඳුනා ගෙන ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- නේපාතික කෘදන්ත යනු කුමක් දැ යි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නේපාතික කෘදන්ත ප්‍රභේද 3ක් ඇති බව පවසයි.
- පූර්ව ක්‍රියාව නිවැරදි ව වෙන් කොට දක්වයි.
- මිශ්‍ර ක්‍රියාව නිවැරදි ව හඳුන්වයි.
- අසම්භාව්‍ය ක්‍රියා කුමක් දැ යි නිවැරදි ව වෙන් කර දක්වයි.
- නේපාතික ක්‍රියා ලේඛන කාර්යයේ දී නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා හා අසම්භාව්‍ය ක්‍රියා දැක්වෙන පෝස්ටරයක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා සහිත වාක්‍යයක් හුනු පුවරුවේ ලියා එම ක්‍රියා අතර වෙනස හඳුන්වා දෙමින් හෝ වෙනත් සුදුසු ක්‍රමයකින් පාඩම සඳහා ප්‍රවේශයක් ලබා ගන්න.

**පාඩම සංවර්ධනය**

- නේපාතික කෘදන්ත යනුවෙන් හඳුන්වන ක්‍රියා පදවල විශේෂත්වය පහදන්න. (මේ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න)
- නේපාතික කෘදන්ත ප්‍රභේද තුනක් ඇති බව පැහැදිලි කරන්න.
- අවසාන ක්‍රියාවට පෙර කරන ලද ක්‍රියා පූර්ව ක්‍රියා වන බව විස්තර කරන්න.
- පූර්ව ක්‍රියාව තනා ගන්නා ආකාර විස්තර කරන්න.
- මිශ්‍ර ක්‍රියාව තනා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- අසම්භාව්‍ය ක්‍රියාව යනු කුමක් දැ යි පැහැදිලි කරන්න.
- අසම්භාව්‍ය ක්‍රියාව ප්‍රභේද දෙකක් බව නිදසුන් මගින් පැහැදිලි කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතේ (5 පාඩම) කෘදන්ත
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නෛපාතික කෘදන්ත යනු කුමක් ද යි හඳුනා ගෙන ප්‍රකාශ කිරීම.
- නෛපාතික කෘදන්ත ප්‍රභේද 3ක් ඇති බව ප්‍රකාශ කිරීම.
- පූර්ව ක්‍රියාව නිවැරදි ව වෙන් කොට දැක්වීම.
- මිශ්‍ර ක්‍රියාව නිවැරදි ව හැඳින්වීම.
- අසම්භාව්‍ය ක්‍රියා නිවැරදි ව වෙන් කර දැක්වීම.
- නෛපාතික ක්‍රියා ලේඛන කාර්යයේ දී නිවැරදි ව භාවිත කිරීම.

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල වියරණ විදි - සිරි තිලකසිරි
- සිංහල ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

ඇමුණුම 1

පුරුෂ, වචන ආදි වර නොනැගෙන්නා වූ ක්‍රියා රූප නිපාත ක්‍රියා යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ සඳහා පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා අයත් වේ.

| | | |
|---|---|---|
| පූර්ව ක්‍රියා | : | කර, දැක, පිවිස |
| මිශ්‍ර ක්‍රියා | : | බලමින්, නටමින්, කමින් |
| අසම්භාව්‍ය ක්‍රියා | : | කරත, බලත, කළොත් |



# 10
# වාක්‍ය නිර්මාණය

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්ය ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.8 සාමාන්‍ය හා විශේෂ රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :

- සම්මත රීතිවලට අනුකූලව කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය අවස්ථෝචිතව නිවැරදි ව ලියා දක්වයි.
- වාක්‍ය නිර්මාණයේ සාමාන්‍ය රීති අනුගමනය කරමින් වාක්‍ය නිර්මාණය කරයි.
- වාක්‍ය නිර්මාණයේ විශේෂ රීති අවබෝධ කරගෙන නිවැරදි වාක්‍ය ලිවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය නිර්මාණය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සාමාන්‍ය හා විශේෂ රීතිවලට අනුකූලව සකස් කර ගත් වාක්‍ය කිහිපයක් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කිරීමට හැකි වන සේ සුදුසු ආකාරයට පිළියෙල කර ගන්න.
- ඇමුණුම 1 හා 2හි ඇතුළත් ක්‍රියාකාරකම්වලට අවශ්‍ය පැවරුම් පත්‍රිකා සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- සකස් කර ගත් වාක්‍ය කිහිපය ප්‍රදර්ශනය කරමින් ඒවායේ උක්තය හා ආඛ්‍යාතය එකිනෙකට වෙනස් ආකාරයකින් සකස් වී ඇති අයුරු දක්වමින් පාඩමට පිවිසෙන්න.
- ලේඛන කාර්යයේ දී ව්‍යාකරණයේ ඇති සාමාන්‍ය හා විශේෂ රීති පිළිබඳව අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය**

- පාඩමට අදාළ වාක්‍ය රීති ඇතුළත් කර සකස් කර ගත් ඡේදයක් හෝ පෙළපොතේ 8 පාඩම කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසා දෙන්න.
- එහි ඇතුළත් වාක්‍ය රීති කෙරෙහි අවධානය යොමු කරමින් වාක්‍ය රීති පිළිබඳව පෙර දැනුම පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය අවදි කරන්න.

- වාක්‍ය ලිවීමේ දී අනුගමනය කරන පහත සඳහන් රීති උදාහරණ දක්වමින් පැහැදිලි කර දෙන්න.

  - කර්තෘකාරක, කර්මකාරක වාක්‍ය රීති
  - වාක්‍ය නිර්මාණයේ සාමාන්‍ය රීති
  - වාක්‍ය නිර්මාණයේ විශේෂ රීති
  - නපුංසක ලිංග ඒක වචන/ බහු වචන පද භාවිතය
  - සමූහාර්ථවාචී පද භාවිතය
  - ගෞරවාර්ථවාචී පද භාවිතය
  - නිත්‍ය බහුවචනාර්ථ පද යෙදීම
  - සංශයාර්ථය භාවිතය
  - ශ්‍රැති සූචනාර්ථයේ ල/ලු නිපාත
  - අවිනිශ්චිතාර්ථයේ යෙදෙන 'වි' නිපාතය
  - ඇත/නැත යෝගය
  - ආඛ්‍යාත පූර්ණයේ යෙදීම
  - ප්‍රශ්නාර්ථවාචී පද යෙදීම
  - යුතු/මැනවි පද යෙදීම

- එක් රීතියක් සඳහා උදාහරණ තුනක්වත් සපයමින් පැහැදිලි කරන්න.
- එක් එක් රීතිය පැහැදිලි කිරීමෙන් අනතුරුව ඊට අදාළ අභ්‍යාසයක ශිෂ්‍යයන් නිරත කරවන්න.
- වාක්‍ය රීතියට අදාළ ව නිර්මාණාත්මක පැවරුම් සකස් කර ගන්න. (මේ සඳහා ඇමුණුම 1, 2 යොදා ගන්න)
- පෙළපොතේ ඇති අභ්‍යාසවල ද ශිෂ්‍යයන් නිරත කරවන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කර ගෙන පැවරුම් පත් බෙදා දෙන්න.
- පැවරුම්පත් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ශිෂ්‍යයන් නිරීක්ෂණය කරමින් අවශ්‍ය මග පෙන්වීම් කරන්න.
- අවශ්‍ය පරිදි ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය (2015 නව සංස්කරණය)
- සිංහල ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**


- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යවල වෙනස්කම් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- වාක්‍ය නිර්මාණයේ සම්මත රීති හා විශේෂ රීති හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- වාක්‍ය නිර්මාණයේ සාමාන්‍ය රීති අනුගමනය කරමින් වාක්‍ය නිර්මාණය කිරීම



- උක්තාඛ්‍යාත යෝගයේ විශේෂ රීති අවබෝධ කරගෙන වාක්‍ය ලිවීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම
- ලේඛන කාර්යයේ නිවැරදි ව යෙදීම සඳහා වාක්‍ය රීතිවලට අනුගත වීමේ අවශ්‍යතාව පිළිගෙන විස්තර කිරීම

**ඇමුණුම 1**

පහත සඳහන් විශේෂ වාක්‍ය රීති සඳහා සුදුසු වාක්‍යය බැගින් ලියන්න.



**ඇමුණුම 02**

කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය යනු මොනවා දැ යි කෙටියෙන් හඳුන්වා දී උදාහරණ වාක්‍ය තුන බැගින් ලියන්න.

| කර්තෘකාරක වාක්‍ය |
| --- |
| හැඳින්වීම |
| වාක්‍ය<br>1<br>2<br>3 |

| කර්මකාරක වාක්‍ය |
| --- |
| හැඳින්වීම |
| වාක්‍ය<br>1<br>2<br>3 |



# 11
# වාක්‍ය රචනය

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් නිරවුල් ව ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- වාක්‍ය රචනා යනු කුමක් ද යි නිවැරදි ව විස්තර කරයි.
- මාතෘකානුකූල රචනා ලිවීම සඳහා සාරවත් කරුණු රැස් කරයි.
- රචනාව ලිවීම සඳහා සැකිලි සකස් කරයි.
- වාක්‍ය රචනා ලිවීමේ දී අවශ්‍ය කරුණු, සංවිධානාත්මකව හා නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් රචනාකරණයේ යෙදෙයි.
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- අතිරේක පොත පත කියවා රචනාවට අවශ්‍ය කරුණු එක් රැස්කර ගන්න.
- ගුණාත්මක රචනාවකට අවශ්‍ය අංග පෙළගස්වා ගන්න.

**ප්‍රවේශය**

- ආදර්ශ රචනාවක් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කර එය කියවා ප්‍රධාන ලක්ෂණ පෙන්වා දීම මගින් හෝ වෙනත් සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.

**පාඩම සංවර්ධනය**

- රචනාවක් යනු කුමක් ද යි පැහැදිලි කර දෙන්න.
- ආරම්භය, මධ්‍යය හා අවසානය යනුවෙන් කොටස් තුනක් රචනයක අන්තර්ගත වන බව පැහැදිලි කර දෙන්න.
- රචනාවක ආරම්භය සිදු කරන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් මාතෘකාවකට අනුව රචනා සැකිල්ලක් හුනු පුවරුවේ ලියා පෙන්වන්න (මේ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න)
- රචනයක අවසානය ගොඩනගන ආකාරය පැහැදිලි කර දෙන්න.
- රචනා ලිවීමට මාතෘකා ශිෂ්‍යයන්ට ලබා දෙන්න. (ඇමුණුම 2 යොදා ගන්න)

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1, 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක ඃ**

- මාතෘකානුකූල රචනා ලිවීම සඳහා සාරවත් කරුණු රැස් කිරීම
- රචනාව ලිවීම සඳහා සැකිලි සකස් කිරීම
- වාක්‍ය රචනා ලිවීමේ දී අවශ්‍ය කරුණු සංවිධානාත්මකව හා නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම
- ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් රචනාකරණයේ යෙදීම
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලිවීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු
- ප්‍රබන්ධ සංග්‍රහය - කුමාරතුංග මුනිදාස
- ලියන කලාව - බඹරැන්දේ සිරිසීවලී හිමි

ඇමුණුම 1

රචනා සැකිලි

මාතෘකාව සුන්දර ශ්‍රී ලංකාව

**ආරම්භය**

- **ශ්‍රී ලංකාව පිළිබඳ හැඳින්වීම**
  - ශ්‍රී ලංකාව පිහිටා තිබෙන ආකාරය හැඳින්වීම
  - ශ්‍රී ලංකාවේ ඉතිහාසය විස්තර කිරීම
- මධ්‍යය
  - ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ
  - ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන හා ඒවායේ වැදගත්කම පැවසීම
  - සුන්දර ස්ථාන විනාශ වී යන අයුරු හා ඊට හේතු පැහැදිලි කිරීම
- අවසානය
  - සුන්දර ස්ථාන රැක ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම
  - ඒ සඳහා ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කිරීම



ඇමුණුම 2

රචනා මාතෘකා

- ජාතික විරුවෝ
- ගස් වැල් අපේ මිතුරෝ ය.
- සමගිය බලය වේ.
- යහපත් සමාජයක් තැනීමට පංචශීලය ඉවහල් වන අයුරු
- විද්‍යාත්මක දියුණුව සමග ආධ්‍යාත්මික දියුණුව ද ඇති කර ගත යුතු ය.
- අධ්‍යාපනයේ මූලාරම්භය පිරිවෙණ මගින් සිදු විය.
- ජාතික සමගිය රටක දියුණුවට හේතු වේ.

# 12
# සාරාංශකරණය

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.2 පාඨයක අන්තර්ගතය හකුළුවා ව්‍යක්ත ලෙස ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු විස්තර කරයි.
- මුල් ලේඛනයේ අන්තර්ගතයට හානියක් නොවන සේ සාරාංශකරණයෙහි නියුතු වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ගද්‍ය ඡේදයක් වචන තුනෙන් එකක් වන සේ සාරාංශ කර දක්වයි.
- ලිපි ලේඛන සාරාංශකරණයේ අවශ්‍යතාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අවස්ථෝචිත ව ලිපි ලේඛන සාරාංශ කොට දක්වයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- වාක්‍ය තුනක් හෝ හතරක් සහිත කුඩා ඡේදයක් සූදානම් කර ගන්න.
- එම ඡේදයේ අදහසට හානි නොවන පරිදි තනි වාක්‍යයකින් හෝ දෙකකින් සාරාංශ කර ගන්න.
- අවශ්‍ය පැවරුම් පත් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- සූදානම් කරගත් ඡේදය පුවරුව ලියා හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් මගින් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම ඡේදයේ අදහසට හානි නොවන පරිදි එය කෙටිකර ලිවිය හැකි බව සාරාංශ කර ගත් ඡේදය පෙන්වමින් තහවුරු කරන්න.

**පාඩම සංවර්ධනය**

- පෙළපොතේ 10 පාඩම යටතේ දී ඇති ක්‍රියාකාරකම්වලින් සුදුසු එකක් තෝරා ගෙන සාරාංශකරණය හඳුන්වා දෙන්න.
- අර්ථවත් සාරාංශයක තිබිය යුතු ලක්ෂණ සාකච්ඡා කරන්න.
  - මුල් ලේඛනයේ අදහසට හානියක් නොවන පරිදි එහි අදහස සංක්ෂිප්ත කොට දැක්වීම.
  - අනවශ්‍ය විස්තර හෝ සාරාංශ කරන්නාගේ අදහස් ඇතුළත් නොකිරීම.



- සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු
  - සාරාංශකරණය සඳහා දී ඇති ඡේදය කිහිපවරක් කියවා එහි මුඛ්‍යාර්ථය වටහා ගැනීමට අවශ්‍ය බව
  - වැදගත් යැයි හැඟෙන අදහස්වලට යටින් ඉරි ඇඳ සලකුණු කර ගැනීම
  - අනවශ්‍ය වර්ණනා, උපමා, රූපක, උදාහරණ ආදිය ඉවත් කිරීම
  - මුල් ලේඛනයේ ඉවත් කළ යුතු විස්තරාත්මක කොටස් හඳුනා ගැනීම
  - වැදගත් අදහස් ක්‍රමානුකූලව ගළපා ගැනීම
  - සාරාංශය තමන්ගේ වචනයෙන් ලිවීමේ අවශ්‍යතාව
  - නිවැරදි උක්තාඛ්‍යාත සම්බන්ධය, පද බෙදීම ආදි ශිල්පීය ක්‍රම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම
  - අපේක්ෂිත වචන සංඛ්‍යාව ගැන උපදෙස් ලබා දී තිබේ නම් එය අනුගමනය කිරීමටත් නොඑසේ නම් ඡේදයෙන් තුනෙන් එකක් වන සේ සාරාංශ කිරීමේ අවශ්‍යතාව
  - සාරාංශකරණය සඳහා ඡේද කිහිපයක් සහිත පාඨයක් දී තිබුණත් ඒ සියල්ල ම එක් ඡේදයක් ලෙස සාරාංශ කිරීම අවශ්‍ය බව
  - සාරාංශයේ ඇතුළත් වචන සංඛ්‍යාව දක්වන ලෙස උපදෙස් දී ඇත්නම් එය නිවැරදි ව ගණන් කර දැක්වීම
- ඇමුණුම 1හි සඳහන් අභ්‍යාසයෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.
- පෙළපොතේ දී ඇති ක්‍රියාකාරකම්වල ද ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සාරාංශ කිරීම සඳහා සුදුසු ඡේද කිහිපයක්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු විස්තර කිරීම
- මුල් ලේඛනයේ අන්තර්ගතයට හානියක් නොවන සේ සාරාංශකරණයෙහි නියුතු වීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම
- ගද්‍ය ඡේද සාරාංශ කර දැක්වීම
- ලිපි ලේඛන සාරාංශකරණයේ අවශ්‍යතාව හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- අවස්ථෝචිත ව ලිපි ලේඛන සාරාංශ කොට දැක්වීම

ඇමුණුම 01

**පහත සඳහන් ගද්‍ය කොටස් ඒවායේ අන්තර්ගත වචන ප්‍රමාණයෙන් තුනෙන් එකක් වන පරිදි සාරාංශ කරන්න.**

දේශය යන්න රට පළාත යන අරුත්හි යෙදේ. දේශීය නම් ස්වකීය රටට අයත් වීම ය. දේශීත්වය නම් ස්වකීය දේශයට අයත් හෝ ඊට ආවේණික තත්ත්වය යි. සාහිත්‍ය කලා නිර්මාණයේ දී ලේඛකයාගේ හෝ කලාකරුවාගේ අත්දැකීම් පසුබිම් වන හෙයින් සැබෑ නිර්මාණයක අනිවාර්යෙන් ම දේශීය ලකුණ හෙවත් දේශීත්වය ගැබ් වී තිබීම වැළැක්විය නො හැකි ය. දේශීයත්වය සහිත කෘතියක් ඇති වන්නේ එය නිර්මාණය කරන තැනැත්තා තුළ ස්වකීය දේශය පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති කල්හි ය. තම රටෙහි, සංස්කෘතියෙහි සම්ප්‍රදායෙහි මෙන් ම සමාජයෙහි ද දෙපා පිහිටා ගෙන සිටින තැනැත්තාගේ නිර්මාණයෙහි ඒ සලකුණු අනිවාර්යෙන් ම සටහන් වන්නේ ය. මුල් සිඳ දැමූ අයෙකුට නම් මේ තත්ත්වය ඇති කර ගත නොහේ. උසස් කලා නිර්මාණයකින් අනිවාර්යයෙන් දේශීයත්වය වහනය වීම අපේක්‍ෂා කෙරේ.

සාහිත්‍ය විචාර ප්‍රදීපිකා    ඒ . වී සුරවීර , 105 පිටුව

වාග් විද්‍යාඥයා හා ව්‍යාකරණඥයාගේ විෂය ක්ෂේත්‍රය වූ භාෂා පොදු විග්‍රහයකින් හඳුනා ගනු ලැබුවේ ද ඔවුන් දෙදෙනා භාෂාව වශයෙන් හඳුනා ගන්නේ ක්ෂේත්‍ර දෙකකි. මෙයින් සාම්ප්‍රදායික ව්‍යාකරණයට අනුව භාෂාව යනු හුදෙක් ලේඛනය වේ. එසේ නැත්නම් ග්‍රන්ථ ව්‍යවහාරයේ දී අනුගමනය කරනු ලබන සිද්ධාන්ත ක්‍රමය යි. වාග් විද්‍යාඥයාගේ කල්පනාවට අනුව මූලික වශයෙන් භාෂාව යනු භාෂණය හෙවත් කටවහරයි. ව්‍යාකරණඥයා භාෂාව වශයෙන් හඳුන්වනු ලබන ග්‍රන්ථ ව්‍යවහාරය භාෂණයේ ම දෙවැනි පිටපතක් ලෙස වාග් විද්‍යාඥයා නිගමනය කරයි. මේ අනුව භාෂාවේ හෙවත් කටවහරේ ඇති ශ්‍රවණ ගෝචර රටා (මුඛ කුහරයෙන් නිකුත් වන ශබ්ද) දෘෂ්ටි ගෝචර රටා බවට පරිවර්තනය කළ මාර්ගය ලේඛනය යි. එසේ හෙයින් වාග් විද්‍යාඥයා ගත්වහරට වඩා සැලකිල්ල යොමු කරන්නේ කටවහරට හෙවත් භාෂණයට යි.



# 13
# විරාම ලක්‍ෂණ

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදේ.

**නිපුණතා මට්ටම** : 4.3 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- භාෂාව නිවැරදි ව භාවිත කිරීමට විරාම ලකුණු පිළිබඳ අවබෝධය අවශ්‍ය බව පෙන්වා දෙයි.
- භාෂාව භාවිතයේ දී විරාම ලකුණු යෙදීමේ වැදගත්කම අවධාරණය කරයි.
- ලේඛන කාර්යයේ දී විරාම ලකුණු මගින් ඉටුවන මෙහෙය පැහැදිලි කරයි.
- විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පෙර සූදානම**

- විරාම ලක්ෂණ පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබා ගන්න.
- ප්‍රයෝගික ලේඛනයේ දී සමාන ලකුණ, ධාතු සූචකය, කාක පාදය, කුණ්ඩලි යන විරාම ලකුණු නිවැරදි ව යොදන ආකාරය පිළිබඳ අවබෝධය ලබා ගන්න.
- සමාන ලකුණ, ධාතු සූචකය, කාක පාදය, කුණ්ඩලිය යන විරාම ලකුණු නිදර්ශන සහිතව යෙදූ පෝස්ටරයක් නිර්මාණය කර ගන්න. (මේ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න.)
- පෙළ පොතෙහි 11 වන පාඩම කියවා අවබෝධයක් ලබා ගන්න.

ප්‍රවේශය

- සමාන ලකුණ, ධාතු සූචකය, කාක පාදය, කුණ්ඩලිය යන විරාම ලකුණු නිදර්ශන සහිතව යෙදූ පෝස්ටරය ප්‍රදර්ශන කරමින් පාඩමට පිවිසෙන්න.
- නොඑසේ නම් විරාම ලකුණු පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසමින් පාඩමට පිවිසීම හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිත කරන්න.

පාඩම සංවර්ධනය

- විරාම ලකුණු  පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසන්න.
- කියවීමේ දී මෙන් ම ලිවීමේ දී ද විරාම ලකුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු බව අවධාරණය කරන්න.

- සමාන ලකුණ, ධාතු සූචකය, කාක පාදය, කුණ්ඩලිය යන විරාම ලකුණු නිදර්ශන සහිත ව ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න.
- පෙළපොතේ විරාම ලක්ෂණ පාඩම කෙරෙහි අවධානය යොමු කරමින් ලේඛනයේ දී භාවිත කරන විරාම ලක්ෂණ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- උගත් විරාම ලක්ෂණ නිවැරදි ව භාවිතයට යොමු කිරීම සඳහා සුදුසු අභ්‍යාසවල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතෙහි 11 වන පාඩම
- ඇමුණුම 1

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය (2015 නව සංස්කරණය)
- සිංහල ලේඛන ව්‍යවහාරය, උපදේශ සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කිරීම
- භාෂාව නිවැරදි ව භාවිත කිරීමට විරාම ලකුණු පිළිබඳ අවබෝධය අවශ්‍ය බව පෙන්වා දීම
- භාෂාව භාවිතයේ දී විරාම ලකුණු යෙදීමේ වැදගත්කම අවධාරණය කිරීම
- ලේඛන කාර්යයේ දී විරාම ලකුණු මගින් ඉටුවන මෙහෙය පැහැදිලි කිරීම
- විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදීම

ඇමුණුම් 1

පද බෙදීමේ ක්‍රියාවලියේ දී බෙහෙවින් අවශ්‍ය වන අංගයක් වන්නේ විරාම ලක්ෂණ යි. විරාමය යනු විවේකය හෙවත් නැවැත්ම යි. වාක්‍යයක අර්ථය වඩාත් පැහැදිලි වන්නේ විරාම ලක්ෂණ නිසි තැන යෙදූ විට ය. එය වැරදි තැන යෙදූ විට වැරදි අර්ථයක් ඉස්මතු වේ. එනිසා විරාම ලක්ෂණ භාවිතය අනිවාර්යෙන් ම අධ්‍යනය කළ යුත්තකි. සිංහල වාක්‍යය නිර්මාණයෙහිලා භාවිත කරන විරාම ලකුණු හතරක් පහත දක්වා ඇත.

**( = ) සමාන ලකුණ**

සමාන අර්ථයක් පවසන, සමාන බවක් හඟවන තැන්වල දී මෙම සලකුණ යොදනු ලබයි.

ගුරු + උතුමා = ගුරුතුමා
දිනි + ඉඳු = දිනිඳු
දෙවියන් විසින් + දෙන ලද්දේ = දෙව්දත්
බුදුන්ගේ + ගුණ = බුදු ගුණ



**( √ ) ධාතු සූචකය**

- ක්‍රියා පදයක නැති නම් ආඛ්‍යාතයක මූලය ධාතුවයි.
- ධාතුවක් පහසුවෙන් හඳුනා ගැනීම සඳහා යොදන සංකේතය ධාතු සූචකයයි.
- මෙය යෙදෙන අවස්ථා දෙකකි.

**ක්‍රියා මූලය හෙවත් ධාතුව දැක්වීමට**

√බල
√නට
√නළව

**ගණිත කාර්යයේ දී වර්ග මූලය දැක්වීමට**

$\sqrt{16} = 4$
$\sqrt{64} = 8$
$\sqrt{81} = 9$

**( ∧ ) කාක පාදය**

- **වාක්‍යයක අකුරක්, පදයක් අඩු වූ විට එය ලියා දැක්වීමට කාක පාදය යෙදේ.**

**විරාම ලකුණු භා∧(වි)තය**
**මණ්ඩ∧(ලි)ය**
**මා ∧(වැනි) බිළින්දා**

**( ෴ ) කුණ්ඩලිය**

- පුස්කොළ පොත්වල ඡේදයක අවසානය දැක්වීමට මෙම ලකුණ භාවිත කොට ඇත.

බුදුරජාණන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය වදාළ සේක. ෴

# 14
# පද බෙදීම

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.4 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පද බෙදීමේ දී අනුගමනය කෙරෙන රීති හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ලේඛනයේ දී නාම පද, ක්‍රියා පද, නිපාත පද වෙන් කොට ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- සන්ධි, සමාස, උපසර්ග වෙන් නො කොට ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- විභක්ති ප්‍රත්‍යය මුල් පදය හා එකතු කොට ලිවිය යුතු බව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- පහත සඳහන් කරුණුවලට අදාළ වාක්‍ය සූදානම් කර ගන්න.
  - නාම පද, ක්‍රියා පද, නිපාත පද ඇතුළත් වාක්‍ය කිහිපයක්
  - උපසර්ගයක් යෙදුණු වචනයක් සහිත වාක්‍යයක්
  - සන්ධි පදයක් යෙදුණු වචනයක් සහිත වාක්‍යයක්
  - සමාස පදයක් යෙදුණු වචනයක් සහිත වාක්‍යයක්
  - විභක්ති ප්‍රත්‍යයක් යෙදුණු වචනයක් සහිත වාක්‍යයක්

**ප්‍රවේශය**

- පෙළපොතේ 12 පාඩම 'පලාලි ගමන' කොටස නිශ්ශබ්දව කියවීමට අවස්ථාව දෙන්න.
- එහි සඳහන් වන සිදුවීම විමසමින් පාඩමට පිවිසෙන්න.

**පාඩම සංවර්ධනය**

- අදාළ පාඩමේ සිදුවීම ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පද බෙදීම නිසි පරිදි සිදු නොවන විට දී අදහස් ව්‍යාකූල වන අයුරු පෙන්වා දෙන්න.
- සූදානම් කර ගත් වාක්‍ය ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- නාම පද, ක්‍රියා පද හා නිපාත වෙන් කොට ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කර දෙන්න.
- උපසර්ග, සන්ධි, සමාස පද වෙන් නොකොට ලිවීම සිංහල ලේඛනයේ පිළිගත් රීතියක් බව පෙන්වා දෙන්න.



- විභක්ති ප්‍රත්‍යයක් යෙදෙන විට එය එක්කොට ලිවීමේ අවශ්‍යතාව ද විස්තර කරන්න.
- පෙළපොතේ 12:1 12:2 12:3 ක්‍රියාකාරකම් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පද බෙදා ලිවීම සඳහා සුදුසු ඡේදයක් කියවන විට ලිවීමේ අභ්‍යාසයක් ලෙස දෙන්න.
- ශිෂ්‍යයින්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරමින් අවශ්‍ය මග පෙන්වීම් කරන්න.
- ශිෂ්‍යයන් නිම කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් අහඹු ලෙස තෝරා ගෙන සාකච්ඡාවක් මෙහෙය වන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතේ 12 පාඩම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පද බෙදීමේ දී අනුගමනය කරන රීති හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- ලේඛනයේ දී නාම පද, ක්‍රියා පද, නිපාත පද වෙන් කොට ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම
- සන්ධි, සමාස, උපසර්ග පද වෙන් නො කොට ලිවීමේ අවශ්‍යතාව වටහා ගෙන ප්‍රකාශ කිරීම
- විභක්ති ප්‍රත්‍ය මුල් පදය හා එකතු කොට ලිවිය යුතු බව ප්‍රකාශ කිරීම
- පද බෙදා ලිවීමේ රීති නිවැරදි ව අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදීම

# 15
# අර්ථාවබෝධය

**නිපුණතාව** : 6.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.1 ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අර්ථය වටහා ගත් බව ප්‍රකට කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- ගද්‍ය හා පද්‍ය නිර්මාණ කියවා සිත්ගත් අවස්ථා උපුටා දක්වයි.
- ගද්‍ය හා පද්‍ය නිර්මාණවල සිත්ගත් අවස්ථා මතකයෙන් ප්‍රකාශ කරයි.
- ගද්‍ය හා පද්‍ය කොටස් කියවා අර්ථය නිවැරදි ව ලියයි.
- අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- තේරවිලි කවියක් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කර ගන්න. ගද්‍ය පද්‍ය කොටස් අර්ථාවබෝධය පහසු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- නියමිත ශ්‍රේණියට ගැළපෙන ගද්‍ය හා පද්‍ය නිර්මාණ කිහිපයක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- ඇමුණුම 1හි සඳහන් කවිය ගායනා කර එහි අර්ථය වැටහේ ද යි ප්‍රශ්න කරමින් හෝ වෙනත් සුදුසු ක්‍රමයකින් පාඩමට ප්‍රවේශයක් ලබා ගන්න.

**පාඩම සංවර්ධනය**

- රසවත් කවියක් හෝ ගද්‍ය කොටසක් කියවීමට ලබා දෙන්න.
- කණ්ඩායම් දෙකකට බෙදා සුදුසු පරිදි ශිෂ්‍යයන් තෝරා ගෙන එක් කණ්ඩායමකට පද්‍යවල දුරවබෝධ වචන ද අනෙක් කණ්ඩායමට ගද්‍ය කොටසේ දුරවබෝධ වචන ද තේරීමට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් ගද්‍ය පද්‍ය කොටස් කිහිපයක අර්ථාවබෝධයට ගැනීමට අවස්ථා උදා කර දෙන්න. ඒ සඳහා ඇමුණුම 2 යොදා ගන්න.



**ගුණාත්මක යෙදවුම්**

- අභ්‍යාසය සඳහා අවශ්‍ය අනිර්දිෂ්ට ඡේද හා කවි
- ඇමුණුම 1 හා ඇමුණුම 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ගද්‍ය හා පද්‍ය කියවා සිත්ගත් අවස්ථා උපුටා දැක්වීම
- ගද්‍ය හා පද්‍ය නිර්මාණවල සිත්ගත් අවස්ථා මතකයෙන් ප්‍රකාශ කිරීම
- ගද්‍ය හා පද්‍ය කොටස් කියවා අර්ථය නිවැරදි ව ලිවීම
- අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලිවීම

ඇමුණුම 1

කුලි වකුළත් මොණ රනරෙක් කලක   වෙතේ
හාමිරකෙක් වටකොලිගෙන් ඉඩ   මසිතේ
ගොටළු බැනෙක් මාරතයෙන් පණි   උඩතේ
වූකි නනත් ගොලතයියා නොණ   තකතේ

තේරුම

වලි කුකුළත් රණ මොනරත් වෙලක   කතේ
මී හරකෙක් කොට වලිගෙන් මඩ   ඉසිතේ
බැටළු ගොනෙක් රා මතයෙන් උඩ   පණිතේ
නාකි උනත් තල ගොයියා තණ   නොකතේ

ඇමුණුම 2

කවි නළුව රඟ දැක්වූයේ එළිමහන් රංග පීඨයක ය. එම රංග පීඨය කරළිය නමින් හැඳින්විණි. කරළිය දෙමළෙන් සිංහලයට එක් කර ගත් පදයෙකි. දෙමළෙහි රංග භූමිය හැඳින්වීම සඳහා භාවිත වන ''කළරි'' යන්න වන පෙර ලිවීමෙන් කරළි යන්න සෑදී ඇත. මෙය තැනුයේ එළිමහන් තැනක පස් හෝ වැලි ගොඩකර කවාකාර ලෙසිනි. මේ රංග භූමිය කවි නළුවෙහි රංග ශෛලිය හා මනා සබඳතාවක් පවත්වන්නේ ය. කුමක් නිසා ද යත් කවි නළුවෙහි පාත්‍රයන් රැඟුම් දැක් වූයේ කරළියෙහි පරික්‍රමණය කරමිනි. පරික්‍රමණය වටයක් ගමන් කිරීම යනුවෙන් ද හැඳින්වේ. මෙසේ කරළියෙහි වටා ගමන් කරමින් රැඟුම් පෑමේදී කරළිය වටා සිටිනා ප්‍රේක්ෂකයන්ට මනා සේ රංගනය නැරඹීමට අවස්ථාව සැලසිනි. ප්‍රේක්ෂකයෝ කරළිය වටා බිම හිඳගෙන රංගනය නැරඹූහ.

**සිංහල කවිනළු සම්ප්‍රදාය ගාමිණී දැළ බණ්ඩාර**

<u>ප්‍රශ්න</u>

(i) කවි නළුව රඟ දැක්වූයේ කොතැනක ද?
(ii) ''කරළි'' යන පදය පැමිණියේ කුමන භාෂාවකින් ද?
(iii) කරළිය තැනුයේ කවර තැනක ද?
(iv) ''පරික්‍රමණ'' යනු කුමක් ද?
(v) පාත්‍රයන් ලෙස හැඳින්වූයේ කවුරුන් ද?

ගී දේවිය කැපකළ දෙවොළකට සම
කුටියක සුවඳ දෙයි කළුවැල් කපුරු දුම
අදනම් නුවර එළියකි මා වෙසෙන ගම
මෙපමණ අලස දවසක් නොදුටුවෙමි මම

**වැස්ස කවි පන්තිය**

<u>ප්‍රශ්න</u>

(i) දේවාලයකට සම කර ඇත්තේ කුමක් ද?
(ii) නුවර එළියක් ලෙස සලකන්නේ කවරක් ද?
(iii) කවියාට කම්මැළි කම දනුණු බව හැඟවෙන්නේ කෙසේ ද?
(iv) ''කුටිය'' යන පදයට සමානාර්ථ පදයක් ලියන්න.
(v) 'අලස' යන පදයට විරුද්ධාර්ථ පදයක් ලියන්න.



# 16
# ප්‍රාදේශීය භාෂා

**නිපුණතාව** : 03. භාෂා ක්‍රියාකාරකම් මගින් වාග්මාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයේ දී උචිත පරිදි භාවිතයට ගනියි.

**නිපුණතා මට්ටම්** : 3.1 ප්‍රාදේශීය භාෂා විෂමතා හඳුනා ගෙන භාෂා භාවිතයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- විවිධ ප්‍රදේශ අනුව භාෂාවේ විෂමතා පවතින බව ප්‍රකාශ කරයි.
- ප්‍රාදේශීය ජන වහර හා පොදු ජන වහරෙහි වෙනස්කම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ප්‍රාදේශීය ජන වහර, භාෂාව ඉගෙනීමේ දී වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.
- තෝරා ගත් ප්‍රාදේශිය ජන වහර පද කිහිපයක් සඳහා සම්මත වහරේ යෙදෙන පද ලියා දක්වයි.

**පාඩම් සැලසුම් තිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර පිළිබඳ පොතපත කියවා අවබෝධයක් ලබා ගන්න.
- ඇමුණුම 1 ශිෂ්‍යයන්ට බෙදා දීමට අවශ්‍ය පත්‍රිකා සූදානම් කර ගන්න.
- පරිමිත භාෂා ව්‍යවහාර, සංස්කෘතියට අදාළ පින්තූර /ඡායාරූප කිහිපයක් ප්‍රදර්ශනය කිරීමට සූදානම් කර ගන්න.

නිදඃ
- ධීවර භාෂාව
- කමත් භාෂාව
- පතල් භාෂාව
- වැදි ජන වහර

**ප්‍රවේශය**

- ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරයේ පවතින පද කිහිපයක් ශිෂ්‍යයන් වෙත ප්‍රකාශ කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
- එම ප්‍රාදේශිය භාෂා ව්‍යවහාර පද සම්මත සිංහලයෙහි භාවිත වන ආකාරය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය**

- ''කට වහර, ගත් වහර, ජන වහර හා වියත් වහර'' යන ප්‍රභේද පැහැදිලි කරන්න.
- තමන් දන්නා විවිධ ප්‍රදේශවල භාෂා ව්‍යවහාරවලට අයත් පද කිහිපයක් ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

- දිගාමඩුලු ජන වහර
- පානම ජන වහර
- නුවර කලාවිය ජන වහර
- බස්නාහිර ජන වහර

(ඇමුණුම 1 යොදා ගන්න)

- විවිධ ප්‍රදේශවල බස් වහර භාවිත කර ලියා ඇති පොතපත කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පෙළපොතේ දක්වා ඇති විවිධ ප්‍රදේශවල ප්‍රාදේශීය ජනවහර වෙන් වෙන් වශයෙන් කාඩ්පත්වල ලියා කණ්ඩායම් වශයෙන් හෝ උචිත ක්‍රමයකට ඉදිරිපත් කිරීමටත් කාඩ්පත් හුවමාරු කර ගැනීමටත් අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් දන්නා අමතර ජනවහර පද එක් රැස් කරමින් සාකච්ඡාවකට බඳුන් කර සමාලෝචනයක යෙදෙන්න.
- පෙළපොතේ සඳහන් ක්‍රියාකාරකම්වල යොදවන්න.
- ශිෂ්‍යයන් විසින් කරන ලද අභ්‍යාස පරීක්ෂා කර ප්‍රතිපෝෂණය හා මග පෙන්වීම් ලබා දෙන්න.

**මූලික වදන් හා සංකල්ප**

- ප්‍රාදේශීය ජනවහර : ''ප්‍රාදේශීය වශයෙන් විවිධතා පවතින ප්‍රදේශවල තම ප්‍රදේශයට ආවේණික දීර්ඝ කාලයක් පුරා ව්‍යවහාර කළ භාෂා රටා සමුදාය වේ''

- පොදු ජන වහර : ''බොහෝ පිරිසක් විසින් පොදුවේ ව්‍යවහාර කරනු ලබන භාෂා ව්‍යවහාරය වේ''

**ගුණාත්මක යෙදවුම්**

- ප්‍රාදේශීය ජනවහර - පියසේන කහඳගම
- සිංහල ජනවහර - ජේ.බී දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විවිධ ප්‍රදේශ අනුව භාෂාවේ විෂමතා පවතින බව ප්‍රකාශ කිරීම
- ප්‍රාදේශීය ජන වහර හා පොදු ජන වහරෙහි වෙනස්කම් හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- ප්‍රාදේශීය ජන වහර, භාෂාව ඉගෙනීමේ දී වැදගත් වන ආකාරය පැහැදිලි කිරීම
- තෝරා ගත් ප්‍රාදේශීය ජන වහර පද කිහිපයක් සඳහා සම්මත වහරේ යෙදෙන පද ලියා දැක්වීම



ඇමුණුම 1

**දිගාමඩුලු ජන වහර**

| | |
|---|---|
| 01 කිරි අම්මා | - මවගේ මව |
| 02 පෝඩියාරේ | - පොහොසතා |
| 03 කුංචා | - බළලා |
| 04 ගොබිලා | - තරුණයා |
| 05 සහේ ගන්නවා | - විවාහ වෙනවා |
| 06 ගොන් කවඩියා | - මයිනා |
| 07 මල් බැත්තා | - සමනලයා |
| 08 ටොම්බ | - වලිගය |

**පානම ජන වහර**

| | |
|---|---|
| 01 කැටා | - බල්ලා |
| 02 තෙයියා | - කුරුල්ලා |
| 03 බැඳි පනික්කියා | - දඩයක්කාරයා |
| 04 කඩ ගැහෙනවා | - අතරමං වෙනවා |
| 05 පුධුක්කුවෝ | - කපටියෝ |
| 06 හිංගලයා | - මෝඩ ගැමියා |
| 07 මට්ටයා | - මරක්කලයා |
| 08 කිලයියා | - හඳ |

**නුවර කලාවියේ ජන වහර**

| | |
|---|---|
| 01 බක්කා | - අයියා |
| 02 වාහේ | - සැමියා |
| 03 අවඩි | - බිරිඳ |
| 04 මෝලංගිරියා | - හිතුවක්කාරයා |
| 05 වැහි බිජු | - වැහි වලාකුළු |
| 06 සාර සුභාව | - සිහි කල්පනාව |
| 07 නිංගිරාව | - අපහාසය |
| 08 මහ එකා | - වල් අලියා |

**බස්නාහිර ජන වහර**

| | |
|---|---|
| 01 ටැන්ටුකරත්තය | - බක්කි කරත්තය |
| 02 කැන්දන් යාම | - මනාලිය කැටුව යාම |
| 03 අන්දබීතෙ | - වැහි අඳුර |
| 04 කොටහලු වීම | - මල්වර වීම |
| 05 සබුක්කුව | - බැටන් පොල්ල |
| 06 සරක්කු | - තුනපහ |
| 07 පොක්කඩේ | - සියල්ල ම |
| 08 ගිනිවිජ්ජුම්බරය | - විනාශය |

# 17
# ප්‍රායෝගික ලේඛන
## (ආකෘති පත්‍ර සකස් කිරීම)

**නිපුණතාව** : 5.0 ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.1 දෛනික කාර්යයන්හි දී ප්‍රායෝගික ලේඛනයේ යෙදේ.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- ආකෘති පත්‍රවල ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රායෝගික අවශ්‍යතා අනුව විවිධ ආකෘති පත්‍ර නිර්මාණය කරයි.
- අවස්ථෝචිත ව විවිධ ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කරයි.
- ප්‍රායෝගික ජීවිතයේ දී ඕනෑම අවශ්‍යතාවකට අදාළ වන ආකෘති පත්‍රයක් සකස් කර එය නිවැරදි ව සම්පූර්ණ කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

**(ආකෘති පත්‍ර)**

- ආකෘති පත්‍රවල ආදර්ශන කිහිපයක් එකතු කරගන්න. (ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමට අදාළ තොරතුරු පත්‍රිකා කිහිපයක් ද සහිතව)
- විවිධ අවශ්‍යතා අනුව යොදා ගැනෙන ආකෘති පත්‍රවල අන්තර්ගතය හා ක්‍රමවේද පිළිබඳ ව අවබෝධයක් ලබා ගන්න.

**ප්‍රවේශය**

- ආකෘති පත්‍රවල ආදර්ශන කිහිපයක් ශිෂ්‍යයන් වෙත ප්‍රදර්ශනය කරන්න.
- එදිනෙදා ජීවිතයේ දී සම්පූර්ණ කිරීමට සිදුවන විවිධ ආකෘති පත්‍ර පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය**

- ආකෘති පත්‍රයක අන්තර්ගත විය යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ ව ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- ආකෘති පත්‍රයක නිවැරදි ව්‍යුහය හඳුනා ගැනීමට ශිෂ්‍යයන් යොමු කර ඒ ඇසුරින් එහි ප්‍රමිතිගත ක්‍රමවේද පිළිබඳව පැහැදිලි කරන්න.
- ආකෘති පත්‍රයක ආදර්ශනයක් ශිෂ්‍යයන්ට ලියා ගැනීමට පවරා එය සම්පූර්ණ කිරීමට අදාළ "තොරතුරු පත්‍රිකාවේ" ඇතුළත් උපදෙස් නිවැරදි ව පරිශීලනය කළ යුතු ආකාරය පහදා දෙන්න.
- පෙළපොතේ සඳහන් ආකෘති පත්‍ර පාඩමට අදාළ ව ඇති අභ්‍යාස ඇසුරින් තවදුරටත් ශිෂ්‍යයන් ක්‍රියාකාරකම්වල යොදවන්න.
- ශිෂ්‍යයන් සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර පරීක්ෂා කරන්න.
- ආකෘති පත්‍ර පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.



**ගුණාත්මක යෙදවුම්**

- ආකෘති පත්‍රයක් /ගැසට් පත්‍රයක ඇතුළත් ආකෘති පත්‍රයකට අදාළ තොරතුරු පත්‍රිකාවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ආකෘති පත්‍රවල ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- ප්‍රායෝගික අවශ්‍යතා අනුව විවිධ ආකෘති පත්‍ර නිර්මාණය කිරීම
- අවස්ථෝචිත ව විවිධ ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කිරීම
- ප්‍රායෝගික ජීවිතයේ දී ඕනෑම අවශ්‍යතාවකට අදාළ වන ආකෘති පත්‍රයක් සකස් කර එය නිවැරදි ව සම්පූර්ණ කිරීම

# 18
# ප්‍රායෝගික ලේඛන
## (න්‍යාය පත්‍ර සකස් කිරීම)

**නිපුණතාව** : 5.0 ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.2 දෛනික කාර්යයන්හි දී ප්‍රායෝගික ලේඛනයේ යෙදේ.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- න්‍යාය පත්‍රවල අන්තර්ගතය, ප්‍රමිතිය හා ක්‍රමවේද පිළිබඳ ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රායෝගික අවශ්‍යතා අනුව විවිධ න්‍යාය පත්‍ර සකස් කරයි.
- විවිධ අවශ්‍යතා සඳහා න්‍යාය පත්‍ර සකස් කර, න්‍යාය පත්‍රානුකූල ව විවිධ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරයි.
- ප්‍රායෝගික ජීවිතයේ දී ඕනෑම අවශ්‍යතාවකට අදාළ වන න්‍යාය පත්‍රයක් සකස් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- න්‍යාය පත්‍රවල ආදර්ශන කිහිපයක් එකතු කරගන්න. (ඇමුණුම 1)
- විවිධ අවස්ථා සඳහා යොදා ගන්නා න්‍යාය පත්‍රවල කාලය හා වැඩසටහන සම්බන්ධ වන ආකාරය පිළිබඳ ව පූර්ණ අවබෝධයක් ලබා ගන්න.

**ප්‍රවේශය**

- න්‍යාය පත්‍ර ආදර්ශනයන් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
- එදිනෙදා ජීවිතයේ සංවිධානය කරන විවිධ උත්සව හා වැඩසටහන් පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් න්‍යායපත්‍රානුකූල ව ඒවා සංවිධානය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය**

- න්‍යාය පත්‍රයක "කාලය හා විවිධ වැඩසටහන්" අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න.
- න්‍යාය පත්‍රයක අන්තර්ගත විය යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ ව පැහැදිලි කරන්න.
- න්‍යාය පත්‍රයක් නිර්මාණාත්මක ව ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දී එය නිවැරදි ව හා නිරවුල් ව ලියා ඇත් දැයි පරීක්ෂා කරන්න.



- ලියන ලද න්‍යාය පත්‍ර පරීක්ෂා කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- න්‍යාය පත්‍රයක ආදර්ශන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- න්‍යාය පත්‍රවල අන්තර්ගතය, ප්‍රමිතිය හා ක්‍රමවේදය පිළිබඳ ව හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- ප්‍රායෝගික අවශ්‍යතා අනුව විවිධ න්‍යාය පත්‍ර සකස් කිරීම
- විවිධ අවශ්‍යතා සඳහා න්‍යාය පත්‍ර සකස් කර, න්‍යායපත්‍රානුකූල ව විවිධ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම
- ප්‍රායෝගික ජීවිතයේ දී ඕනෑම අවශ්‍යතාවකට අදාළ වන න්‍යාය පත්‍රයක් සකස් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම

ඇමුණුම : 1

**ජයහිරුගම විජයරූපාරාම දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය**
**න්‍යාය පත්‍රය**

| | | |
|---|---|---|
| 1. | පෙ.ව. 9.00 | විරාගත පොල්තෙල් පහන දැල්වීම |
| 2. | පෙ.ව. 9.15 | පංචශීලයේ පිහිටුවීම |
| 3. | පෙ.ව. 9.30 | දහම් පාසල් ගීය සහ පූජා නර්තනය |
| 4. | පෙ.ව. 9.45 | පිළිගැනීමේ කතාව හා අරමුණ පැහැදිලි කිරීම<br>(ප්‍රධානාචාර්ය පූජ්‍ය දම්පහළ ඥානරතන හිමිපාණෝ) |
| 5. | පෙ.ව. 10.00 | "දේශාභිමානී ගී පොකුර"<br>(ප්‍රාථමික අංශය) |
| 6. | පෙ.ව. 10.15 | ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය<br>(ප්‍රාථමික අංශය) |
| 7. | පෙ.ව. 10.25 | ආරාධිත විශේෂ දේශනය<br>(අතිපූජ්‍ය හඟුරන්කෙත ඥානවිමල හිමිපාණෝ) |
| 8. | පෙ.ව. 11.00 | වෙස්සන්තර නාට්‍යය |
| 9. | පෙ.ව. 11.30 | ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය<br>(ද්විතීය අංශය) |
| 10. | දහවල් 12.00 | නිර්මාණාත්මක නර්තනය<br>(ද්විතීය අංශය) |
| 11. | ප.ව. 12.15 | ත්‍යාග ප්‍රදානය (සුවිශේෂ අංශ සඳහා) |
| 12. | ප.ව. 12.30 | ස්තුති කතාව |
| 13. | ප.ව. 12.45 | ජාතික ගීය ගායනය හා වැඩසටහන් නිමාව |

# 19
# සාහිත්‍ය රසාස්වාදය

**නිපුණතාව** : 8.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 සාහිත්‍ය මූලධර්ම ඇසුරින් ගද්‍ය පද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි.

: 8.2 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසඥතාව වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- වාච්‍යාර්ථ සහ ව්‍යංග්‍යාර්ථ යන පාරිභාෂික පද නිර්වචනය කරයි.
- සාහිත්‍ය නිර්මාණ රස විඳීමේ දී ගද්‍ය හා පද්‍ය අතර වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- රසභාව පිළිබඳ මූලික න්‍යාය අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
- රසඥතා වර්ධනය සඳහා රසපූර්ණ නිර්මාණ භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි.
- රසවත් නිර්මාණවල අන්තර්ගත කරුණු හඳුනා ගෙන රස විඳ ජීවිත පරිඥානය සඳහා භාවිත කරයි.
- ප්‍රශස්ත ගී, කාව්‍ය, නාට්‍ය, සංවාද ආදියට සවන් දීම රසඥතා වර්ධනයට හේතු වන බව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සාහිත්‍ය රසාස්වාදයට අදාළ ව ලියැවුණු පොත පත පරිශීලනය කරන්න.
- කාව්‍යයන්හි අර්ථ රසය හා ශබ්ද රසය අතර වෙනස පිළිබඳ අවබෝධයක් ලබා ගන්න. කාව්‍ය රචකයා සිය කවි රස ගැන්වීම සඳහා යොදා ගන්නා ප්‍රයෝග පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.
- නව නළු රස හා කාව්‍ය උපක්‍රම ඇසුරින් කවි රස විඳින්නේ කෙසේ ද?, යන්න පිළිබඳ ව අවබෝධයක් ලබා ගන්න. සාහිත්‍ය නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කර ගන්න. (ඇමුණුම 1 යොදා ගන්න.)
- සාහිත්‍ය නිර්මාණ සාර්ථක වීම කෙරෙහි යොදා ගත් උපක්‍රම පිළිබඳ ව දැනුවත් වන්න.
- නිර්දිෂ්ට කෘතිවලින් රසවත් කවියක් හෝ ගද්‍ය කොටසක් තෝරා රැගෙන එන ලෙස ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.

**ප්‍රවේශය**

- රසවත් කවියකින් පාඩමට ප්‍රවේශ වන්න. (ඇමුණුම 1)
- එම කවියේ අර්ථය පැහැදිලි කරමින් ශබ්ද රසය, ව්‍යංගාර්ථ හා එහි අන්තර්ගත අර්ථ රසය පිළිබඳ ව ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන් තෝරා ගෙන ආ ගද්‍ය පද්‍ය කොටස් කිහිපයක් රසවින්දනය කරන්න.

**පාඩම සංවර්ධනය**



- ''නව නළු රස'' භාවයන් පිළිබඳ ව ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න - ඒ සඳහා ඇමුණුම 1 යොදා ගන්න.
- විශිෂ්ට පද්‍ය නිර්මාණයක, ශබ්ද රසය පමණක් නොව අර්ථ රසය හා ව්‍යංග්‍යාර්ථය වැනි විවිධ කාව්‍යෝපක්‍රම ද ඇතුළත් විය යුතු බව පහදන්න.
- කාව්‍ය රචකයා සිය ප්‍රබන්ධය රස ගැන්වීම සඳහා අනුගමනය කරන ප්‍රයෝග 4 පැහැදිලි කරන්න.
    - කාව්‍යමය භාෂාවක් යොදා ගැනීම
    - අලංකාරොක්ති භාවිතය
    - කවි සමයේ එන යෙදුම් භාවිතය
    - සිය අත්දැකීම් උපයෝගී කර ගැනීම
- නව නළු රස භාවයන් පිළිබඳ ව පෙළපොතේ කවි ඇසුරින් හෙළිවන කාව්‍ය උපක්‍රම පිළිබඳ ව පහදන්න.
- එම කරුණු ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දී ඒවා රස විඳින ආකාරය පහදා දෙන්න.
- විවිධ කාව්‍යෝපක්‍රම යොදා ගෙන ශිෂ්‍යයන් හා ඒවා රස විඳින්න.
- ගද්‍ය හා පද්‍ය නිර්මාණ සකස් කර ඒවා බිත්ති පුවත්පතකට යොදා ගැනීමට ශිෂ්‍යයන්ට පවරන්න.
- අපේක්ෂිත නිපුණතා මට්ටමට නොපැමිණි ශිෂ්‍යයන් සඳහා ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සාහිත්‍යය - අශෝක කරුණාරත්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- වාච්‍යාර්ථ සහ ව්‍යංග්‍යාර්ථ යන පාරිභාෂික පද නිර්වචනය කිරීම
- සාහිත්‍ය නිර්මාණ රස විඳීමේ දී ගද්‍ය හා පද්‍ය අතර වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- රසභාව පිළිබඳ මූලික න්‍යායන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කිරීම
- රසාඥතා වර්ධනය සඳහා රසපූර්ණ නිර්මාණ භාවිත කළ යුතු බව ප්‍රකාශ කිරීම
- රසවත් නිර්මාණවල අන්තර්ගත කරුණු හඳුනා ගෙන රස විඳ ජීවිත පරිඥානය සඳහා භාවිත කිරීම
- ප්‍රශස්ත ගී, කාව්‍ය, නාට්‍ය, සංවාද ආදියට සවන් දීම රසඥතා වර්ධනයට හේතුවන බව ප්‍රකාශ කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සාහිත්‍ය විචාර චින්තාවලී - කේ. ජයතිලක

**ඇමුණුම 01**

## නවනළු රස

ඉපැරණි භාරතීය නාට්‍ය විචාරවාදියකු වූ භරතමුනි පඬිවරයා නාට්‍ය නිර්මාණයක ''රස'' නව ආකාරයකින් පැහැදිලි කොට ඇත. කවර හෝ සාහිත්‍ය නිර්මාණයකට වුව ද මෙම නව නළු රස අදාළ වේ.

'' ශෘඞගාර හාස්‍ය කරුණ  
රෞද්‍ර වීර භයානකඃ  
බීභත්සාද්භූත ශාන්තවා  
රසා නව සමීරිතාඃ ''

| | භාවය | රසය |
|---|---|---|
| 01 | රති | ශෘංගාර රසය |
| 02 | හාස | හාස්‍ය රසය |
| 03 | ශෝක | කරුණ රසය |
| 04 | ක්‍රෝධ | රෞද්‍ර රසය |
| 05 | උත්සාහ | වීර රසය |
| 06 | භය | භයානක රසය |
| 07 | ජුගුප්සාව | බීභත්ස රසය |
| 08 | විස්ම | අද්භූත රසය |
| 09 | ශාන්ත | ශාන්ත රසය |

**01 ශෘංගාර රසය**

ඇතැම් සාහිත්‍ය නිර්මාණවල ශෘංගාර රසය දක්නට ලැබේ. පසිඳුරන් මුල්කොට ගන්නා භාවයන් අතර නැවත නැවත රස විඳින්නට ,පහස ලබන්නට ආශාවක් සිතෙහි හටගන්නේ, ශෘංගාර රසය හේතුවෙනි.

පියයුරු කිණිහිර කැකුළෙක    අන්දම්  
දසනග රැස් වැනි ගෙළ දෑ සමන්    දම්  
ළෙලවන කොමළ'ත් පැහැසර    රන්දම්  
අඟනන් දුට නොතිබේ තවුස්    දම්

**(පරෙවි සන්දේශය)**

**02 හාස්‍ය රසය**

කිසියම් සාහිත්‍ය නිර්මාණයක් පරිශීලනයේ දී පාඨකයාගේ සිත්හි සිනහව, විනෝදය උපදවයි නම් එය හාස්‍ය රසයෙන් යුක්ත වූවකි.

අඳ මව්පිය    දෙදෙන  
ඔහු වයන බව නොම    දැන  
කතී වෙණ    මීයෙන  
සූ සූ යැයි අත ගැසූ    සැකයෙන

**(ගුත්තිල කාව්‍යය)**

**03 කරුණ රසය**



කිසියම් නිර්මාණයක් රසවිඳීමේ දී නිර්මාණකරුවා වර්ණනා කරන සිදුවීම පිළිබඳ සහෘදයා තුළ සංවේදී බවක් ඇතිකරවයි නම්, එය කරුණ රසයෙන් යුතු වූ නිර්මාණයකි.

වම් ඇලයට වැටී ගති ඒ    වැළහින්න  
මම කෑ ගැසිමි කඩියට වෙඩි    නොතියන්න  
දඟලන අතර ඈ තැතිගෙන    නැගිටින්න  
දුක්මුසු ලෙසින් හැඬුවා පොඩි දරු    දෙන්න

**(වලස් දඩයම - විමලරත්න කුමාරගම)**

**04 රෞද්‍ර රසය**

කිසියම් සාහිත්‍ය නිර්මාණයක් රසවින්දනයේ දී අප සිත්හි කෝපයක්, තරහවක්, ක්‍රෝධයක්, හට ගනියි නම් එය රෞද්‍ර රසය ජනනය කරන නිර්මාණයකි.

මගෙ කුකුළා නැසූ    එකා  
දදය ඔබගෙ පාළු ය    කා  
තව එක බුද දිනක් ත    කා  
ඉන්නට ඉඩ නො දී ම    කා

බලා    එල්ල  
හෙළුව    හෙල්ල  
මුලැ මැ    බෙල්ල  
මරු තැනේ

**(කුකුළු හැවිල්ල - රැපියල් තෙන්නකෝන්)**

**05 වීර රසය**

කිසිවෙකුගේ වීරත්වය, එඩිතර බව හා පසු නොබසින බව පිළිබඳ ව යම්කිසි කාව්‍ය නිර්මාණයකින් සහෘද මනසෙහි ද ආස්වාදයක් ජනිත කෙරේ නම්, එය වීර රසය ලෙස හැඳින්වේ.

බලව් පොළොන්නරු අනුරාපුර    පෙදෙස  
සිතවු පැවති නිදහස මින් පෙර    දවස  
නගවු තව තවත් තිරසර තරුණ    ගොස  
වරෙව් යමව් නැගිටිව් නොපියව්    දෙඇස

**(එස්-මහින්ද හිමි)**

**06 භයානක රසය :**

කිසියම් සාහිත්‍ය නිර්මාණයක් පරිශලනයේ දී රසික හදවත් තුළ කිසියම් බිය මුසු හැඟීමක් ජනිත කරවයි ද, එය භයානක රසයෙන් යුතු වූ නිර්මාණයකි.

උපනොත් පේත වැ පව් කොට    නොපනත්  
කලෙකත් නොලැබෙයි සෙම් සොටු    පමණත්  
උගුරත් නොතෙමෙයි සුරගඟ    වැටුණත්  
කලෙකත් පින් නොකළැකි මැයි    සිතුණත්

**(ලෝවැඩ සඟරාව)**

**07 බීභත්ස රසය**

ජුගුප්සාව හෙවත් පිළිකුළ තුළින් ද සාහිත්‍යකරුවා රසයක් දකියි ඒ අනුව නිර්මාණයක් රස විඳීමේ දී රසික සිත් සතන්හි ජනිත වන ජුගුප්සාව (පිළිකුළ) බීභත්ස රසය ලෙස හැඳින්වේ.

මා වැනියෙකුට තද සංවේගය ම　　දිදි
හැමදා උදේ ඔහු මගෙ වැසිකිළිය　　අදි
හදිසියෙ යමකු මළහොත් දොස්තරද　　වදි
අප ඉදිරියේ ඔහු මළකුණ කපන　　ලදි

**(හේරත් හාමි - විමලරත්න කුමාරගම)**

**08 අද්භූත රසය**

සාහිත්‍යයේ දී සහෘදයා තුළ පුදුමයක් හෙවත් විස්මයක් ජනිත කරවනුයේ අද්භූත රසය තුළිනි.

මනමත් කරවන දන මුළු　　දෙරණා
රසවත් වෙණ නද නද　　කරනා
සවනොත් සඳ පුරගන ලොබ　　දියුණා
නොදනිත් දරුවන් ඇකයෙන්　　වැටුණා

**(ගුත්තිල කාව්‍යය)**

**09 ශාන්ත රසය**

සහෘද මනස තුළ ශාන්තිය,නිවීම,සංසුන් බව,සැහැල්ලු බව ඇති කරන්නේ ශාන්ත රසය මගිනි.

සසරින් මුදා ලොව් සදහම් අමා　　දී
එකඟින් මුනිඳුහුන් වැනි නිරපමා　　දී
ලකුණින් සපිරි පිළිමය දැක සමා　　දී
වැදගන් මිතුර තුන් සිත කර සමා　　දී

**(සැළලිහිණි සන්දේශය)**

**20**



# සාහිත්‍ය විචාර මූලධර්ම

**නිපුණතාව** : 12.0 සාහිත්‍ය රසාස්වාදයට හා විචාරයට අදාළ මූලික ඉගැන්වීම් පිළිබඳ ව අවබෝධය ලබා භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 12.1 මූලධර්මවලට අනුව ගද්‍ය පද්‍ය කොටස් පරිශීලනය කරමින් රස විඳියි.

: 12.2 මූලධර්මවලට අනුව ගද්‍ය පද්‍ය විග්‍රහ කරමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- විචාර මූලධර්ම පිළිබඳ ව අවබෝධය ලබාගැනීම රසඥතාව වර්ධනය සඳහා උපකාර වන බව ප්‍රකාශ කරයි.
- රස සංකල්පය පිළිබඳ ව සරල ව අදහස් දක්වයි.
- නිර්දිෂ්ට පාඩමෙහි ඇතුළත් විචාර ලක්ෂණ ඉදිරිපත් කරයි.
- විචාර මූලධර්මවලට අනුව ගද්‍ය පද්‍ය කොටස් රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සාහිත්‍ය නිර්මාණ විචාර පිළිබඳ තොරතුරු ඇතුළත් පොතපත කියවා අවබෝධයක් ලබා ගන්න.
- කවිය පිළිබඳ නිර්වචන කිහිපයක් එක් රැස් කර ගන්න.
- විවිධ කාව්‍යෝපක්‍රම පිළිබඳ ව තොරතුරු කියවා ඒ සඳහා අදාළ නිදසුන් අවබෝධ කර ගන්න. ඒ සඳහා (ඇමුණුම 1) යොදා ගන්න.

**ප්‍රවේශය**

- ''කවිය'' පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කරමින් පාඩමට පිවිසෙන්න. (පෙළපොතේ කවිය පිළිබඳ සඳහන් නිර්වචන යොදා ගන්න.)
- සාහිත්‍ය විචාරය යනු කුමක් දැ යි සරල ව පැහැදිලි කර දෙන්න.
- සාහිත්‍ය විචාරයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරන්න. ඒ සඳහා (කාව්‍යෝපක්‍රම ඇමුණුම 1) යොදා ගන්න.

**පාඩම සංවර්ධනය**

- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කිරීම හෝ විකල්ප ක්‍රමයක් අනුගමනය කරන්න.
- පෙළපොතෙහි නිර්දිෂ්ට පාඩමෙහි ඇතුළත් විචාර ලක්ෂණ යටතේ නිදසුන් ගොනු කරන ලෙස ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.

නිදසුන් : කාව්‍ය භාෂාව, සංකල්ප රූප, පරිකල්පන ශක්තිය, ශබ්ද ධ්වනිය, හැඟීම් දැනවීම, චින්තනය ,කාව්‍ය ආකෘතිය

- ගොනු කරගත් ලක්‍ෂණ හා ගද්‍ය පද්‍ය නිදසුන් පන්තියට ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසා දෙන්න.
- ඉදිරිපත් කළ ශිෂ්‍ය ප්‍රතිචාර තොරතුරු ඇසුරු කර ගෙන එම විචාර ලක්‍ෂණ පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- සාහිත්‍ය රසය අර්ථකථනය කර දක්වන්න. (ඇමුණුම 1)
- පෙළපොතෙහි ශිෂ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ව කෙටි විචාරයක් ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය කොටසකට විචාරයක් ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සාහිත්‍යය - අශෝක කරුණාරත්න
- සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය - නිවන්දම ධර්මකීර්ති හිමි (ප්‍රස්තාවනාව)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විචාර මූලධර්ම පිළිබඳව අවබෝධය ලබා ගැනීම රසඥතාව වර්ධනය සඳහා උපකාර වන බව ප්‍රකාශ කිරීම
- රස සංකල්පය පිළිබඳව සරල ව අදහස් කිරීම
- නිර්දිෂ්ට පාඩමෙහි ඇතුළත් විචාර ලක්‍ෂණ ඉදිරිපත් කිරීම
- විචාර මූලධර්මවලට අනුව ගද්‍ය පද්‍ය කොටස් රස විඳිමින් විචාරය කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සාහිත්‍ය විචාර චින්තාවලී - කේ ජයතිලක

ඇමුණුම 1

**සාහිත්‍ය රසාස්වාදය හා විචාරය**

නිර්මාණකරුවා විසින් භාෂාව විචිත්‍ර ලෙසත් සුන්දර ලෙසත් යෙදූ කළ මැවෙන්නේ සාහිත්‍යයයි. එසේ ම සිත්හි රසවත් හැඟුම් ජනිත කිරීමට සාහිත්‍ය සමත් වෙයි. සෞන්දර්යය හා මුසු වූ පූර්ණ මිනිස් ජීවිතයකට ඉන් ලැබෙන්නේ සුවිසල් මෙහෙයකි. ඒ සුවිසල් මෙහෙය සාහිත්‍යයෙන් ලබන්නට නම් එය මනාව අවබෝධ කර ගෙන රස විඳිය යුතු ය.

සාහිත්‍ය විචාරය කිරීමට නම් එය මනාව රස විඳිය හැකි ක්‍රමවේදයන්, ප්‍රමිතීන් තිබිය යුතු ය, ඒ අනුව සාහිත්‍ය විචාර මූලධර්ම ලෙස ඒවා හැඳින් වේ. කෙනෙකු ලද රසවත් අත්දැකීමක්, වචන මාර්ගයෙන්, වඩාත් රසවත් ලෙස අපූර්වාකාරයකින් පාඨකයා වෙත ගෙන ඒම සාහිත්‍ය නිර්මාණයක් වන අතර එය මනාව විඳ ගැනීමෙන් පසුව ඒ පිළිබඳ ව සිය අදහස තර්කාන්විත ව හා විචිත්‍රවත් ව විමර්ශනය කිරීම සාහිත්‍ය විචාරයට අයත් වෙයි.



සාහිත්‍ය විචාරය කිරීමේ දී මූලික ප්‍රභේදයක් ලෙස ''අර්ථ රසය'' හා ''ශබ්ද රසය'' හැඳින්විය හැක. විවිධ කාව්‍යෝපක්‍රම ඇසුරෙන් සාර්ථක වූත්, අර්ථවත් වූත්, රසවත්වූත් පද්‍යයක් බිහිවෙයි. එය ගද්‍ය හා පද්‍ය ලෙසත් සදැස්, නිසැදැස් යන ආකෘතීන් දෙක ඇසුරෙනුත් නිර්මාණය වෙයි.

රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක්වන ලෙසේ වෙණ නාද නූ පා තබ තබා
කම් පසේ දෙන සර ලෙසේ දෙස බල බලා නෙතඟින් සබා
මම් කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රඟ සොබා

**(ගුත්තිල කාව්‍යය)**

දේදුන්න පායාවී හෙටත් පාලම උඩින්
ඔබ නැතත් මම එතැන පාට හත ගණින්නම්
ඔබ යන්න හැරී නොබලා ඔබේ කිරුළ ගෙන
පරාජිත කඳුළකට ඇසේ ඉඩ තියා නැත

**(දේදුන්න පායාවී හෙටත් පාලම උඩින්)**

''සිටු දුවණියෝ ද දෙවන දවස් කිලුටු අදහස් සේ ම කිලුටු රෙද්දක් කොයින්දෝ සොයා ගෙන හැඳගෙන මිඩියන්ගේ ලෙසට ලිහිල් කොට හිසකේ බැඳගෙන, රැ දෙවරු වී පැහැරියා සේ ඇඟ මුළුල්ලෙහි ධූලි ගාගෙන, කළයක් හැරගෙන පැනට යන කෙල්ලක මෙන් කෙල්ලන් හා එක් ව ගෙන් පිටත් ව මිඩි වෙස් ගත් ලෙසට කොල්ලා සිටි තැනට ගියහ-''

**පටාචාරා වස්තුව- සද්ධර්මරත්නාවලිය**

ලකල පුළුලුකුළ බැඳ මිණිමෙවුල්ලා
සමග රන් සළඹ රැවු දී වෙවුල්ලා
වයන පදට තබමින් පද කමල්ලා
රඟන ළඳුන් බල රූසිරි සියල්ලා

**සැලළිහිණි සන්දේශය**

චන්ද්‍රමණ්ඩලේ සැතපුණ පුංචි සාවියේ
මන්ද කියාපන් නො කියා හැංගිලා ගියේ-----
පාන නිවුණු සේ පාළුයි ලැයිම් කාමරේ
මන්ද නුඹ ගියේ කියපන් පුංචි සාවියේ-----

ලාබ රත්තරං දිලිසෙන පාළු වීදියේ
ගැනු ළමයි පියාඹලා ඉස්සරත් ගියේ-----
උන්ට සෙයිලමේ මඟතොට පාර වැරදුණේ
අන්න ඒ නිසයි මට දුක රත්තරන් දුවේ-----

මාල බැඳන් සුදු යකඩෙන් රෝස මල් වනේ
මාල ගිරව් ගේ දොරකඩ සින්දු කිව් වෙලේ
හීනෙනුත් හිතුනෙ නෑ මට මොකද කාරණේ
පාර මතක නම් තාමත් ගේ ළඟයි දුවේ-----

රත්න ශ්‍රී විජේසිංහ



# 21
# නිර්දිෂ්ට ග්‍රන්ථ
## (ගුත්තිල කාව්‍යය)

**නිපුණතාව** : 7.0 ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය ඔස්සේ ආගමික හා සමාජීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම පිණිස වනපොත්කරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 7.1 නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් පද්‍ය කොටස් වනපොත් කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- ගුත්තිල කාව්‍යයේ සාහිත්‍ය පසුබිමට අදාළ කරුණු නිවැරදි ව විස්තර කරයි.
- ගුත්තිල කාව්‍යයේ නිර්දේශිත කවි මතකයෙන් කියයි.
- ගුත්තිල කාව්‍යයේ නිර්දේශිත කවිවල අර්ථය නිවැරදි ව කියයි.
- ගුත්තිල කාව්‍යයේ නිර්දේශිත කවිවල දුරවබෝධ වචනවල අර්ථ ඇතුළත් කර ගැටපදයක් සකසයි.
- ගුත්තිල කාව්‍යය පිළිබඳ විවාදාපන්න මාතෘකාවලට අනුව විවාද පවත්වයි.
- ගුත්තිල කාව්‍යය ඇසුරෙන් සාහිත්‍යය රස භාව පිළිබඳ ඥාන පෝෂණය වන කතාබහේ නියැළෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ගුත්තිල කාව්‍යය යනු කුමක් දැ යි හඳුන්වා දීම සඳහා සූදානම් වන්න.
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ගුත්තිල කාව්‍යය හෝ පිළිගත් පඬිවරයෙකු විසින් සංස්කරණය කරන ලද ගුත්තිල කාව්‍ය සංස්කරණයක් ඉගැන්වීම සඳහා භාවිත කරන්න.
- කවිවල දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කිරීම සඳහා පිළිගත් ශබ්ද කෝෂයක් හෝ ගැටපද විවරණයක් භාවිත කරන්න.
- නිර්දේශිත කවි 120න් වාරයට නියමිත කවි ගණන ගුත්තිල කාව්‍යය ඉගැන්වීමට නියමිත දින ගණනෙන් බෙදා ගන්න. (ශිෂ්‍යයන්ට දිනකට වනපොත් කිරීමට දිය හැකි හා අර්ථය පැහැදිලි කළ හැකි කවි ගණන ඔබේ අභිමතය පරිදි තෝරා ගන්න.)

**ප්‍රවේශය**

- ගුත්තිල කාව්‍යයේ කවි කිහිපයක් ගායනා කර එහි වැදගත්කම ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- ගුත්තිල කාව්‍යය කෘතිය පිළිබඳ හඳුන්වා දීමක් කරන්න. එහි දී පහත සඳහන් කරුණු අවධාරණය කරන්න.
- කර්තෘ, කාලය, කවි ගණන, වස්තු විෂය, කාව්‍යයක් ලෙස වැදගත්කම සාකච්ඡා කරන්න.
- ගුත්තිල කාව්‍යයේ කර්තෘ පිළිබඳ ඇති ජනප්‍රවාද කතන්දර ශිෂ්‍යයන්ට පවසන්න.

පාඩම සංවර්ධනය

- සෑම දිනක ම ඉගැන්වීම පහත පරිදි සංවිධානය කර ගන්න.
- එක් එක් දිනයට නියම කර ගත් කවිවල ගායනයක් සුදුසු ක්‍රමවේදයක් යොදාගෙන ඇසීමට සලස්වන්න.
- එහි ඇති දුරවබෝධ වචන ලියන්නැයි ශිෂ්‍යයන්ට පවසන්න.
- දුරවබෝධ වචනවල අර්ථය පැහැදිලි කර දෙන්න.
- කවියෙන් කවිය අර්ථය වටහා ගැනීමට ශිෂ්‍යයන්ට උපකාර කරන්න.
- දිනට නියමිත කවි වනපොත් කරගෙන එන්නැයි පවරන්න.
- පාඩම් කළ කවි එක් එක් ශිෂ්‍යයාගෙන් වෙන වෙන ම කටපාඩම් ගන්න.
- කවිවල අර්ථය පැවසීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- කවිවල අදහස වටහා ගත් පසු ශිෂ්‍යයන්ට රසවින්දනයටත් රසභාව පිළිබඳ ඥාන ගවේෂණයටත් අවස්ථාව ලබා දෙන්න.
- නැවතත් ඉහත සඳහන් පරිදි ඊළඟ දිනට නියමිත කවි තුන පැහැදිලි කර දෙන්න.
- ඒ ඒ දිනවල ලියන ලද දුරවබෝධ වචන ඇතුළත් කර ගැටපද විවරණයක් ලිවීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- ඇමුණුම 1හි සඳහන් මාතෘකා අනුව විවාද කිරිමට අවස්ථාව ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- සෑම දිනකම පෙර උගත් කවි ඇසුරෙන් ශිෂ්‍යයන්ගේ ප්‍රගතිය තක්සේරු කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ගුත්තිල කාව්‍යයේ නිර්දේශිත කවි මතකයෙන් පැවසීම
- ගුත්තිල කාව්‍යයේ නිර්දේශිත කවිවල අර්ථය නිවැරදි ව ප්‍රකාශ කිරිම
- ගුත්තිල කාව්‍යයේ කවිවල දුරවබෝධ වචන ඇතුළත් ගැටපද විවිරණයක් සැකසීම
- ගුත්තිල කාව්‍යයට සම්බන්ධ තේමාවලට අනුව විවාදයේ නියැළීම
- කවිවල රස භාව පිළිබඳ සාකච්ඡාවේ නියැළීම

ඇමුණුම 1

විවාද පැවැත්වීම සඳහා මාතෘකා

- ගුත්තිල කාව්‍යය වඩාත් රසවත් වී ඇත්තේ විවිධ විරිත් යොදා ගැනීම නිසා ද? නැතහොත් රසවත් අලංකාර නිසා ද?
- ගුත්තිල කාව්‍යය කෝට්ටේ යුගයේ ලියවුණු රසවත් ම කාව්‍යයයි. / රසවත් ම කාව්‍යය නොවේ.



# 22
# නිර්දිෂ්ට ග්‍රන්ථ
## (චරිත තුනක් නවකතාව)

**නිපුණතාව** : 9.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.1 නිර්දිෂ්ට නවකතාව පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- සිංහල නවකතා ඉතිහාසය සැකෙවින් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නවකතා රචකයා හා ඔහුගේ නිර්මාණ නම් කරයි.
- නිර්දිෂ්ට නවකතාවේ තේමාව ඉදිරිපත් කරයි.
- නවකතාවේ කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නවකතාවේ චරිත පිළිබඳ ව විචාරය කරයි.
- සරල තේමා ඔස්සේ ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සිංහල නවකතා ඉතිහාසය පිළිබඳ කියවා තොරතුරු රැස්කර ගන්න.
- චරිත තුනක් නවකතාව සූදානම් කර ගන්න.
- කේ. ජයතිලක නවකතා රචකයාගේ වෙනත් නිර්මාණ පිළිබඳ ව තොරතුරු රැස්කර ගන්න.
- ඇමුණුම් 1 ශිෂ්‍යයන්ට බෙදා දීමට අවශ්‍ය පත්‍රිකා සූදානම් කර ගන්න.
- කේ. ජයතිලකගේ ඡයාරූපයක් හා ඔහුගේ වෙනත් නිර්මාණ කීපයක් සොයා ගෙන තබා ගන්න.
- සිංහල නවකතා ඉතිහාසය පිළිබඳව වගුවක් සකස්කර ගන්න.
- මුල්කාලීන නවකතා රචකයන්ගේ ඡායාරූප කීපයක් ප්‍රදර්ශනය කිරීමට සූදානම් කර ගන්න.
- චරිත තුනක් ටෙලි නාට්‍යයේ සීඩී තැටියක් කල් ඇතිව සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- සිංහල නවකතා ඉතිහාසය පිළිබඳ ව සකස් කර ගන්නා ලද වගුව සහ නවකතා රචකයන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.
- චරිත තුනක් නවකතාවේ කොටසක් කියවීමෙන් හෝ සීඩී තැටි මගින් පාඩමට පිවිසෙන්න.
- චරිත තුනක් ටෙලි නාට්‍යයේ සූදානම් කරගත් සීඩී තැටියේ කොටසක් පරිගණක, මල්ටිමීඩියා හෝ වෙනත් තාක්ෂණික උපකරණ භාවිතයෙන් ශිෂ්‍යයන්ට නැරඹීමට අවස්ථාව සලසන්න.

**පාඩම සංවර්ධනය**

- ප්‍රවේශයේ දී ඉදිරිපත් කළ නවකතා ඉතිහාසය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- සිංහල නවකතාවේ විකාශය පිළිබඳව කෙටි අවබෝධයක් ලබා දෙන්න.
- නවකතාවක කලාත්මක ලක්ෂණ පැහැදිලි කර දෙන්න.
  - චරිත නිරූපණය
  - අවස්ථා හා සිද්ධි නිරූපණය
  - ජීවිත විවරණය

- ඇමුණුම 2හි සඳහන් නවකතාවක කලාත්මක ලක්ෂණ පැහැදිලි කර දෙන්න.
- කේ. ජයතිලක නවකතා රචකයා පිළිඳවත් ඔහුගේ වෙනත් නිර්මාණ පිලිබඳවත් පැහැදිලි කර දෙන්න.
- චරිත තුනක් නවකතාව කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- චරිත තුනක් නවකතාවේ පසුබිම විස්තර කරන්න.
- චරිත තුනක් නවකතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- චරිත තුනක් නවකතාව කියවා අවස්ථා සම්බන්ධ ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් තුනකට බෙදා පහත සඳහන් නවකතාවලින් එකක් කියවා ගෙන ඒමට කාලය ලබා දී ඒවායේ ලක්ෂණ ලිවීමට අවස්ථාව ලබා දෙන්න.

  අමාවැස්ස - ජයසේන ජයකොඩි
  හේ සිද්ධාර්ථ නම් වේ - කෝ.ආනන්ද හිමි
  රන් කරඬුව - බටුවන්ගල රාහුල හිමි

- ශිෂ්‍යයන්ට සරල ප්‍රබන්ධයක් කිරීමට ව්‍යුහයක් ලබා දී ප්‍රබන්ධකරණයේ යෙදීමට උපදෙස් දෙන්න
- ඇමුණුම 1හි සඳහන් පැවරුම සිදු කිරීමට ශිෂ්‍යයන්ට උපදෙස් ලබා දෙන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ හා මග පෙන්වීම් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පැවරුම් පත්‍රිකාව
- නවකතා

**පරිශීලනීය ග්‍රන්ථ**

- නවකතා නිර්මාණය හා අවබෝධය - ඒ.වී. සුරවීර
- සිංහල නවකතා ඉතිහාසය හා විචාරය - එදිරිවීර සරච්චන්ද්‍ර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක ඃ**

- සිංහල නවකතා ඉතිහාසය සැකෙවින් ඉදිරිපත් කිරීම
- නිර්දිෂ්ට නවකතාවේ තේමාව පැහැදිලි කර පෙන්වීම
- නිර්දිෂ්ට නවකතා රචකයා හා ඔහුගේ නිර්මාණ නම් කිරීම
- නවකතාවේ කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- නවකතාවේ චරිත පිළිබඳ විචාරය කිරීම
- නිර්මාණාත්මක ලක්ෂණ ප්‍රකට වන සේ ප්‍රබන්ධකරණයේ යෙදීම



ඇමුණුම 1

1) ii. පළමු සිංහල නවකතාව කුමක් ද?
   iii. එහි කතුවරයා කවුද?

2) පහත වගුවේ නවකතාවේ විකාශය දක්වන්න.

| නවකතාව | කතුවරයා |
|---|---|
| | |

3) කේ - ජයතිලක මහතාගේ වෙනත් නිර්මාණ කිහිපයක් සඳහන් කරන්න.

ඇමුණුම 2

නවකතාවක කලාත්මක ලක්ෂණ

- කතා ප්‍රවෘත්තිය
- කතා වින්‍යාසය
- දෘෂ්ටි කෝණය
- චරිත නිරූපණය
- පසුබිම් නිරූපණය
- යථාර්ථ නිරූපණය
- සංකේත නිරූපණය
- නිර්මාණාත්මක භාෂා ලක්ෂණ
- චරිතානුකූල භාෂාව
- ජීවන දෘෂ්ටිය

# 23
# නිර්දිෂ්ට ග්‍රන්ථ
## (සංඝරාජ සාධු චාරියාව)

**නිපුණතාව** : 6.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.1 ගද්‍ය පාඨ කියවා අර්ථය වටහා ගත් බව ප්‍රකට කරයි.

**කාලච්ඡේද** : 11 යි.

**ඉගෙනුම් පල** :

- සංඝරාජ සාධු චරියාව කෘතිය කියවා කතා සාරය ගොඩනගයි.
- සංඝරාජ සාධු චරියාව කෘතියේ දුරවබෝධ වචන ලැයිස්තුවක් පිළියෙල කරයි.
- සංඝරාජ හිමියන්ගෙන් වූ ධර්ම ශාස්ත්‍රීය සේවය කරුණු සහිත ව විස්තර කරයි.
- සංඝරාජ සාධු චරියාව කෘතියෙන් නිදසුන් ඉදිරිපත් කරමින් මහනුවර යුගයේ භාෂා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරයි.
- සරණංකර සංඝරාජ හිමියන්ගේ චරිතය අධ්‍යයනය තුළින් බෞද්ධ සංස්කෘතික සාරධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සරණංකර සංඝරාජ හිමියක්ගේ චරිතය ඇසුරෙන් ජාතිකාභිමානි හා දේශමාමක සංකල්ප වර්ධනය කර ගනියි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය**

- ප්‍රවේශ සඳහා පහත සඳහන් ක්‍රමෝපායයවලින් සුදුසු එකක් භාවිත කරන්න.
  - වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ චරිතයට සම්බන්ධ පින්තූර (ඇමුණුම 1හි සඳහන්) පෙන්වා උන් වහන්සේ ගැන විස්තරයක් කිරීම
  - ශ්‍රැතිගෝචර ශෛලියෙන් කොටසක් කියවීම
  - කියවන ලද කොටසක කතා සාරය සිහිපත් කිරීම
  - මහනුවර යුගයේ සාහිත්‍යයික හා ශාසනික තත්ත්වය පිළිබඳ සාකච්ඡා කිරීම

**පාඩම සංවර්ධනය**

- සරණංකර සංඝරාජ හිමියන්ගේ චරිතය ලියවුණු කෘතිය ගැන හඳුන්වා දීමක් හෝ ඒ පිළිබඳ පෙර දැනුම සිහිපත් කිරීමක් සිදු කරන්න.
- වාරයට ඉගැන්වීමට නියමිත කොටස සතියට/දිනයට නියමිත කොටසක් වෙන් කර ගන්න.
- සෑම දිනක ම ඉගැන්වීම පහත සඳහන් පරිදි සංවිධානය කර ගන්න.



  - නිර්දිෂ්ට කොටස සම්පූර්ණයෙන් කියවන්න.
  - දුරවබෝධ වචන ලියන්න. ඒවායේ අර්ථය ශබ්දකෝෂ පරිහරණයෙන් වටහා ගන්න.
  - නිර්දිෂ්ට කොටසේ කතා සාරය ගොඩ නගන්න.
  - ගොඩ නගන ලද කතා සාරය සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඊළඟ කොටස/ දිනය/ කාලච්ඡේදය ද ඉහත අයුරින් සංවිධානය කර ගන්න.
- එක කොටසක් ආරම්භ කරන විට පෙර කොටසේ සාරාංශය සිහිපත් කරන්න.
- කලින් උගන්වන ලද කොටසේ සාරාංශය ගොඩ නගන්න.
- දුරවබෝධ වචන ඇතුළත් කර ගැටපද විවරණයක් සකස් කරවන්න.
- සංඝරාජ හිමියන්ගේ සේවාව හඳුනා ගැනීම සඳහා ඇමුණුම අංක 2හි සඳහන් මාතෘකාවට අනුකූලව විවාද වැඩසටහනක් පවත්වන්න.
- සංඝරාජ සාධු චරියාව ඇසුරෙන් උගත හැකි දෑ පිළිබඳ බුද්ධිමණ්ඩල සාකච්ඡා පවත්වන්න.
- සංඝරාජ සාධු චරියාව නිදසුන් ලෙස ගනිමින් මහනුවර යුගයේ භාෂා ලක්ෂණ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සරණංකර සංඝරාජ හිමියන් තුළ පැවති ආගමාලය, ජාතිකාභිමානය හා දේශමාමකත්වය ගැන අගය කරමින් සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සංඝරාජ සාධු චරියාව සම්බන්ධව ඡායාරූප කිහිපයක් (ඇමුණුම 1)
- සංඝරාජ සාධු චරියාව කෘතිය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සංඝරාජ සාධු චරියාව උචිත ශෛලියකට අනුව ශබ්ද නගා කියවීම
- සංඝරාජ සාධු චරියාව කෘතියෙහි දුරවබෝධ වචන ඇතුළත් ගැටපද විවරණයක් සකස් කිරීම
- සංඝරාජ හිමියන්ගෙන් වූ ධර්ම ශාස්ත්‍රීය සේවය අගයමින් කතා කිරීම
- මහනුවර යුගයේ භාෂා ලක්ෂණවලට නිදසුන් ඉදිරිපත් කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සංඝරාජ වත ගොත - නිරංගම රතනසාර හිමි

ඇමුණුම 1



ඇමුණුම 2

විවාද මාතෘකා

01. **යෝජක පිල** වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගෙන් වඩා වැඩි සේවාවක් සිදු වූයේ සාහිත්‍යයට නොව ශාසනයට ය.

02. **ප්‍රතියෝජක පිල** වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගෙන් වඩා වැඩි සේවාවක් සිදු වූයේ ශාසනයට නොව සාහිත්‍යයට ය.



# 24
# විෂය සමගාමී ක්‍රියාකාරකම්
## (පද්‍ය නිර්මාණය)

**නිපුණතාව** : 9.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.2 පද්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- පද්‍ය නිර්මාණය සඳහා සරල අත්දැකීමක් තෝරා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණයේ දී භාෂාව නිර්මාණාත්මක ව භාවිත කරයි.
- පද්‍ය නිර්මාණයේ දී යොදා ගත හැකි කාව්‍ය උපක්‍රම පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණයේ දී උචිත කාව්‍ය සම්ප්‍රදායක් තෝරා ගනියි.
- අත්දැකීම් පාදක කොට ගෙන සරල තේමාවන්ට අනුව පද්‍ය නිර්මාණය කරයි.
- නිර්මාණය කරන ලද සරල පද්‍ය ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- අත්දැකීමක් මුල්කොට ගත් රසවත් පද්‍ය නිර්මාණයක් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර ගන්න.
- ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ (පරිගණක, ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක්) සූදානම් කර ගන්න.
- ඇමුණුම් අංක 1 ශිෂ්‍යයන්ට බෙදා දීමට අවශ්‍ය පත්‍රිකා සූදානම් කර ගන්න.
- පද්‍ය නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ දැනුවත් වෙන්න.

**ප්‍රවේශය**

- අත්දැකීම් මුල් කොට ගෙන රචිත මිහිරි ලෙස ගායනා කළ හැකි පද්‍ය පන්තියක් තෝරා ගෙන එය ගායනා කරමින් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් පාඩමට පිවිසෙන්න.

**පාඩම සංවර්ධනය**

- කවියා යොදා ගත් අත්දැකීම ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- කවි පෙළ රසවත් විමට හේතු වූ කරුණු පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ප්‍රවේශයේ දී ඉදිරිපත් කළ පද්‍ය නිර්මාණය ඇසුරෙන් පද්‍ය රචනා කිරීමේ දී සැලකිලිමත් විය යුතු පහත කරුණු පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

**කවියාගේ අත්දැකීම** **කාව්‍ය ආකෘතිය**
**කාව්‍ය සම්ප්‍රදාය** **එළිසමය**
**කාව්‍ය භාෂාව** **උපමා**

**රූපක**
**සංකල්ප රූප**
**අතිශයෝක්තිය, ස්වභාවෝක්තිය**

- කවියන් තම අත්දැකීම් පද්‍ය නිර්මාණය සඳහා යොදා ගෙන ඇති ආකාරය පහත ශීර්ෂ යටතේ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. මේ සඳහා නිදර්ශන ලෙස ඇමුණුම් අංක 1හි සඳහන් කවි යොදා ගන්න.

**පෞද්ගලික අත්දැකීම්**
**පොදු අත්දැකීම්**
**ස්වභාවික පරිසරයේ සංසිද්ධි**

- කාව්‍ය ආකෘතිය හඳුනා ගැනීම සඳහා ඇමුණුම් අංක 2හි සඳහන් පත්‍රිකාව ශිෂ්‍යයන්ට බෙදා දෙන්න.
- ඇමුණම 3හි සඳහන් කවිවල හිස් තැන්වලට සුදුසු කවි පද සම්පූර්ණ කිරිමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් විසින් සම්පූර්ණ කරන ලද පද්‍ය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් තේමා අතුරින් කැමති තේමාවක් යටතේ පද්‍ය පන්තියක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න

**ගුරු පියාණනි**
**අම්මා**
**ගඟ**
**සුන්දර ලංකා**

- ශිෂ්‍යයන් විසින් නිර්මාණය කරන ලද පද්‍ය නිර්මාණ අගය කිරීමක් සිදු කොට ශිෂ්‍ය සමිති/ බිත්ති පුවත් පත්/ සඟරා ආදියට යොදා ගන්න.
- ශිෂ්‍යයන්ට කාව්‍ය නිර්මාණ ඇගයීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකසන්න.
- පොදු උපදෙස් අනුව අවශ්‍ය ප්‍රතිපෝෂණ හා මග පෙන්වීම් ලබා දෙන්න.

**මූලික වදන් හා සංකල්ප**

- කවියාගේ අත්දැකීම — කවියා පද්‍ය නිර්මාණයෙන් කියාපෑමට අදහස් කළේ කුමක් දැ යි හරිහැටි වටහා ගැනීම
- කාව්‍ය ආකෘතිය — කවියක බාහිර ස්වරූපය ගී, සිලෝ, සිවුපද, හා නිසඳැස්
- කාව්‍ය භාෂාව — සුදුසු බස් වහරක් යොදා ගැනීම හෙළ වහර, ගැමි වහර, ළමා වහර කට වහර, පොදු ජන වහර, තාක්ෂණික යෙදුම්, උප භාෂා
- එළිසමය — පද්‍ය පාදයන්හි කෙළවර හෝ කීප තැනක සමාන අකුරින් කෙළවර වන අයුරින් පද යොදවයි.
- උපමා — උපමාවාචි නිපාතයක් යොදා ගනිමින් වස්තුවක් තවත් වස්තුවකට සමාන කර දැක්වීම
- රූපක — නිපාතයක් යොදා නො ගෙන වස්තුවක් සතු ලක්ෂණ තවත් වස්තුවකට ආරෝපණය කර දැක්වීම



- සංකල්ප රූප - (වාක් චිත්‍ර) වචන මගින් ඉදිරිපත් කෙරෙන චිත්‍රයකි. (පාඨකයාගේ භාව ප්‍රබෝධනයට හේතුවන වචන සංයෝජනය)

- අතිශයෝක්තිය - යමක පවත්නා ස්වභාවික තත්ත්වය ඉක්මවා උත්කර්ෂයෙන් යුතුව වර්ණනා කිරීම
- ස්වභාවෝක්තිය - යමක ස්වභාවය ඇති සැටියෙන් ම පැවසීම

**ගුණාත්මක යෙදවුම්**

- පරිගණකය, ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- ඇමුණුම් අංක 1හි ඇතුළත් කවි
- ඇමුණුම් අංක 2හි ඇතුළත් කවි
- ඇමුණුම් අංක 3හි ඇතුළත් අභ්‍යාසය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පද්‍ය නිර්මාණය සඳහා සරල අත්දැකීමක් තෝරා ගෙන ඉදිරිපත් කිරීම
- පද්‍ය නිර්මාණයේ දී භාෂාව නිර්මාණාත්මක ව භාවිත කිරීම
- පද්‍ය නිර්මාණයේ දී යොදා ගත හැකි කාව්‍ය උපක්‍රම පැහැදිලිව දැක්වීම
- පද්‍ය නිර්මාණයේ දී උචිත කාව්‍ය සම්ප්‍රදායක් තෝරා ගෙන තිබීම
- අත්දැකීම් පාදක කොට ගෙන විවිධ මාතෘකාවලට අනුව පද්‍ය නිර්මාණය කර පෙන්වීම
- නිර්මාණය කරන ලද පද්‍ය ගායනා කිරීම

**ඇමුණුම 01**

1. අහසේ තරු වැල් පිරිලා
පොළවේ සුදු මල් පිපිලා
මගුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපළම හැඩ ගැහිලා

**- එස් මහින්ද හිමි**

2. ගස වතු සුදු
වී පිරි සිදු
පෝය නැ තිදු
සිල් ගත් බඳු

**- කුමාරතුංග මුනිදාස**

3. උපන් බිමට නුඹ වැඩිවා මිසක දුවේ
වැදූ මවට නුඹ වැඩියක් වීද දුවේ
දුක උහුලා ඉන්නට මට හැකිය දුවේ
නැව් නැගලා දුරු රටකට යන්න දුවේ

**- දයාසේන ගුණසිංහ**

4. ඔබ මහ මුහුද මැද තනියම වෙසෙන කල
සිහියට නැඟෙනු ඇත මෙහි මා නිදන පැල
හිමියනි ඔබට මගෙ හදවත මිහිරි කළ
සැනසුම තිබේ මේ පොල් අතු කුටිය තුළ

**- සාගර පලන්සූරිය**

5. ගල්වා හිසෙහි තෙල් යහමින්
එල්ලා කරෙහි පංචායුදය
අල්ලා ගෙන අතින් මා
පාසලට එක්ක ගිය
අකුරු නුගත් අම්මා ඔබය

**- මහගම සේකර**

**ඇමුණුම 2**

| |
|---|
| පහත තේමා අතුරෙන් ඔබ කැමති තේමාවක් තෝරා ගෙන කවි පෙළක් නිර්මාණය කරන්න<br><br>1) ගුරු පියාණනි<br>2) අම්මා<br>3) ගඟ<br>4) සුන්දර ලංකා |

**ඇමුණුම 3**

| |
|---|
| සම්පූර්ණ කරන්න<br><br>1) ඇති නැති භේදය නැත විමසන්නේ<br>------------------------------------------------------------<br>------------------------------------------------------------<br>------------------------------------------------------------<br><br>2) හේනට කුඹුරට යන ගැමියන්නේ<br>පාසල් යන සුරතල් දරුවන්නේ<br>------------------------------------------------------------<br>------------------------------------------------------------<br><br>කාව්‍ය නිර්මාණයට හුරුවක් - ටිකිරි බණ්ඩාර සිලෝගම |



# 25
# විෂය සමගාමී ක්‍රියාකාරකම්

**(විද්‍යුත් මාධ්‍යවලට සවන් දීම)**

**නිපුණතාව** : 10.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ව ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.1 විද්‍යුත් මාධ්‍යවලට සවන් දීමේ පුරුද්ද වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- අවධානයෙන් හා අවබෝධයෙන් යුතුව වැඩසටහනකට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- අවධානයෙන් හා අවබෝධයෙන් යුතුව සවන් දුන් තොරතුරු සටහන් කර ගනියි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහනක ස්වරූපය හා විවිධත්වය ප්‍රකාශ කරයි.
- විද්‍යුත් මාධ්‍යවල සවන්දීමෙන් විවිධ විෂයයන් පිළිබඳ දැනුම ලබා ගනියි.
- එම ලබා ගත් දැනුම ප්‍රයෝගික ජීවිතයට යොදා ගනියි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ශිෂ්‍යයන්ට ගැළපෙන ගුවන් විදුලි වැඩසටහනක් හෝ ප්‍රවෘත්ති විකාශයක් තෝරා ගන්න.

**ප්‍රවේශය**

- ගුවන් විදුලියේ ජනප්‍රිය තේමා වාදනයක් හෝ ප්‍රවෘත්ති විකාශනයේ දී ප්‍රචාරය කරන වාදන ඛණ්ඩයක් ශිෂ්‍යයන්ට ඇසීමට සලස්වමින් පාඩමට පිවිසෙන්න.
- ශ්‍රවණය කරන ලද වැඩසටහනක් පිළිබඳ විමසමින් පාඩමට පිවිසෙන්න.

**පාඩම සංවර්ධනය**

- යමක් හොඳින් ඇසීමෙන් තමාගේ දැනුම වර්ධනය කළ හැකි ආකාරය පෙන්වා දෙන්න.
- ගුවන් විදුලිය හෝ සංයුක්ත තැටි වාදනය කළ හැකි උපකරණයක් භාවිත කරමින් විද්‍යුත් මාධ්‍ය වැඩ සටහනකට සවන් දී පැමිණීමට ශිෂ්‍යයන්ට උපදෙස් ලබා දෙන්න.
- එම වැඩ සටහනේ වැදගත් කරුණු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- විද්‍යුත් මාධ්‍යවලට සවන් දී රැස්කර ගත් තොරතුරු භාවිතයට ගත හැකි අයුරු පැහැදිලි කරන්න.
- සවන් දුන් වැඩ සටහනේ නිවැරදි තොරතුරු සටහන් කර ගත් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.
- රැස්කර ගත් තොරතුරු භාවිතයට ගෙන භාෂා ක්‍රියාකාරකම්වල යොදවන්න. (රචනා, බිත්ති පුවත් පතකට ලිපියක්, සාකච්ඡා, සංවාද)

- ලබාගත් දැනුම ප්‍රායෝගික ජීවිතයට අදාළ කර ගැනීමට උපදෙස් ලබා දෙන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ හා මග පෙන්වීම් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සංයුක්ත තැටි වාදනය කළ හැකි උපකරණය
- සංයුක්ත තැටි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- අවධානයෙන් හා අවබෝධයෙන් යුතුව වැඩසටහනකට සවන් දී ප්‍රතිචාර දැක්වීම
- අවධානයෙන් හා අවබෝධයෙන් යුතුව සවන් දුන් තොරතුරු සටහන් කර ගැනීම
- විද්‍යුත් මධ්‍ය වැඩසටහනක ස්වරූපය හා විවිධත්වය ප්‍රකාශ කිරීම
- විද්‍යුත් මධ්‍යවල සවන්දීමෙන් විවිධ විෂයයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
- එම ලබාගත් දැනුම ප්‍රයෝගික ජීවිතයට යොදා ගැනීම

ඇමුණුම 1

පහත සඳහන් ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් යොදවන්න.

- ශිෂ්‍යයින් කණ්ඩායම් දෙකකට බෙදන්න.

1) එක් කණ්ඩායමකට තමා සවන්දුන් ගුවන්විදුලි වැඩසටහන පිළිබඳ රචනයක් ලියන්න අවස්ථාව දෙන්න.
2) දෙවැනි කණ්ඩායමට තමා සවන්දුන් වැඩසටහන පිළිබඳ ව බිත්ති පුවත්පතකට වාර්තාවක් ලියන්න අවස්ථාව ලබා දෙන්න.
3) පන්සලේ දී ගුවන්විදුලියට සවන් දී තොරතුරු රැස් කරන්න.

| | |
|---|---|
| නාලිකාව | |
| වැඩසටහන | |
| ප්‍රචාරය වූ වේලාව | |
| ලබාගත් තොරතුරු | |



# 26
# විෂය සමගාමී ක්‍රියාකාරකම්
## (විද්‍යුත් නොවන මාධ්‍යවලට සවන් දීම)

**නිපුණතාව** : 10.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ව ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.2 විද්‍යුත් නොවන දේශන, සාකච්ඡා ආදියට සවන්දීමේ පුරුද්ද වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- සංයමයෙන් යුතුව සවන් දී වැදගත් කරුණු සටහන් කර ගනියි.
- සවන් දී අවස්ථාවට අනුව ප්‍රතිචාර දක්වයි.
- සාකච්ඡාවලට සවන් දී එහි වැදගත් කරුණු මතකයෙන් ඉදිරිපත් කරයි.
- දේශනයකට සවන් දී තම අදහස් ඉදිරිපත් කරයි.
- දේශන / සාකච්ඡා ආදියට සවන් දී වැදගත් කරුණු ප්‍රයෝගික ජීවිතයට යොදා ගනියි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සුදුසු තේමාවකට අනුව දේශනයක් සූදානම් කරන්න.
  ජාතික නිදහස් දිනය, ජාතික වීරයෝ, පෙර හෙළ රජදරුවෝ, ජාතික පිරිවෙන් දිනය, සංඝරාජ මාහිමි ආදි)
- තේමාවට අදාළ ව සුදුසු දේශකවරයෙකු තෝරා ගන්න.

**ප්‍රවේශය**

- තේමාවට ගැළපෙන ප්‍රවේශයක් ලබා ගන්න.

**පාඩම සංවර්ධනය**

- සුදුසු තේමාවකට අනුව දේශනයක් සූදානම් කරන්න.
- (ජාතික නිදහස් දිනය, ජාතික වීරයෝ, පෙර හෙළ රජදරුවෝ, ජාතික පිරිවෙන් දිනය, සංඝරාජ මාහිමි ආදි)
- ශිෂ්‍යයන්ගේ සහභාගිත්වය මත දේශනය පවත්වන්න.
- දේශනය පැවැත්වීමේ දී ශිෂ්‍යන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම සඳහා සාකච්ඡාමය ස්වරූපයකින් පවත්වන්න.

- ශිෂ්‍යයන්ට ප්‍රශ්නකරණයට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන්ගෙන් ද ප්‍රශ්න කරමින් සාකච්ඡාව පවත්වන්න.
- වැදගත් තොරතුරු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- වැඩසටහනේ තොරතුරු සටහන් කරගත් සිසුන් ඇගයීමට ලක් කරන්න.
- අනෙක් ශිෂ්‍යයන් ඒ සඳහා යොමු කරවන්න.
- රැස්කර ගත් තොරතුරු භාවිතයට ගෙන භාෂා ක්‍රියාකාරකම්වල යොදවන්න. (රචනා, බිත්ති පුවත්පතකට ලිපියක්, ප්‍රාරම්භක රැස්වීමේ හෝ ශිෂ්‍ය සමිතියේ කථාවක්)
- අවශ්‍ය ප්‍රතිපෝෂණ හා මග පෙන්වීම් ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සංයමයෙන් යුතුව සවන් දී වැදගත් කරුණු සටහන් කර ගැනීම
- සවන් දී අවස්ථාවට අනුව ප්‍රතිචාර දැක්වීම
- සාකච්ඡාවලට සවන් දී එහි වැදගත් කරුණු මතකයෙන් ඉදිරිපත් කිරීම
- දේශනයකට සවන් දී තම අදහස් ඉදිරිපත් කිරීම
- දේශන / සාකච්ඡා ආදියට සවන් දී වැදගත් කරුණු ප්‍රායෝගික ජීවිතයට යොදා ගැනීම



# 27

## විෂය සමගාමී ක්‍රියාකාරකම්

**(විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන්දීම)**

**නිපුණතාව** : 10.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ව ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.3 විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- විද්‍යුත් මධ්‍යවල ප්‍රවෘත්ති ප්‍රකාශවලට හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් තොරතුරු සාකච්ඡා කරයි.
- සාවධානව සවන් දී වැදගත් තොරතුරු සටහන් කර ගනියි.
- ප්‍රවෘත්ති ප්‍රකාශවලට සවන් දීමෙන් කාලීන තොරතුරු දැන ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- ප්‍රවෘත්ති ප්‍රකාශවලට හා විස්තර ප්‍රකාශවලට සවන් දී ලබා ගත් තොරතුරු භාවිතයට යොදා ගනියි.
- පැහැදිලි අදහස් ප්‍රකාශ කරමින් සන්නිවේදනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ශිෂ්‍යයන්ට ගැළපෙන ප්‍රවෘත්ති ප්‍රකාශවලට හා විස්තර ප්‍රකාශවලට සවන් දී පැමිණෙන ලෙස දැනුවත් කරන්න.
- කාලීනව වැදගත් වන වැඩසටහනක් නැරඹීමට හෝ ශ්‍රවණය කර පැමිණීමට උපදෙස් දෙන්න.

**ප්‍රවේශය**

- ගුවන් විදුලියේ ජනප්‍රිය වැඩසටහනක කොටසක් හෝ ප්‍රවෘත්ති විකාශනයේ දී ප්‍රචාරය කරන වාදන ඛණ්ඩයක් ශිෂ්‍යයන්ට ඇසීමට සලස්වමින් පාඩමට පිවිසෙන්න.

**පාඩම සංවර්ධනය**

- වැඩසටහන් නැරඹීමේ හෝ ශ්‍රවණය කිරීමේ වැදගත්කම පැහැදිලි කර දෙන්න.
- යමක් හොඳින් ඇසීමෙන් තමාගේ දැනුම වර්ධනය කර ගත හැකි ආකාරය පෙන්වා දෙන්න.
- ගුවන් විදුලි හෝ රූපවාහිනී වැඩසටහනක තෝරා ගත් කොටසක් ශිෂ්‍යයන්ට සවන් දීමට හෝ නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.

- එම වැඩසටහනේ වැදගත් කරුණු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී රැස්කර ගත් තොරතුරු භාවිතයට ගත හැකි අයුරු පැහැදිලි කරන්න.
- සවන් දුන් වැඩසටහනේ නිවැරදි තොරතුරු සටහන් කර ගත් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.
- රැස්කර ගත් තොරතුරු භාවිතයට ගෙන භාෂා ක්‍රියාකාරකම්වල යොදන්න. ( රචනා, බිත්ති පුවත්පතකට ලිපියක්)
- අවශ්‍ය ප්‍රතිපෝෂණ හා මග පෙන්වීම් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සංයුත්ත තැටි වාදනය කළ හැකි උපකරණය
- සංයුත්ත තැටි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විද්‍යුත් මධ්‍යවල ප්‍රවෘත්ති ප්‍රකාශවලට හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් තොරතුරු සාකච්ඡා කිරීම
- සාවධානව සවන් දී වැදගත් තොරතුරු සටහන් කර ගැනීම
- ප්‍රවෘත්ති ප්‍රකාශවලට සවන් දීමෙන් කාලීන තොරතුරු දැනගැනීමේ වැදගත්කම ප්‍රකාශ කිරීම
- ප්‍රවෘත්ති ප්‍රකාශවලට හා විස්තර ප්‍රකාශවලට සවන් දී ලබා ගත් තොරතුරු භාවිතයට යොදා ගැනීම
- පැහැදිලි අදහස් ප්‍රකාශ කරමින් සන්නිවේදනයේ යෙදීම

ඇමුණුම 1

- ගුවන්විදුලියෙන් ප්‍රවෘත්ති විකාශය වන කාල සටහන පිළිබඳ අවබෝධයක් ලබා කිසිවෙකුටත් බාධාවක් නොවන පරිදි ප්‍රවෘත්තිවලට සවන් දීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ප්‍රවෘත්තිවල සිරස්තල හා අදාළ විස්තර පිළිබඳ ව අවධානයෙන් සවන් දි ප්‍රවෘත්ති ඉදිරිපත් කරන විලාසය අනුව එහි ආකර්ෂණීය බව හා තීව්‍රත්වය හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.
- ගුවන්විදුලියේ ප්‍රවෘත්ති විකාශනයට සවන් දී දිනපතා ප්‍රවෘතියක් ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පන්ති කාමරයේ දී එම ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.



# 28
# විෂය සමගාමී ක්‍රියාකාරකම්
## (කථන අවස්ථා සම්පාදනය)

**නිපුණතාව** : 11.0 අර්ථවත් කථනයෙන් ප්‍රකාශන ශක්තිය වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම** : 11.1 කරුණු සංවිධානය කර ගනිමින් නිරවුල් ව හා නිවැරදි ව කතා කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- නිවැරදි ව බස හසුරුවමින් කතා කරයි.
- නිශ්චිත මාතෘකාවකට අනුව කතා කරයි.
- උචිත අංග චලනය සහිතව නියමිත කාලයකට අනුව කතාවක් කරයි.
- විවිධ අවස්ථාවල දී අවශ්‍යතාව අනුව කතාවක් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- මාතෘකානුකූලව කතා කිරීමට සිදුවන අවස්ථා ගැන ශිෂ්‍යයින්ට පැවසීම සඳහා කරුණු රැස් කර ගන්න.
- මාතෘකාව අනුව කතා කිරීමේ දී පහත සඳහන් තේමා යටතේ කරුණු රැස් කර ගන්න.

  - පරිසරය
  - ජාතික සම්පත් සුරැකීම
  - ජාතික වීරවරයෝ
  - සාරධර්ම අධ්‍යාපනය
  - මත් උවදුර පිටු දැකීම

**ප්‍රවේශය**

- පාඩමට සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.

**පාඩම සංවර්ධනය**

- මාතෘකානුකූලව කරන කතාවක් ශිෂ්‍යයන්ට ඇසීමට සලස්වන්න.
- මාතෘකානුකූලව කතා කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරවන්න.

  - මාතෘකාවට අනුකූල වීම
  - උචිත පරිදි අංග චලනය දැක්වීම
  - නිවැරදි උච්චාරණය
  - හඬපාලනය හා හැඟුම් දැනවීම

- කාල කළමනාකරණය
- ආරම්භය හා අවසානය ක්‍රමානුකූලව කිරීම

- කතා කිරීමට සුදුසු මාතෘකා කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දෙන්න. ඇමුණුම 1 යොදන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නිවරදි ව බස හසුරවමින් කතා කිරීම
- මාතෘකාවට අනුව කතා කිරීම
- හඬ පාලනය කිරීම
- උචිත අංග චලනය සහිතව නියමිත කාලයකට කතා කිරීම
- විවිධ අවස්ථාවල දී අවශ්‍යතාව අනුව කතාවක් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම

ඇමුණුම 1

i. පරිසරය සුරකිමු
ii. ගස්වැල් අපේ මිතුරෝය
iii. පොදු දේපළ සුරකිමු
iv. අනගාරික ධර්මපාලතුමා
v. රට ජාතිය රැක ගැනීමට සටන් කළ වීර පුරන් අප්පු
vi. වැඩිහිටියන්ට ගරු කරමු
vii. ජාතිය වනසන මත් උවදුර පිටු දකිමු



# 29
# විෂය සමගාමී ක්‍රියාකාරකම්
## (නිවේදන හා විස්තර ප්‍රචාරය කිරීම)

**නිපුණතාව** : 11.0 අර්ථවත් කථනයෙන් ප්‍රකාශන ශක්තිය වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම** : 11.2 ආකර්ෂණීය ලෙස හා නිවැරදි ලෙස නිවේදනය හා විස්තර ප්‍රචාරයේ යෙදේ.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- අවධානය යොමු වන පරිදි හඬ පාලනයෙන් යුක්තව නිවේදනයක් කරයි.
- නිවැරදි උච්චාරණය සහිත ව නිවේදනයක් කරයි.
- නිවේදනයක ඇතුළත් විය යුතු අංග නම් කරයි.
- විවිධ අවස්ථාවල දී අවශ්‍යතාව අනුව නිවැරදි ව නිවේදන කටයුතු කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- විවිධ අවස්ථා සඳහා සිදු කෙරෙන නිවේදන පිළිබඳව දැනුවත් වන්න.
- නිවේදනයක වැදගත්කම, නිවේදනයක තිබිය යුතු ලක්ෂණ පිළිබඳ ව කරුණු සොයා ගන්න.
- නිවේදන සඳහා පැවරිය හැකි මාතෘකා කිහිපයක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- ඇමුණුම 1හි සඳහන් නිවේදනය හෝ වෙනත් සුදුසු විස්තර ප්‍රකාශයක් ඇසීමට සලස්වා ශිෂ්‍යයන්ගෙන් ඒ ගැන විමසා හෝ වෙනත් සුදුසු ක්‍රමයකින් ප්‍රවේශයක් ලබා ගන්න.

**පාඩම සංවර්ධනය**

- විවිධ අවස්ථාවල සිදු කරන නිවේදන පිළිබඳව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- නිවේදනයක වැදගත්කම සාකච්ඡා කර නිවේදනයක තිබිය යුතු ලක්ෂණ පිළිබඳ ව පහත සඳහන් කරුණු ද යොදා ගෙන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
    - භාෂාව නිවැරදි ව භාවිත කිරීම
    - නිවේදනයෙන් කියවෙන පණිවිඩය තේරුම් ගැනීමට පහසු වන පරිදි අර්ථවත් ව හඬ පාලනය කිරීම
    - සංයමයකින් යුතු ව නිවේදනයක් කරන අන්දම පෙන්වා දීම
    - නිවේදනයක අන්තර්ගතය අනුව හඬ පාලනය කරන අයුරු පහදා දීම

නිදසුන් - ආගමික අවස්ථාවල කරන නිවේදනය
සාමාන්‍ය උත්සවයක සිදුකරන නිවේදනය
අවමංගල උත්සවවල දී කරන නිවේදනය

- ඉහත අවස්ථාවල නිවේදනය වෙනස්වන අයුරු පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයින් කණ්ඩායම් කිරීම හෝ තනි ව ගෙන ඉහත සඳහන් අවස්ථාවක් තෝරා ගැනීමට යොමු කරන්න.
- තෝරා ගත් මාතෘකාවට අනුව නිවේදනයක් සඳහා අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට උපදෙස් ලබා දෙන්න.
- රැස් කර ගත් තොරතුරු ඇසුරෙන් නිවේදනයක් ඉදිරිපත් කිරීමට පැවරුම් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සූදානම් කර ගත් නිවේදනය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- අවධානය යොමුවන පරිදි හඬ පාලනය කරමින් නිවේදනය කිරීම
- නිවැරදි උච්චාරණය සහිත ව නිවේදනය කිරීම
- නිවේදනයක ඇතුළත් විය යුතු අංග නම් කිරීම
- විවිධ අවස්ථාවල දී අවශ්‍යතාව අනුව නිවැරදි ව නිවේදන කටයුතු කිරීම

ඇමුණුම 1

| |
|---|
| විශේෂ නිවේදනයයි, ප්‍රදර්ශන භූමිය තුළ තිබී හමු වූ මුදල් පසුම්බියක් කාර්යාලය වෙත ලැබී ඇත. එහි හිමිකරුවකු සිටී නම් කාර්යාලය වෙත පැමිණ තම අනන්‍යතාව තහවුරු කර රැගෙන යන්න. |



# 30
## විෂය සමගාමී ක්‍රියාකාරකම්
**(දේශාභිමානි ගී රස වින්දනය)**

**නිපුණතාව** : 13.0 භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතික හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය, සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ට** : 13.1 දේශාභිමානි හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- දේශාභිමානි හැඟීම් දනවන විවිධ සාහිත්‍ය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්මාණවලින් ඉස්මතු කෙරෙන දේශාභිමානී හැඟීම් (සහකම්පනයෙන්/සංවේදීව) අගය කරයි.
- ජාතික සමගිය, සහජීවනය හා සාමය උදෙසා එකමුතුව කටයුතු කිරීමේ හැඟීම් දනවන සාහිත්‍යය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- අදාළ නිර්මාණ පරිශීලනය තුළින් දේශාභිමානය, ජාතික සමගිය, සහජීවනය හා සාමය උදෙසා එකමුතුව කටයුතු කිරීමේ පුරුදු ඇතිකර ගනියි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- දේශාභිමානි හෝ ජාතික සමගිය, සහජීවනය වැනි හැඟීම් දනවන (ගීතයක්, කවියක් හෝ ගද්‍ය පාඨයක් වැනි) සාහිත්‍යය නිර්මාණ එක් රැස් කර ගන්න.
- ඒ සඳහා ඇමුණුම 1,2 යොදා ගන්න) හඬ පටයක් සූදානම් කර ගන්න.
- එවැනි අදාළ සාහිත්‍යය නිර්මාණ එක්රැස් කර රැගෙන එන ලෙස ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.

පියවර 1

- අදාළ සාහිත්‍ය නිර්මාණය මගින් ඉස්මතු වන දේශාභිමානි හා ජාතික සමගිය, සහජීවනය වැනි හැඟීම් පිළිබඳව ශිෂ්‍යයන්ට අවබෝධය ලබා දෙන්න.
- ශිෂ්‍යයන් රැගෙන ආ/ඔවුන් දන්නා දේශාභිමානි හා ජාතික සමගිය, සහජීවනය දනවන ගීත හෝ කවි ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 2**

- ශිෂ්‍යයන් ඉදිරිපත් කරන නිර්මාණ පිළිබඳ ව ඔවුන්ගේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දී ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

- ඒ ඒ සාහිත්‍යය නිර්මාණ රස විඳීමේ දී දැනෙන දේශාභිමානි හැඟීම්, ජාතික සමගිය, සහජීවනය, පිළිබඳව හඳුන්වා දී අදාළ නිර්මාණයේ ''කාව්‍යෝක්ති' පිළිබඳ ව ශිෂ්‍යයන්ට අවබෝධයක් ලබා දෙන්න.

  **නිද : උපමා, රූපක, ධ්වනිතාර්ථ, එළිසමය, විරිත හා අනුප්‍රාසය**

**මූලික වදන් හා සංකල්ප**

- දේශාභිමානිය - ස්වකීය දේශය පිළිබඳ ව ඇති සාඩම්බර හැඟීම්
- දේශවාත්සල්‍යය - දේශය පිළිබඳ ඇති ඇල්ම, ආදරය, ස්නේහය

**ගුණාත්මක යෙදවුම්**

- දේශාභිමානී ගී ඇතුළත් හඬ පටයක්
- රට වෙනුවෙන් දිවි පිදූ විරුවන් කිහිප දෙනෙකුගේ ඡායාරූප
- ජාතික උරුම කිහිපයක ඡායාරූප
- ජාතික ධජය ඇතුළත් පින්තූරයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- දේශාභිමානය හා ජාතික සමගිය, සහජීවනය, යන හැඟීම් අවබෝධ කරගෙන විස්තර කිරීම
- දේශාභිමානි ගී හා කවි ගායනා කිරීම
- දේශාභිමානය හා ජාතික සමගිය හා සහජීවනය දනවන නිර්මාණවල යෙදීම



**ඇමුණුම 01**

හොඳ හොඳ ළමයින් අපි වාගේ
මේ මව්බිම ඉපදී ඉන්නේ ...
අත්පුඩි ටික එකමුතු කරලා
රකිමු අපේ සිරි ලක් අම්මා ...

හොර මැරකම් නැතිව ලොවේ
හිටියොත් හොඳ නම නිතර ලැබේ
වැරදි කළෝතින් පව් සිදු වේවී
සමාව නම් කිසි දිනෙක නැතේ
පොඩි ළමයින්හට දෙවියන්ගේ
ආශිර්වාදයමයි ඕනේ...

අත්පුඩි ටික එකමුතු කරලා
රකිමු අපේ සිරි ලක් අම්මා ...
අම්මාගේ කරුණාව වෙතේ
වීරිය දහිරිය පියතුමගේ
මේ හැම ලැබුණොත් එක වාගේ
මුළු ලෝකය එයි අතට අපේ
කෝපය හින්දයි පොඩි වෙන්නේ
හිත තුළ වෛරය නැති කරලා
ඉන්න ඕන හොඳ ළමයි වෙලා

අත්පුඩි ටික එකමුතු කරලා
රකිමු අපේ සිරි ලක් අම්මා ...

**ඇමුණුම 2**

රත්න දීප ජන්ම භූමි ලංකා දීප විජය භූමි
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි
ආදි සිංහලේ වීර මීමුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි

මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
ඇත්තේ ඒ අභීත දූපුතුන්
ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ
ජීවිතේ පුදා හෙලූ ලේ කඳයි

සින්ධූපමාන වැව්තලා මතින් ඇදී
පද්ම රේණුයෙන් සුගන්ධ වී
රන් කරල් නමා නමා සිත් ප්‍රබෝධයෙන් පුරා
එන්නෙ උන් හෙලූ ප්‍රාණ වායුවයි

ගංගා තරංග රාව දී රිදී වණින්
මල් පිපී කුළින් කුළේ හැපී
ගායනා කරන්නේ ආකාශයේ නැගී
වීරයන්ගෙ ඒ යශෝ ගීතයයි